
# සාම ක්‍රියාවලිය
## සහ
# සුළු ජාතික පක්ෂවල වගකීම



කියයි. පක්ෂ දෙක විසින් ම
නියෝජිත කණ්ඩායම් පත් කරයි.
එහෙත් මේ ප්‍රධාන පක්ෂ දෙකමක්
විසින් ම වඩා වැදගත් කොට
සලකනු ලබන්නේ මිනිසුන් මිය
යනවාද නැද්ද යන කාරණය
නොවේ. මිනිසුන් ජීවත් කරවන්නේ
කෙසේද යන කාරණය නොවේ. මේ
තුවාලය තම දේශපාලන ඵල
ප්‍රයෝජනය සඳහා පාවිච්චි
කරන්නේ කෙසේද යන කාරණය
පමණයි.

කරන විට යුද්ධයක් පැවතුණු
දකුණු අප්‍රිකාව සම්මුතියකට
එළඹීමට පෙර ශේන්සි පක්ෂයත් සුදු
ජාතිකයන්ගේ ඩෙක්ලාක් මහතාගේ
පක්ෂයත් ආණ්ඩුවත් අතර
ගැටුම් රාශියක් හටගෙන තිබුණ.
එමෙන්ම උතුරු අයර්ලන්තය
මියන්ඩනාවෝ සිද්ධිය ඔස්සේ
පැහැදිලි වන්නේ යුද්ධයක්
පවතිද්දීම සාකච්ඡා ආරම්භ කර
සාම සම්මුතියකට පැමිණීමට
හැකි බව ය.



REFERENCE ONLY

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

# සාම ක්‍රියාවලිය

සහ

# සුළු ජාතික පක්ෂවල වගකීම්

(1999 මාර්තු 06 දෙහිවල ජයසිංහ ශාලාවේදී පවත්වන ලද සම්මන්ත්‍රණයෙහි දේශන ඇසුරින්)

ISBN 955-8037-14-1

සිංහල සංස්කරණය
**ලයනල් ගුරුගේ**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

ISBN 955-8037-14-1

විමසීම්

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

32/3, මල් පාර,
කොළඹ 07
දුරකථන: 565304-06, 074-714461
ෆැක්ස් : 074-714460
ඊ-මේල් cpa@sri.lanka.net

# පටුන


පිටුව

* හැඳින්වීම 5

* ස්වයං පාලනය එකම විමසඳුමයි 9
*කේ. බාලනධරාජා*

* පොදු සතුරා කවරෙක් ද? 15
*මාවෙ සේනාධිරාජා*

* තිම්පු න්‍යායන්හි වැදගත්කම 21
*ජී. ජී. කුමාර් පොන්නම්බලම්*

* ජනතා ප්‍රශ්න වලින් යැපෙන දේශපාලනය 23
*එස්. සිවදාසන්*

* විසඳුම් සොයන්නන්ගේ ව්‍යාජත්වය 27
*න. ශ්‍රී. කාන්තා*

* මුස්ලිම් අයිතිවාසිකම් ආරක්‍ෂාවේ ද? 33
*මනෝගනේෂන්*

* අනන්‍යතා සංකේතයක් ලෙස 37
*ජී.ජී. දේවරාජ්*

* උතුරේ ජනවර්ග දෙකක අත්දැකීම් 43
*මොලවි පී.ඒ.එස්. සුපියාන්*

* සාකච්ඡාව 47

# විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශන

- මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ අවසාන වාර්තාව 1997 පළාත් පාලන මැතිවරණය.
- මාධ්‍ය විමර්ශි I, II, III.
- හදිසි නීතිය සහ පාර්ලිමේන්තුව - 1997 ජනවාරි - ජුලි.
- **Moot Point -** Legal Review 1997
- **Moot Point -** Legal Review 1998
- **Moot Point -** Legal Review 2000
- නීතිය, මානව හිමිකම් සහ එච්. අයි. වි/ඒඩ්ස්-මගපෙන්වීමක්
- මාධ්‍ය නිදහස සහ සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශනය
- **CMEV Final Report of Election-Related Violence: The Local Government Election in the Jaffna Peninsular 1998**
- මැතිවරණ ආශ්‍රිත ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ අවසාන වාර්තාව. වයඹ පළාත් සභා මැතිවරණය - 1999
- සාමකතා - 1999 අගෝස්තු.
- ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යභාරය.
- වාර්ගික අර්බුදය සහ සිවිල් සමාජයෙහි වගකීම්.
- මැතිවරණ ආශ්‍රිත ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ අවසාන වාර්තාව ජනාධිපති වරණය - 1999 දෙසැම්බර්

# සාම ක්‍රියාවලිය

සහ

# සුළු ජාතික පක්ෂවල වගකීම්

## *සංවාදයෙහි අරමුණ.......*

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිළිබඳ සලකා බලන විට ශ්‍රී ලංකාවේ යහපත් පාලනයක් බිහි කිරීම උදෙසා මහජන ප්‍රතිපත්ති කෙරෙහි සිවිල් සමාජය විසින් කරනු ලබන දායකත්වය පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම කටයුතු මෙහි ප්‍රතිපත්තියක් වශයෙන් පවතින්නේ ය. දෙවැන්න ගැටුම් වැළැක්වීමේ ක්‍රියාදාමයන්හි වඩාත් ශක්තිමත් කිරීම යි. තෙවැන්න සමාජ නීතිරීති, මිනිස් අයිතිවාසිකම් සහ දේශපාලන ක්‍රියාකාරීත්වය පිළිබඳ සිවිල් සමාජයේ දායකත්වය වර්ධනය කිරීම හා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ව්‍යුහය වඩාත් පුළුල් කිරීම, අවිහිංසාවාදී ව ගැටුම් වැළැක්වීමේ පියවරවලට දිරිදීම, මහජන සංවාදවලට සහභාගී වී ඔවුන්ගේ අදහස් අවබෝධ කරගෙන ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගැනීම යනාදී වශයෙනි.

අප රටේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවල පක්ෂපාතී ප්‍රවෘත්ති නිරන්තරයෙන් ම පළවේ. මෙවැනි පුවත් පළවන විට එම පුවත් නිරීක්ෂණය කොට ඒවායින් ඇතිවන යහපත් හා අයහපත් බලපෑම් ජනතාවට ගෙනහැර දක්වීම සඳහා අපි 'මාධ්‍ය විමර්ශී' මැයෙන් වාර සඟරාවක් භාෂා තුනෙන් ම පළකරන්නෙමු. එමෙන් ම අපි මේ රටේ ජනමාධ්‍ය නිදහසේ ක්‍රියාත්මක විය යුතු ය, යන පරමාර්ථය ඇතිව නිදහස් මාධ්‍ය ප්‍රකාශනය යන අදහසින් යුතු ව පත්‍රිකාවක් පළ කර ඇත්තෙමු.

රජය මගින් ඉදිරිපත් කරනු ලැබූ විකාශන අධිකාරී පනත් කෙටුම්පතට එරෙහිව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ද වැඩ පිළිවෙළක්

දියත් කෙළේ ය. රජයේ කෙටුම්පත අවසානයේ දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ද, විද්වතුන්, මාධ්‍යකරුවන් සහ මාධ්‍ය ක්‍රියාකාරිකයින් සමග ද එකතු වී විකාශන අධිකාරී පනතකට අවශ්‍ය කරන යෝග්‍ය යයි සැලකෙන කරුණු සහ මං සලකුණු පෙන්නුම් කරන විකල්ප පනත් කෙටුම්පතක් සකස් කෙරිණ. මෙම විකල්ප පනත් කෙටුම්පත රජයේ පනතට එරෙහිවූ ව්‍යාපාරයේදී උපයෝගී කරගත් අතර, මාධ්‍ය ප්‍රතිසංස්කරණය සඳහා වූ නිර්මාණාත්මක දායකත්වයක් ද ඒ තුළින් සැපයිණි.

පසුගිය වසර විසිපහක් තිස්සේ අප රටේ හදිසිනීතිය ක්‍රියාත්මක ව පවතී. එම නිසා අප රටේ පාර්ලිමේන්තුවේ හදිසි නීතිය පිළිබඳ විවාද පවතී; පාර්ලිමේන්තුවේ හදිසි නීතිය ක්‍රියාත්මක ව පවතී. හදිසි නීතිය පිළිබඳ විවාදවලදී විශේෂයෙන් ම 1997 ජනවාරි සිට ජූලි දක්වා පැවති විවාදවල දී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් අපි "හදිසි නීතිය හා පාර්ලිමේන්තුව" යන මැයෙන් ප්‍රකාශනයක් පළ කොට ඇත්තෙමු. එමෙන් ම දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණය කිරීමේ ආයතනයක් පිහිටුවා 1997 දෙසැම්බර් 31 වැනි දින සිට 1998 පෙබරවාරි 18 දක්වා යාපනය අර්ධද්වීපයේ පැවති පළාත්පාලන ආයතන සඳහා වූ මැතිවරණවලදී සිදුවූ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණය කොට එම වාර්තාව ප්‍රකාශනයක් ලෙස පළකොට ඇත්තෙමු. 1999 දී පැවැති වයඹ පළාත් සභා මැතිවරණයේ දී සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ නිරීක්ෂණ වාර්තාවක් ද පළකොට ඇත්තෙමු.

රජය විසින් යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ පරිච්ඡේද 16 ප්‍රසිද්ධ කළ අවස්ථාවේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ඒ පිළිබඳ සාකච්ඡා සැසියක් පවත්වනු ලැබී ය. මෙම සැසියේ කථිකයන් වූයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අධ්‍යක්ෂවරයකු වූ ද කොළඹ විශ්ව විද්‍යාලයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය පිළිබඳ කථිකාචාර්යවරයකු වූ ද රොහාන් එදිරිසිංහ, කොළඹ විශ්ව

විද්‍යාලයේ මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රයේ අධ්‍යක්ෂක වූ ආචාර්ය දීපිකා උඩගම, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කමිටුවේ කැඳවුම්කරු බාලක්‍රිෂ්ණන් සහ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂවරයකු වූ ෂෙල්ටන් වනසිංහ යන මහත්ම මහත්මීන් ය. මෙම කථිකයෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ අඩුපාඩු විවේචනය කරමින් අදාළ විය යුතු ප්‍රතිසංස්කරණ ද ඉදිරිපත් කළ හ. මෙලෙස මතු වූ අදහස් අතින් සමහරක් රජයේ ප්‍රතිසංස්කරණ යෝජනාවලට අඩංගු සැසි වාර්තා තුළට ද අන්තර්ගත කර ඇත. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මගින් පැවැත්වූ මෙම සාකච්ඡාවෙන් මතු වූ අදහස් පොදුරාජ්‍ය මණ්ඩලීය මානව හිමිකම් සංසදය සහ නීති සහ සාමාජීය අරමුදල මගින් සංවිධානය කළ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සාකච්ඡාවේ දී ද උපයෝගි කර ගනු ලැබී ය.

විශේෂයෙන් ම අප රටේ ජනවාර්ගික ප්‍රශ්ණයට දේශපාලන විසඳුමක් සාමකාමී ලෙස ලබාගත යුතු ය යන්න අපගේ නිගමනය යි. සාම සාකච්ඡා කලින් කල පසුබෑමට ලක්වූ අවස්ථා තිබුණ ද අවසාන වශයෙන් විසඳුමක් ලබාගත හැක්කේ ද සාම සාකච්ඡා මගින් ය යන විශ්වාසය ඇතිව අපි ක්‍රියාත්මක වෙමින් සිටිමු. මේ සම්මන්ත්‍රණය සංවිධානය කරන විට ශ්‍රී ලංකාවේ සුළුජාතීන් නියෝජනය කරන පක්ෂවල නියෝජිතයින්ට තව අදහස් ඉදිරිපත් කිරීමට අප ආරාධනය කළේ එම නිසා ය. දේශපාලන පක්ෂ ලෙස ඔවුන් විසින් විශාල කාර්ය භාරයක් ඉටු කළ යුතු ව ඇත. රජය ගැන සලකා බැලීමේදී හා දේශපාලන පක්ෂ ගැන සළකා බැලීමේ දී ඔවුන්ගේ දායකත්වය නොසෑහෙන බව ද අපි ප්‍රකාශ කරමු.

**- ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු**

විධායක අධ්‍යක්ෂ
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
99.03.06

# ස්වයං පාලනය එක ම විසඳුමයි

කේ. බාලතඩරජා
(ඊළම් ජනතා විප්ලවීය විමුක්ති පෙරමුණ)

කොතැනින් ආරම්භ කරනව ද? කුමකින් ආරම්භ කරනවා ද? යන ප්‍රශ්න මට නිතරම වද දෙන්නකි. වැඩිහිටියෝ දීර්ඝ කාලීන දේශපාලන අත් දැකීම් ඇති අය වෙති. ඔවුන් ඉදිරියේ අප සමහර විට කුඩා දරුවන් සේ විය හැකියි. එසේ වුවද අපේ ජනතාවගේ අද තත්ත්වය ඔවුන්ගේ ජීවිත අත්දැකීම් සමග බෙදාගත් කෙනෙක් වශයෙන් මට මෙයට ප්‍රවේශ විය හැකි ය.

ප්‍රවාහන ප්‍රශ්න, විදුලිය ප්‍රශ්න, දුරකථන ප්‍රශ්න යනාදී වශයෙන් උතුරු නැගෙනහිර ජනතාවගේ මූලික ප්‍රශ්නවලට වඩා දෛනික ප්‍රශ්න ඉතා උග්‍රව පවතී. අවුරුදු 20 කට පෙර මෙම තත්ත්වය තිබුණේ නැත. උතුරු ප්‍රදේශය කරා දිනකට දුම්රිය 5 ක් ගොස් පෙරළා පැමිණෙන තත්ත්වයක් තිබුණි. යාපන ප්‍රදේශයේ වැවුණු වියළි මිරිස් රුපියල් 140/= කට විකිණීමට හැකියාව තිබුණි. මේ තත්ත්වයක් යටතේ අපි වෙනම දෙමළ රාජ්‍යයක් ඉල්ලා කතිරය ගැසූ අයයි. නමුත් අදත් එම තත්ත්වය එසේම පවතින්නේ ද? අප සිත්වලට අත තබා විමසා බැලිය යුතු යි. 77 කෝලාහලය සහ 83 කෝලාහලය මගින් අප පලවා හරින ලද බව කියමින් තව කොපමණ කලක් සිටීමට සිදුවේ ද? ඒ පුද්ගලයන් නැවත වරක් කොළඹ, නුවර, කළුතර යන ප්‍රදේශවල ජීවත්වන තත්ත්වය ඇතිවෙමින් පවතී.

තනි රාජ්‍යයක් ඉල්ලීම මූලික කරුණක් වශයෙන් ඉදිරිපත් කරන ලදි. දෙමළ ජනයාගේ ඉඩම් නව පදිංචි කරවීම් ඔස්සේ

උදුරා ගන්නා ලදි. නමුත් අද යාපනේ පදිංචි වීමට ජනත සොයා පසු පසින් යා යුතු තත්ත්වයක් උද්ගත ව තිබේ. ජනතාව මෙහෙය විය යුතු තත්ත්වයක සිටිය දී ජනතාව තත්ත්වය කුමක් දැයි කරුණා කර අපි මොහොතකට සිතා බල තනි පුද්ගලයින් වශයෙන් සිටින සෑම කෙනෙක් ම කුමන සමතයකට සූදානම්ව සිටින තත්ත්වයක් අද ද්‍රවිඩ ජනතාව අත මතු වී බල පැවැත්වෙන බව මම ඉතා වේදනාවෙන් සඳහ කරමි. කොළඹ දී ලියාපදිංචි වීම සඳහා ඡායාරූප ලබාදිය යයි පැවසූ විට අපි ඉදිරියට ගොස් සිටගනිමු, එසේම ලබා දෙ මෙවැනි තවත් බොහෝ කරුණුවල දී අපි කුමන හෝ සමතය සූදානමින් සිටිමු.

මෑතක දී මිතුරෙක් සමග කතා කරමින් සිටින විට මෙසේ ප්‍රශ්න කෙළේ ය. "56දී සිංහල භාෂා පනත ගෙන ලැබූ බව අපි පවසමු. ඒ කාලයේ සිංහල ඉගෙන නොගනි කියා රැකියාවද අතහැර විවාද කළ කෝටිපතියා දක්ෂයෙක් නැත්නම් සිංහල ඉගෙන ගෙන නිශ්ශබ්දව අද දක්වා රජ සේවයේ යෙදී සිටින්නා දක්ෂයෙක් ද? 83 දී ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා 6 වැනි සංශෝධනය ඉදිරිපත්කරමින් බෙදීමේ ඉල්ලීම් ප්‍රතික කරන ලද අවස්ථාවේදී තනතුරු එපා යැයි ගසා දමා ගිය දක්ෂයෝ ද? නැත්නම් එවේලේ දිව්රුම් දී අද දක්වා පුරාජේ කථා කරන අය දක්ෂයෝ ද? බුද්ධිමතුන් ද? මේ සටන කොතැ හෝ සිදුවෙමින් පවතී. ඇෆ්ගනිස්ථානයේ හෝ වියට්නාමයෙ සිදුවන්නේ යැයි- කියමින් අපට කිසිම සම්බන්ධයක් නැතැයි කෝණයකින් අපි හුදෙක් ඝාතන සංඛ්‍යාව දෙස පමණක් බ සිටිමු. දිනපතා 10ක් මරුට, 15ක් මරුට යනාදී ලෙස සං දෙස පමණක් බලා "අපගේ කොල්ලෝ යුද කරති. නමුත් මරණ පත්වෙමින් සිටින්නේ කව්ද? මේ මරණ වැළැක්වීමේ වග අපට නැද්ද? මේ ප්‍රශ්න අප ඇත්ත වශයෙන් සිතට එක අවංකව, ජනතාවට විශ්වාසනීය ව කල්පනා කර බැලීමේ කා පැමිණ ඇති' යි මම සිතමි.

මෙපමණ කලක් තිස්සේ ප්‍රතිවාදී ව කටයුතු කිරීමෙන් දේශපාලන වේදිකාවේ ස්ථාපිත කරන ලද සාධනීය දේවල් ද ඇත. එනම් උතුරු නැගෙනහිර පරිපාලන ඒකක පිහිටුවීම, කඳුකර ජනතාවගේ ඡන්ද අයිතිය ලබාගැනීම යනාදිය ආයුධ සන්නද්ධ ප්‍රතිවාදී ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵල බව ප්‍රතික්ෂප කළ නොහැකි ය. නමුත් මේ ප්‍රතිඵල පවා රඳවාගත නොහැකි ආකාරයට අද ආයුධ සන්නද්ධ ප්‍රතිවාදී ක්‍රියාකාරීත්වයේ තත්වය වර්ධනය වෙමින් පවතින බව යථාර්ථය වී ඇත. 90 ගණන්වලට පසුව කලකෝලාහල, යුද්ධයක් හා විනාශයක් සිදු විය. නමුත් මෙම යුද්ධය මගින් අප දිනාගත් දේශපාලන වාසි හෝ ප්‍රයෝජන කමක් ද යන්න පිළිබඳව වරක් සිතාබැලිය යුතු යි.

92 දී අලිමංකඩ කඳවුරක් සමග සෘජු සටන් ඇවිලුණි. වැලිඔයේදීත් යුද්ධය සිදුවුණි. යාපනය රඳවාගෙන සිටියෙමු. මේ සියල්ල අද සිහිනයක් බවට පත් වී හමාර ය. විදේශ හමුදාව පිටවිය යුතු යයි ද සිංහල හමුදාව ජනවාර්ගික ඝාතනයක නියැලී සිටී යයිද අපි කීවෙමු. සිවිල් ජනතාවගේ ගුවන් යානාවල සිවිල් ජනතාව ලෙස හමුදා භටයන් ගමන් කිරීම ද අපි හෙළා දුටුවෙමු. නමුත් අද තත්වය කුමක්ද? හමුදා ගුවන් යානාවල හමුදා භටයින් ලෙස සාමාන්‍ය ජනතාව ගමන් කරමින් සිටී. එම නිසා අප මීට පසුවත් විදේශිකයින්, විදේශික හමුදාව, විදේශිකත්වය යනාදී ලෙස පුරාජේරු කථා කරමින් සිටීම කෙතරම් දුරට නිවැරදි දැයි අප කල්පනා කර බැලිය යුතු යි. රජය දේශපාලන විසඳුම ඉදිරිපත් කළේ නැත. ජනවාර්ගික ප්‍රශ්නය දේශපාලනමය වශයෙන් විසඳා නැත. විසඳීම සඳහා වූ ක්‍රියා මාර්ගයන් පවා ගෙන නොමැති බව ද සත්‍යයකි. 1990 දී උතුරු නැගෙනහිර පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු ද්‍රවිඩ ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රික අයිතිය පිළිබඳව එදා සිටි එක්සත් ජාතික පක්ෂය හෝ අද සිටින පොදු පෙරමුණ හෝ දුක් වූ බවක් පෙනෙන්නට නැත. ද්‍රවිඩ ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් ඉල්ලා සිටීම පවා කිප දෙනෙකුගේ තනතුරු මෝහයේ ඉල්ලීමට අනුව සිදුවූවක් බව චෝදනා කිරීමත්, විකෘති කිරීමත් අද ද්‍රවිඩ දේශපාලන බලවේග අතරේ සහ ද්‍රවිඩ පුවත්පත් අතරේ පවතින තත්වය යි.

"ද්‍රවිඩ ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදයක් ද? බම්බුව! එය අතහැරල වෙනත් වැඩක් බලාගන්න. සටන ශක්තිමත් කළ හැකිනම් ඒ ගැන සොයා බලන්න. අපොයි! සටනින් විනාශයක් නේද සිදුවන්නේ! - ඒකට කමක් නෑ. විනාශයක් ආවොත් පමණයි විසඳුමක් ලැබෙන්නේ - "එහෙනම් ඔබලා විනාශ වීමට සූදානම් ද? විදුලිබලය සහ දුරකථනය අතහැර පැය 24ක් සිටීමට ඔබ සූදානම්ද යයි ඇසූ විට, "මල්ලී අපට ඕවා කිසි දෙයක් දන්නේ නැහැ. අපි ඒ ප්‍රදේශයට එන්නේ නැහැ. නමුත් ඒ ප්‍රදේශයේ සටන් සිදුවිය යුතුයි. එවිටයි අපිට කොළඹදී කොලරය උස්සගෙන ගමන් කරන්න පුළුවන්" යයි කියන අයයි දන් සිටින්නේ. 'කොළඹ සිටින එබඳු අයට කොලරය උස්සාගෙන ඇවිදීම සඳහා එහි සිටින අය මැරෙමින් සිටිය යුතු ද?

ද්‍රවිඩයන් සඳහා වෙන ම රාජ්‍යයක් පිහිට විය යුතු යි. පිහිටවිය හැක, පිහිටුවීමට ඉඩ ඇත, යන විශ්වාසය ඇතිව පසුගිය විසි වසරකට වඩා සම්පූර්ණ කාලය ම කැප කළ කෙනෙකු ලෙස අද මම ඒ විශ්වාසය අහිමිව සිටිමි. මේ බව ඔබට කීමට මම ලැජ්ජා නොවෙමි. සාමාන්‍ය සිතුවිල්ලේ බවා තුවක්කු දක නැති මොහොතක ආයුධ සන්නද්ධව ප්‍රතිවාදී ක්‍රියාකාරීත්වය මගින් ද, ආයුධ සන්නද්ධ ප්‍රතිවාදී ක්‍රියාදාමය ක්‍රියාත්මක කළ යුතු ය යන අදහස ඇති ව ද අපි ක්‍රියා කළ අය වෙමු. ඒ සඳහා කැප වූවන් වෙමු. එය දැනගත් අය වෙමු. නමුත් ඒ විශ්වාසය අද මට නැත. වෙනම රාජ්‍යයක් පිහිටු විය නොහැකි දෙයක් ලෙස මම කල්පනා කරමි. සාකච්ඡා මගින් ප්‍රශ්ණය විසඳන්න යන සටන් පාඨය ඉදිරිපත් කිරීම පවා සීමා වෙන් කිරීමේ සාකච්ඡාවක් විය නොහැකි ය. එක්සත් ශ්‍රී ලංකාවක් තුළ නැත්නම් ඒකීය ශ්‍රී ලංකාවක් තුළ ජනවාර්ගික ප්‍රශ්ණයට විසඳුමක් සෙවීමට නම් සාකච්ඡා කළ හැකි ය. එසේ නම්, අනිකුත් දේශපාලන බලවේග ද්‍රෝහීන් ලෙස ඉවත දැමීමේ සහ කොන් කිරීමේ තත්වය ද්‍රවිඩ ජනතාව අතරින් වෙනස් කළ යුතු ය.

ද්‍රවිඩ ජනතාව අතරේ ප්‍රජාතාන්ත්‍රික දේශපාලන වාතාවරණය වර්ධනය වී එමගින් අප දේශපාලන ප්‍රශ්න දෙස බැලුවහොත් අද අපගේ තත්ත්වය කුමක් ද? සියල්ල රහසිගත ය. යාපනයට ගුවන් යානය යන්නේ කවදාට දැයි ඇසූ විට එයත් රහසිගත ය. ආරක්ෂක හේතූන් නිසා නැව පිටත් වන්නේ කීයටදැයි කිව නොහැකි ය. ආරක්ෂක සහතිකය ගත්තේ කොහොම ද? ‘අවශ්‍ය නම් අරන් දෙන්නම්. නමුත් ක්‍රමය කියා දෙන්නේ නෑ.

මේ අන්දමට සාමාන්‍ය ගමන් බිමන් වල සිට සෑම ප්‍රශ්ණයක දී ම අපි රහසිගත ය. මේ තත්වය වෙනස් කළ යුතු ය. සියලු ප්‍රශ්ණ ගැන විවෘතව කථා කිරීමේ තත්වය ඇති කළ යුතු ය. ප්‍රසිද්ධියේ ඔවුනොවුන් තම තමන්ගේ අදහස් ඉදිරිපත් කොට ඒ අදහස් මගින් පොදු යහපත කුමක් ද යි හඳුනා ගැනීමේ අවස්ථාවක් මහජනතාවට ඇති වන්නේ එවිට ය.

ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුම ස්වයං පාලනය යි. ඒ ස්වයං පාලනය ලබා ගැනීම සඳහා ප්‍රජාතන්ත්‍රික වාතාවරණය ඇති කළ යුතු ය. එවැනි ප්‍රජාතාන්ත්‍රික වාතාවරණයක් වර්ධනය කිරීම ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීමකි. එම සංවර්ධනය ඔස්සේ ජනතාව ඒ ප්‍රදේශයේ ජීවත් වීමට ආශා කරන වාතාවරණයක් ප්‍රථමයෙන් ඇති කළ යුතු ය.

# පොදු සතුරා කවරෙක් ද?

මාවෙ සේනාධිරාජා.
**(ද්‍රවිඩ විමුක්ති පෙරමුණේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී)**

අද පවතින වාතාවරණය යටතේ බොහෝ අයගේ බලාපොරොත්තුව මේ දේශපාලන පක්ෂ මගින්, ආණ්ඩුව මගින් මේ රටේ ඇවිලෙන ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් දිය නොහැකි ය, මේ යුද්ධය අවසන් කළ නොහැකි ය, යන්න ය. අප මේ විදිහට විනාශයට පත්වෙමින් සිටිය යුතු ද යන සැකය හා බිය ඇතිව ජීවත්වෙමින් සිටින මේ අවස්ථාවේ දී අප එම ක්‍රියාකාරී තත්ත්වයන් ගැන කථාකිරීම කෙතරම් දුරට බලවත් වාතාවරණයක් ඇතිකර මේ රටේ යුද්ධය අවසන් කොට මේ රටේ සිටින ජනවර්ග නිදහස ලබා තමාට තමන්ම පාලනය කිරීමේ ඉලක්කය ළඟා කර ගත හැකි ද යන්න ගැන අප අවධානය යොමු කළ යුතු ය. පෙර කිසි දිනකටවත් වඩා ඓතිහාසික ව බලන විට ඉතාම දුබල වූ තත්ත්වයක අරගලයක් ද දුර්වල වූ ජනතාවක් ද ඊටත් වඩා දුබල වූ දේශපාලන තත්ත්වයක් ද නිර්මාණය වී තිබෙන බව පෙනේ.

සංඛ්‍යාවෙන් අඩු ද්‍රවිඩ ජාතික ජනවර්ගයත්, සංඛ්‍යාවෙන් අඩු මුස්ලිම් ජාතික සුළු ජනවර්ගයත් සහෝදරයින් ලෙස කඳුකරයේ ජීවත්වන බව සැලකිය යුතු ව ඇතත් ද්‍රවිඩ ජාතික ජනවර්ගය අතරේ වුව ද මේ රටේ නිදහස වෙනුවෙන් සටන් කරන උතුරු නැගෙනහිර ජීවත්වන ද්‍රවිඩ ජනතාව පදනම් කරගත් දේශපාලන පක්ෂ අතරේ වුව ද එක්සත්කමක් නො පැවැත්වීම හා නිසි සටන් ස්වරූපයක් නො මැතිවීමත් පුළුල්වෙමින් පවතින බව අපට පෙනෙන්නට තිබේ. තමාගේ මහජාතිවාදී ප්‍රතිපත්තිය අමතක නොකර, යුදපිටියේ සිදුවන ජය පරාජය මත දක්ෂිණ ලංකාවේ

තම දේශපාලන ජයග්‍රහණ තීරණය කරන ජාතික ප්‍රතිපත්තියක් සකසා තිබෙන්නේ ද යි සිතෙන තරමට හැම රජයක්ම ඔවුන්ගේ ප්‍රතිපත්ති හමුදාමය වශයෙන් තීරණය කිරීමක් අපට පෙනෙන්නට තිබෙන්නේ ය. මේ තත්ත්වය විශේෂයෙන් ම ද්‍රවිඩ ජාතික ජනවර්ගයට මිස මුස්ලිම් ජාතික ජනවර්ගයට සෑහෙන අත්දැකීමක් මෙතෙක් ලබා නොදී තිබිය නොහැකි ය.

අද ද්‍රවිඩ ජනතාව අතරේ ප්‍රජාතන්ත්‍රවාදීව ක්‍රියා කරමින් සිටින ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ ගැන සලකා බැලීමේදී ඔවුහු 77 දක්වා ලබා තිබූ ප්‍රජාතන්ත්‍රවාදී බලය හීනවූවන් ලෙස සිටිති. 83 වසර වලට පසුව ආයුධ ගෙන සටන් කිරීමේ අරමුණින් විමුක්ති සටන නිදහස කරා මෙහෙය වූ සංවිධාන නොයෙක් ඒකකවලට බෙදී එකිනෙකාට පහරදී ඝාතනය කරන තත්වයට ගැටෙමින් සිටිති. ද්‍රවිඩ ඊළම් විමුක්ති කොටි රජයේ හමුදාව සමග සටන් කරමින් සිටී. නමුත් ද්‍රවිඩ ජාතික ජනවර්ගයේ සිට ගමන් ඇරඹූ ඕනෑම තරුණයෙක් වෙනත් කුමන හෝ රටක විමුක්ති සංවිධානයක් සමග සැසඳීමේ දී තම රටේ විමුක්තිය සඳහා තම වර්ගයේ විමුක්තිය සඳහා සටන් කිරීමට නොඅඩු ව ඉදිරිපත් වූ බව අපට අමතක කළ නොහැකි ය. මේ අවස්ථාවේ දී ආයුධ සටන දිගටම භුක්ති විඳිම මගින් ද්‍රවිඩ ජනතාව ඉතියෝපියාවේ වයෝස්රා ජනවර්ගය මර්දනයට ලක්වූවා සේ විනාශයේ අන්තයට තල්ලු කර නොදැමිය යුතු ය.

මේ රට තුළ ආයුධ එසවීමට කටයුතු කළෝ ඉන්දියාව එක් පසෙකත් ඉන්දියාවට එරෙහිව මහ බලවත් තත්ත්වයෙන් සිටින ඒකාධිපති, ධනවාදී රටවල් අනෙක් පසෙකත් තබා ගැනීමටත්, තම වාසිය ආරක්ෂා කරගැනීමටත් ආයුධ සටන් මගින් ඇඟිලි ගසමින් සිටින බව අපි ඇත්ත වශයෙන් ම සොයා බැලීමට බැඳී සිටිමු. මේ නිසා ජනතාව ආයුධවලට බිලිවෙමින් සිටී. රජය ද්‍රවිඩ ජනතාවගේ යහපත ගැන කණගාටු වූ බවත් මට පෙනෙන්නට නැත. චන්ද්‍රිකා බණ්ඩාරනායක රජය මෙතෙක් තිබූ එකඟතා හෝ

ඉන්දු ලංකා ගිවිසුමටත් වඩා යහපත් යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි. එය සම්පූර්ණ නිමාව දකීමට පෙර උතුරු නැගෙනහිර පළාත ඒකාබද්ධ කිරීමට ජනමත විමසුමක් පැවැත්වීම මගින් මෙය කෙරෙහි බලාපොරොත්තු තබා සිටි අයගේ විශ්වාසය පවා පළුදු කරන ලදි. මේ රජය ඉදිරිපත් කර තිබෙන යෝජනාව ද්‍රවිඩ ඊළම් කොටි සංවිධානය සාකච්ඡාවට කැඳවා ඒ යෝජනාව පදනම් කරගෙන සාකච්ඡාව ආරම්භ විය හැකි ය, එය ඊට පදනමක් විය හැකි ය, යනාදී වශයෙන් අපි කලපනා කළෙමු. අද පවතින වාතාවරණයේ දී හමුදා ගැටුමේ යෙදී සිටින ද්‍රවිඩ ඊළම් කොටි සාකච්ඡාවට පැමිණීම අවශ්‍යවේ. යුද්ධය අවසන් කිරීම අවශ්‍ය වේ. එහෙත් රජය තවමත් යුද්ධය අවසන් කොට විමුක්ති කොටි සමග සාකච්ඡා කිරීමට ගැඹුරු උත්සාහයක යෙදී සිටි බවක් නොපෙනේ.

මෙලෙස අපි ගමන් කරමින් සිටියොත් ජාතික සුළු ජාතික පක්ෂවල හෝ ඒ පක්ෂ නියෝජිතයින්ගේ තත්ත්වය කුමක් ද? මෙලෙස ම ගියොත් ඇෆ්ගනිස්ථානයේ ද, කොලොම්බියාහි ද, ධරීසියාවෙහි ද සිදුවන ඒ ඒ ජනවර්ගයන් විනාශයට පත්වන තත්ත්වයක් මෙහි ද ඇති විය හැකි ය.

ඉතිහාසයේ අයිරිස් රටේ විමුක්ති සටන දෙස අපි බලමු. එංගලන්තයේ අද සිටින බ්ලේයාර් හා සෙංගේ සෙන්ටර්පස්ලන්තයේ අගමැති ජෝන් මේයර් එකඟත්වයකට පැමිණ අයිරිස් විමුක්ති සාපරය සමග සාකච්ඡාවට පැමිණිය යුතු තත්ත්වය ඇති කර තිබේ. එහිදී සීමාවක් පිළිබඳ නිමාවක් නොමැති වුවත් අවුරුදු 1100කට පසු යම් යහපත් වාතාවරණයක් ඇතිකර තිබේ. පලස්තීනයේ විමුක්ති ව්‍යාපාරය එක් කාල පරිච්ඡේදයක දී ඊශ්‍රායලය විනාශ කර දැමිය යුතු යැ යි තීරණය කළේ ය. එමෙන්ම ඊශ්‍රායල්වරුනුත් පලස්තීනය විනාශ කළාට පසුව බලයට පැමිණිය යුත්තේ යැයි සැලසුම් කර සිටියහ. නමුත් අද තත්ත්වය වෙනස් වී ඇමෙරිකාවේ මැදිහත්වීම මත හෝ වෙනත් වාතාවරණයක්

මත හෝ වේවා, පලස්තීන නායකයා රාජ්‍යතන්ත්‍රික හමුදාමය වශයෙන් උපාය මාර්ගයක් අනුගමනය කිරීම මගින් පලස්තීන ජනතාවට නායකත්වය දීම ලෝකය විසින් පිළිගෙන තිබේ. පලස්තීනයට ස්වයං පාලනයක් ඇති රජයක් ලෝකය විසින් පිළිගෙන ඇත. ද්‍රවිඩ ඊළම් කොටින් මෙය පිළිගෙන තමන් අතරේ වෙනසක් ඇතිකළ යුතු ය. අනෙක් දේශපාලන බලවේග පලස්තීනයේ සිදු වූ ලෙස එකම වේදිකාවේ කටයුතු කරන තරමට පෙළඹවීම සඳහා මේ අවස්ථාවෙහි දී දායකත්වයක් දිය යුතු වන්නේ ද්‍රවිඩ ඊළම් කොටි සංවිධානය යයි මම සඳහන් කරමි.

ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ ජාතික ජනවර්ගය, සහ මුස්ලිම් ජාතික ජනවර්ගය නිදහස්ව ජීවත්විය යුතු නම් ද්‍රවිඩ ජනතාව අතරේ තිබෙන ව්‍යාපාර එක්සත් වීමට ඉමහත් උත්සාහයක් ගැනීමට එක පැත්තකින් වැදගත් කාර්යභාරයක් ඉටුකළ යුතු වුවක් ලෙස කොටි සංවිධානය සිටී. අනෙක් පැත්තෙන් ඉතාමත් අභාග්‍ය සම්පන්න තත්ත්වය කාටවත් චෝදනා කිරීමක් නොවේ. විමුක්තියේ නාමයෙන්, නිදහසේ නාමයෙන් ආයුධ ඔසවාගෙන පොදු සතුරා අමතක කරමින් හමුදාව සමග කටයුතු කරන තත්ත්වය යි. මෙසේ කටයුතු කරන සංවිධානයක ඇති වන වෙනසක් මගින් පමණ යි දෙමළ සමාජය හා මුස්ලිම් සමාජය එක ස්ථානයකදී හමුවීම සඳහාවූ අවස්ථාව එළඹෙන්නේ.

මීට පෙර එක් අවස්ථාවක අපි තොණ්ඩමාන් මහතා ඔහුගේ මූලස්ථානයේදී හමුවුනෙමු. තොණ්ඩමාන් මහතා ඒ අතරවාරයේදී අදහසක් ඉදිරිපත් කෙළේ ය. දැන් හදිසි නීතියට විරුද්ධව ද්‍රවිඩ විමුක්ති පෙරමුණ පමණක් ඡන්දය දෙයි. එය බලවත් නැත. පාර්ලිමේන්තුවේ සිටින ද්‍රවිඩ නියෝජිතයින් සැමදෙනාම විරුද්ධව ඡන්දය දෙමු'යි රජයට කීවොත් රජයේ වෙනස්කම් කීපයක් සිදුවනු ඇතැයි කීවේය. නමුත් එය සිදුවුණේ නැත. එම අදහස නිවැරදි යැයි මම සිතමි. අද දවසේ අවශ්‍යතාව එය යි. දෙමළ ජාතික සුළු ජනවර්ගයේ අයිතිය හෙවත් ද්‍රවිඩ

ජාතික ජනවර්ගයේ නිදහස සඳහා වූ අයිතිය ආරක්ෂා කර ගත යුතු නම් සටන ඒකාග්‍ර කළ යුතු නම් ද්‍රවිඩ කොටි සංවිධානය අතරත් අනෙතුත් දේශපාලන සංවිධාන, හමුදාමය සංවිධානය අතරත් පොදු එකඟතාවයක් ඇතිවීමේ ඉඩකඩ පිළිබඳ කල්පනා කළ යුතු වේ.

ජනවාර්ගික ගැටලුව විසඳීම පිණිස අප අතරින් පොදු අදහස් ඉදිරිපත් කළ නොහැකි ය. ද්‍රවිඩ ජනතාවගේ අයිතිවාසිකම් දිගින් දිගට ම බලහීන වනු ඇත. හමුදාමය වශයෙන් පරාජය කරනු ලැබුවත් අප ප්‍රජාතාන්ත්‍රික වශයෙන් ද දුර්වලව සිටින්නෙමු. චෙල්වනායගම් 50 ගණන් වලදී පැහැදිලි ව මෙසේ පැවසුවේ ය. "උතුරු පළාත අනෙක් ජනවර්ගවල සංකලනයක් නැතිව බලවත් ද්‍රවිඩ ජනතාවගේ ප්‍රදේශයකි. ඔවුන්ගේ බලය නැගෙනහිර ජනතාව කෙරෙහි යෙදවීම මගින් නැගෙනහිර ජනතාවගේ දේශපාලන බලය ද වැඩි කළ හැකිය."

විමුක්තිය හෝ නිදහස හෝ නාමයෙන් මේ රටේ ද්‍රවිඩ ජනතාව එකඟවන මූලික දේශපාලන විසඳුමක් අප පිළිගන්නේ නම් - ලබාගන්නේ නම් මේ කලාපයේ ඉන්දියාවේ කාර්යභාරය අපි ප්‍රතික්ෂ්ප නොකළ යුතුය. නිදහස ලබාගැනීමේ දී ඒ සඳහා අවශ්‍ය පසුබිම අප අහිමිකරගෙන සිටින බව මගේ අදහස යි. බංගලාදේශය බෙදෙන අවස්ථාවේ දී ඉන්දියාව හා රුසියානු බලවතා අතර බලවත් ගිවිසුමක් අත්සන් කර තිබුණි. බෙංගාලයට එරෙහිව හමුදාව යවා බංගලාදේශය අත්පත් කර ගෙන සිටි මොහොතේ ඇමෙරිකාව, චීනය හා පකිස්ථානය එකට එකතු වී ඇමෙරිකාවේ 7 වන නාවික හමුදාව යැවූ අවස්ථාවේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ ඉන්දියාව වෙනුවෙන් ප්‍රථම වශයෙන් වීටෝ බලය පාවිච්චි කළේ ද ඊට පසුව බංගලාදේශය පිළිගත්තේ යැයි ලෝකයාට දනුම් දුන්නේ ද රුසියාවයි. මා මෙය කෙටියෙන් සඳහන් කිරීමට හේතුව, මේ කලාපයේ හෝ වෙන කොතැනක හෝ වේවා අප නිදහස ලබා ගැනීමට දේශපාලන පසුබිම,

ජාත්‍යන්තරයේ පසුබිම බලය, අපට අවශ්‍යයි කියා අවධාරණය කිරීම යි. ඉන්දියාවේ සහයෝගය අපට අහිමිවී ඇතැ යි මම වක්‍ර ව කියන්න කැමැති යි. අද ලෝකයේ සිදුවන දේශපාලන වෙනස්කම් ගැන අප අවධානය යොමු කළොත් අප තනි තනියෙන් දේශපාලනයේ දී සාධනය කරන කිසිවක් නැත. අපගේ උතුරු නැගෙනහිර පළාතේ අපගේ සහෝදරයින් වශයෙන් සිටින මුස්ලිම් ජනතාවගේ සිත්වල ද වෙනස්කම් ඇතිවිය යුතු යි. චෙල්වනායගම් ලිබරල් පක්ෂයේ සිටි කාලයේ ගත් තීරණවල පදනම ද අනුව මගේ අදහස වන්නේ මුස්ලිම් ජනතාවගේ ස්වයං තීරණය අයිතිය පිළිගන්නා අතර උතුරු නැගෙනහිර රාජ්‍ය අයිතිය සමග අපි කෙසේ ජීවත් විය යුත්තේ දැයි එකඟ වෙමින් ඔවුන්ගේ සහයෝගය ද අප අතර අපගේ විමුක්තිය කරා යෑමට ලබාගැනීම තවත් මාර්ගයක් බව ය.

අප ජීවත්විය යුතු නම්, අපගේ ජනතාව විනාශවෙමින් සිටීම වැළැක්විය යුතු නම්, අප දිගට ම විනාශයට පත්වූවන් යන තත්වය වෙනස් විය යුතු නම්, ජාත්‍යන්තර ව සරණාගතයින් වශයෙන් වහලුන් වශයෙන් අනාථයින් වශයෙන් සැරිසරන ජනතාවට සහනයක් ලැබිය යුතු නම්, ප්‍රථමයෙන් ද්‍රවිඩ ඊළම් කොටි සංවිධානය ද අනෙක් දේශපාලන පක්ෂ ද ආයුධ ඔසවාගෙන තවමත් හමුදාව සමග කටයුතු කරන සංවිධාන ද ඔවුන් අතර සම්පූර්ණ වෙනසක් ඇති කරගෙන පොදු වැඩ පිළිවෙළක් අනුව කටයුතු කිරීමට ඉදිරිපත්වීම අද දිනයේ අවශ්‍යතාව යි.

# තිම්පු න්‍යායන්හි වැදගත්කම

ජී. ජී. කුමාර් පොන්නම්බලම්
**(සමස්ත ලංකා ද්‍රවිඩ කොංග්‍රසයේ සභාපති)**

ද්‍රවිඩ ජාතික ජනවාර්ගික ප්‍රශ්නය සම්බන්ධයෙන් සාමකාමී විසඳුමක් ලැබේ යයි කොහෙත්ම විශ්වාසයක් නැති බව මගේ අදහස ය. දෙවනු ව සුළුජාතික දේශපාලන පක්ෂ යැයි මෙහි දී කර ඇති සඳහන් ගැන මම දැඩි ලෙස මගේ විරෝධය පළ කරන බව ප්‍රකාශ කරමි. ද්‍රවිඩ ජන වර්ගය සුළු ජාතියක් වශයෙන් සලකන ලද කාලය අවසන් වී බොහෝ කල් ය. දශක දෙකකට පෙර සිට ම අප ද්‍රවිඩ ජාතික ජනවර්ගයේ ප්‍රශ්නයට මුහුණ දී සිටිමු. නමුත් මෙතෙක් කල් විශේෂයෙන් 1942 ට පසු දේශපාලන විසඳුමකට ප්‍රවේශවනු ඇතැ යි හෝ නැත්නම් හමුදාමය විසඳුමකට ප්‍රවේශවනු ඇතැයි හෝ කිව හැකි ද? ද්‍රවිඩ ජාතික ජනවර්ගයට අයත් ඇතැම් ද්‍රවිඩ පක්ෂ සිංහල රජයේ සිංහල හමුදාව සමග එක්වී කටයුතු කරන්නේ නම් ඊටත් වඩා පහත් තත්ත්වයක ද්‍රවිඩ ජාතික ජනවර්ගය සිටිය හැකි ද? යන්න ඔබ කල්පනා කර බැලිය යුතු යි. මේ රටේ ක්‍රියාත්මක වෙමින් එන විසඳුම දේශපාලන විසඳුම නොව හමුදාමය විසඳුමක් බව බොහෝ අය පිළිගනිති. එයට සහයෝගය දීමට බොහෝ අය කැමති වෙති.

ද්‍රවිඩ ජාතික ජනවර්ගයේ ප්‍රශ්නය මින් පසු ව ද සාමකාමී ලෙසින් විසඳා ගත හැකි යැයි මම විශ්වාස නොකරමි. රජය හා දේශපාලන පක්ෂ ඉටුකරන කාර්යභාරය ප්‍රමාණවත් නොවන බව ඇතැම් අය පවසති. මේ රජය දේශපාලන විසඳුම් යෝජනාවලියක් ඉදිරිපත් කොට තිබේ. මේ විසඳුම් යෝජනාවලියට සහයෝගය දක්වීමට වේදිකාව මත සිටින ද්‍රවිඩ පක්ෂවල නියෝජිතයෝ

සූදානමින් සිටිති. නමුත් මේ දක්වා මේ පිළිබඳ කිසි ම දියුණුවක් පෙනෙන්නට නැත. ඒ කටයුතු ඇනහිට ඇත. එමනිසා එම යෝජනාවලියට සමස්ත ලංකා ද්‍රවිඩ කොංග්‍රසය හෝ මා හෝ පුද්ගලිකව සහයෝගය දක්වන බව නොසිතිය යුතු යි. මේ යෝජනාවලිය තුන්වතාවක් ප්‍රකාශයට පත් කරන ලදි. 1995 අගෝස්තු මස, 1996 ජනවාරි මස හා 1997 ඔක්තෝම්බර් මසදී ය. මේ සෑම වතාවකදීම එම යෝජනාවලිය පිළිබඳ ව සිංහල රජයේ ස්ථාවරය වෙනස් වී මුලින් ඉදිරිපත් කරන ලද යෝජනාවලියෙන් දෙවන යෝජනාවලිය ළිස්සා පහතට වැටුණේය. මිත්‍රවරුනි, මේ විසඳුම් යෝජනාවලියෙන් කිසිම පලක් නැත. එය ඔබ ස්ථිරවම දන ගත යුතුයි. අද මේ රටේ ඇතැම් අය පවසන්නේ මේ රට සිංහල රටක්, මේ රට බෞද්ධ රටක් යනුවෙනි. මෙවැනි වාතාවරණයක දී අද ද්‍රවිඩ ජාතික ජනවර්ගයේ ස්ථාවරය අප මුලින් සහතික කළ යුතුයි. ද්‍රවිඩ ජාතික ජනවර්ගයේ ස්ථාවරය අප සහතික කරන්නේ අපගේ අපේක්ෂා සිංහල ජාතික ජනවර්ගය පිළිගෙන තිසි දේශපාලන නීතියක ස්වරූපයකින් ඔවුන් ඉදිරිපත් කළොත් මිස අප අපගේ තත්ත්වය මෙබඳු විසඳීම් ඔස්සේ ස්ථාපිත කිරීමකින් නොවේ. එම නිසා අපගේ අපේක්ෂාව ප්‍රථමයෙන් ම මේ සිංහල රජයන් ද සිංහල ජාතික ජනවර්ගයන් ද පිළිගත යුතුය; අනුමත කළ යුතු ය. ඊට පසු ව ය දෙවන අදියරයේ දී වෙනත් කාරණා සම්බන්ධයෙන් සාකච්ඡා කළ හැකිවන්නේ. එම නිසා මේ රැස්වීම සංවිධානය කළ අය දේශපාලන විසඳුමක් සොයා යන්නේ නම් ඔවුන්ට ඇති වගකීමක්වන්නේ තිම්පු න්‍යායයන් සෑම එකක් ම ප්‍රථමයෙන් සිංහල ජාතික ජනවර්ගය පිළිගෙන තිසි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හෝ සංග්‍රහයක් මගින් අන්තර්ග්‍රහණය කිරීම අවධාරණය කිරීම ය.

# ජනතා ප්‍රශ්නවලින් යැපෙන දේශපාලනය

එස්. සිවදාසන්

**(ඊළම් ජනතා ප්‍රජාතන්ත්‍රික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී)**

ඊළම් ජනතා ප්‍රජාතාන්ත්‍රික පක්ෂය ගැන සලකන විට ද එය ලංකා දූපතේ ස්වාධිපත්‍ය හා නිදහස ඇති ඊළමක් පිහිටුවිය යුතු යි, යන අරමුණින් කලින් ආයුධ රැගෙන සටන්වල නියැලී සිටි කණ්ඩායමකි. ඊළම් ජනතා ප්‍රජාතන්ත්‍රික පක්ෂය ලංකාවේ ජීවත්වන ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාව මුහුණ දෙන ප්‍රශ්න සඳහා වූ විසඳුම අදියර තුනකින් ඉදිරිපත් කළ යුතුයයි අදහස් කරයි. මේ තත්ත්වය යටතේ ප්‍රායෝගික අදහස් එනම් එක්සත් ලංකාවේ නිදහස් ඊළමට ප්‍රායෝගික විකල්පයක් වන්නා වූ ද ගෞරවාන්විත වන්නා වූ ද දේශපාලන විසඳුම ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් විය හැක.

ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාව එදිනෙදා ජීවිතයේදී මුහුණ පාන ප්‍රශ්නවලට හා අර්බුදවලට විසඳුමක් දිය යුතු ය. එනම් මිනිසාගේ මූලික අයිතිවාසිකම් වන කථා කිරීමේ නිදහස, මිනිස් අයිතිවාසිකම්, ඇතුළු ව ප්‍රජාතන්ත්‍රික අයිතිවාසිකම් සියල්ල තහවුරු කළ යුතු ය. අද පවතින තත්ත්වයේ දී මට කලින් කථා කළ අය විශේෂයෙන් ම මාවෙ සේනාධිරාජා, කුමාර් පොන්නම්බලම් යන අය ඇතැම් සංවිධාන රජය සමග එකතු වී කටයුතු කරයි. මෙයින් නොයෙක් ප්‍රශ්න මතුවේ ය යන අදහසින් සමහරු කරුණු දක්වූහ. මේ රටේ ඉතිහාසය දෙස අපි ආපස්සට හැරී බලන්නේ නම් කලින් කල ද්‍රවිඩ නායකයින් මේ රටේ රජයන් සමග එකතු වී කටයුතු කිරීම පිළිබඳ අමතක කළ නොහැකි ඉතිහාසයක් ඇත. කුමාර් පොන්නම්බලම් මහතාට

කරුණක් මතක් කර දීමට කැමැත්තෙමි. මේ රටේ ප්‍රථම වතා
'ඔහු ප්‍රකාශ කරන වචනවලින් ම' සිංහල රජයත් සමග එකතු
ක්‍රියා කළ පුද්ගලයා මේ රටේ කංකසන්තුරේ සෙන්
පොන්නම්බලම් බව ඉතිහාසය අමතක කර නොමැත. එ මෙ
1965 වසරේ අභාවප්‍රාප්ත තිරුචෙල්වම් මහතා එදින ලිබ
පක්ෂයේ නායකයින්ගෙන් කෙනෙකි. ඔහුත් එදින රජය ස
එකතු වී කටයුතු කිරීම මේ රටේ අමතක කළ නොහැකි සිදුවීම
දේශපාලන අවශ්‍යතා කලින් කල ඇතිවන සමහර අවශ්‍යතා
සිදුවන්නේ ය.

ද්‍රවිඩ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් මේ රටේ ඒ
දේශපාලන විසඳුමක් ඇති විය යුතු ය. උතුරු නැගෙනහිර එ
ඒකකයක් ලෙස පිලිගෙන ද්‍රවිඩ ජනතාවගේ පාරම්පරික
භූමිය උතුරු-නැගෙනහිර බවට පිළිගැනීම ඔස්සේ පමණක්
රටේ දේශපාලන විසඳුමක් ඇති කළ හැකි ය. මා අයත්
ඊළාම් ජනතා ප්‍රජාතාන්ත්‍රික පක්ෂයේ ප්‍රතිපත්තිය වන්නේ
ජනතාව මේ රටේ ජීවත්වන අනෙක් ජනතාව සමග ස
අයිතිවාසිකම් ලැබුවන් ලෙස ගෞරවාන්විතව විසිය හැකි තත්ත
ජීවත්වන තත්ත්වයක් ඇති කිරීම ය. මේ සඳහා පාර්ලිමේ
තේරීම් කරන සභාවක් පත්කොට තිබේ. ගරු දේවරාජ් මහ
මේ තේරීම් කාරක සභාරැස්වීම් වලට සහභාගී වේ. මේ
කාරක සභාවට කලින් රජය විසින් ඉදිරිපත් කරන ලද වි
යෝජනාවලියට පැහැදිලි ව තම අදහස් පිටු 18 කින් වි
වාර්තාවක් වශයෙන් ඉදිරිපත් කළ පක්ෂය ඊළම් ජනතා ප්‍රජාතා
පක්ෂය පමණි. එම නිසා රජය නිකුත් කළ මේ වාර්තාව
අනෙක් පක්ෂ වල අදහස් ද පළකොට තිබුණි. කුමාර්පොන්නම්
මහතා එය දකින්නට ඇතැයි විශ්වාස කරමි. මේ රටේ මූ
ජනතාව මේ උතුරු-නැගෙනහිර ස්වාධිපත්‍යය ඇති අයිතිවා
ඇති ජනවර්ගයක් ලෙස ජීවත් විය යුතු ය. උතුරු නැගෙ
පිටතින් ජීවත්වන ජනතාව කොළඹ හා අනෙකුත් ප්‍රදේශවල ජීව
ජනතාව, කඳුකර ජනතාව, කඳුකරයට අයත් ජනතාව,

පළාත, බස්නාහිර පළාත, සබරගමුව පළාත යනාදී ස්ථානවල ජීවත්වෙති. ඔවුන්ගේ සාධාරණ අයිතිවාසිකම් සමානාත්මතාවයෙන් යුතුව තහවුරු කළ යුතු ය යන්න අපගේ ස්ථාවරයයි.

උතුරු නැගෙනහිර ජීවත්වන ජනතාවගේ ජීවිතය නංවාලීම සඳහාත් ජීවන ප්‍රශ්න විසඳාලීම සඳහාත් අපට හැකි පමණ පාර්ලිමේන්තුවේ මගින් හෝ වෙනත් ක්‍රියාකාරකම් මගින් විවිධ උත්සාහයන්හි නිරත වී සිටිමු.

එමනිසා අප හා අනෙක් අය අතර වෙනසක් තිබේ. එම වෙනස්කම ඔස්සේ ඉතා පැහැදිලිව කියන්නේ දුෂ්කරතාවලින් පීඩා විඳින ජනතාව ඔවුන්ගේ දුක නැති කිරීමට හැකි ක්‍රියාමාර්ග ගත යුතු බවයි. ඊට පටහැනිව ජනතාව ගේ දුක් කම්කටොලුවලින් පමණක් ජීවත්වන දේශපාලනය ඊළම් ජනතා ප්‍රජාතාන්ත්‍රික පක්ෂය විසින් පිළි නොගනී.

# විසඳුම් සොයන්නන්ගේ ව්‍යාජත්වය

න. ශ්‍රී කාන්තා,
(ද්‍රවිඩ ඊළම් විමුක්ති ව්‍යාපාරය)

ද්‍රවිඩ ඊළම අවසාන විසඳුම යයි අපගෙන් කව්රු හෝ සලකන්නේ නම් සාමය ගැන කථා කිරීමෙහි තේරුමක් නොමැත. ඒ මන්ද යත් ද්‍රවිඩ ඊළම යනු යුද්ධ පිටියේ තුවක්කු ඉදිරියේ, කාලතුවක්කු හමුවේ රුධිර ගංගා තුළින් මිනී ඇට කටු තුළින්, ගිනිදළු තුළින් ලබාගත යුතු දෙයක් වන හෙයිනි. වේදිකාවල කථා කරමින් ද්‍රවිඩ ඊළම අපට ලබාගත නොහැකි ය. ද්‍රවිඩ ඊළම ලබාගත යුතු යයි අපගෙන් කව්රු හරි සිතන්නේ නම් මම ඉක්මනින් ඔහුගේ අතේ තුවක්කුවක් බලාපොරොත්තු වෙමි. යුද පිටියේ දී මම ඒ මිනිසා දකින්නට කැමැත්තෙමි. නමුත් සාමය ගැන කල්පනා කරන විට ද්‍රවිඩ ඊළම ගැන සාමයක් සමග යාකොට කථා කිරීමෙන් අර්ථයක් නැත. මේ දේශපාලන ප්‍රශ්නයේ සම්බන්ධ වී සිටින පාර්ශ්වයන් දෙක අතර පරිත්‍යාග කිරීම් ඔස්සේ පමණකි සාමය පදනම තිබිය හැක්කේ. ද්‍රවිඩ ජනවර්ග පාර්ශ්වයේ ද්‍රවිඩ ඊළම් ඉල්ලීමට විකල්පයක් වශයෙන් ලංකාව එක රටක් වශයෙන් සාධාරණ, අවංක, ස්ථිර දේශපාලන විසඳුමකට අප සූදානමින් සිටිය යුතු යි. ඒ සමගම අපගේ මූලික දේශපාලන අපේක්ෂා පිලිගෙන අපගේ නිජ උරුමය වන ස්වයං තීරණ අයිතිය පිලිගෙන එය එක්සත් ලංකාව යන සීමාව තුළ කෙසේ මුණගැසෙන්නේද යන්න ගැන නිර්මාණාත්මකව කල්පනා කිරීමට සිංහල පාර්ශ්වය සූදානමින් සිටිය යුතු ය.

89 සැප්තැම්බර් මාසයේ එකල ජනාධිපතිව සිටි රණසිංහ ප්‍රේමදාස විසින් කැඳවන ලද සර්ව පාක්ෂික සමුළු කාලයේ සිට අපි මේ මතය දිගින් දිගටම ප්‍රකාශ කළෙමු.

සුළු ජාතික දේශපාලන පක්ෂ යන වගකීම තුළ අප
ම නිශ්චිත කාර්යයන් ඇත, නිශ්චිත වගකීම් ඇත. නමුත්
කුමක් කරමින් සිටින්නේ ද? අපගේ දරුවන් ඝාතනය
අපගේ සහෝදරියන් දූෂණය කරනු ලබන අවස්ථාවේදී අ
භූමිය ආක්‍රමණය කරනු ලැබීමේදී අපගේ ද්‍රවිඩ භූමියේ යුද
දූල් නැගෙද්දී දේපළ, සැප, සම්පත් සඳහා පදවි තානා
වෙනුවෙන් පඩිපෙළ නැගීමට සූදානමින් සිටිමු. තනතුරු රැකග
කෙසේ ද? නැත්නම් අහිමි වූ තනතුරු ලබාගන්නේ කෙ
යන්නෙහි අද ද්‍රවිඩ දේශපාලඥයින්ගෙන් සීයයට........... ම
ප්‍රතිශතය ප්‍රකාශ කිරීමට කැමැති නැත. මේ ගැන කීම ල
සහගත ය. එහි බහුතරයක් වූ අයගේ කල්පනාව රැඳී
අද මේ යුද්ධය නවත්වන්න බැරි වී තිබෙන්නේ මෙකී පටු අ
නිසාය.

පාර්ලිමේන්තුවේ ද්‍රවිඩ මන්ත්‍රීවරු 28 දෙනෙක් සිටිති.
කම්කරු කොංග්‍රසයට අයත් සාමාජිකයන් 9 දෙනෙක්, ඊළම් ජ
ප්‍රජාතන්ත්‍රික පක්ෂයට අයත් සාමාජිකයින් 9 දෙනෙක් ද්‍රවිඩ වි
පෙරමුණට අයත් සාමාජිකයින් 5 දෙනෙක්, ඊළම් ජනතා විප්
විමුක්ති පෙරමුණට අයත් සාමාජිකයින් දෙදෙනෙක්, මා අය
ද්‍රවිඩ ඊළම් විමුක්ති ව්‍යාපාරයේ එක්කෙනෙක් සහ කඳුරට ජ
පෙරමුණෙන් එක් සාමාජිකයෙක් වශයෙනි. මෙය හැරුණු
එක්සත් ජතික පක්ෂයේ එක් සාමාජිකාවක් වන රාජ මනෙ
පුලේන්දිරන් ද මන්ත්‍රීවරියකි. අපි ඇය අතහැර දමමු.
කම්කරු කොංග්‍රසයේ 9 කි. ඊ. පී. ඩී. පී. ඉවත් වූ දෙදෙ
සමගයි මා කියන්නේ ඊ. පී. ඩී. පී. හි ජයගත් 9 දෙනා සම
කි. ද්‍රවිඩ විමුක්ති පෙරමුණෙන් 5කි, එකතුව 23 කි. ජ
දෙන්න යි. එකතුව 25 යි. ටෙලෝත් සමග 26 යි. කඳුකර ජ
පෙරමුණත් සමග 27 කි. මේ මන්ත්‍රීවරුන් 27 දෙනා හදිසි නී
විරුද්ධව ඡන්දය දීමට ඉදිරිපත් වුවහොත් එය මේ රටේ
පරෙවියා ලෙස පැමිණ අද යුද රාජාලියෙක් ව දේශපාලන
ආක්‍රමණය කරමින් සිටින වත්මන් ජනාධිපතිනියට නිශ්චි
දේශපාලන පණිවුඩයක් දීමට හැකියාව ලැබේ. එයට අප සූදා

සිටින්නෙමු ද? එයට අපි සූදානම් නැති තාක් සාමය ගැන කල්පනා කළ නොහැකි ය. සාමය ගැන කල්පනා කිරීම අත්හැර දමන්න. කොහෙත්ම කල්පනා කළ නොහැකිය. පාර්ලිමේන්තුවේ අයවැය විවාදයේදී-ආරක්ෂ අමාත්‍යාංශයේ මුදල් වෙන්කිරීමට විරෝධය පෑමට අප සූදානමින් නොසිටින තාක්-හදිසි නීතියේ මාසික දීර්ඝ කිරීමට එරෙහිව අප ඡන්දයදීමට සූදානමින් නොසිටින තාක් (රජයේ පාර්ශ්වයේ, සිංහල පාර්ශ්වයේ ප්‍රධාන විපක්ෂයක් ඇතුළුවයි මා කියන්නේ.) මෙයට විසඳුමක් නැත. අඩුපාඩු ඉදිරිපත් කිරීමෙන් පලක් නැත. මුලින් ම අපි අපගේ යුතුකම් ඉටු කළ යුතු යි. අප අපගේ ජනවර්ගය අතහැර දමා සිටින තාක් අනෙක් පාර්ශ්වය දෙස බලා සාමයට ඇති බාධාව ඔබයැයි කීමෙන් පලක් නැතැයි මම හඟිමි.

අද අපගේ දෑතේ ආයුධ තිබේ. ඊ.පී.ආර්.එල්.එෆ්., ඊ.පී.ඩී.පී, ටෙලෝ, ප්ලොට්, ආයුධ සන්නද්ධ සංවිධානයි. මේ ආයුධ අප සතු ආයුධ නොවේ. ඇතැම් විට කීප දෙනෙක් ළඟ තමන්ගේම ආයුධ තිබිය හැක. නමුත් බොහොමයක් ඉල්ලාගත් ආයුධයි. ආයුධ එසවිය යුතු තත්ත්වයක අප සිටියද ද්‍රවිඩ භාෂාවෙන් ප්‍රස්ථා පිරුළක් තිබේ. 'ආර්ය නැටුම් නැටුවත් කාර්යයේ සිහියෙන් සිටිය යුතු යි. ද්‍රවිඩ පක්ෂ ද්‍රවිඩ නැටුම් නටන්නේ ද? ආර්ය නැටුම් නටන්නේ ද? යන්න මේ ප්‍රශ්නයේ දී වැදගත් නොවේ. වැදගත් වන්නේ අප සිහියෙන් සිටින්නේ ද යන්න ය. නොයෙක් බලකිරීම්, නොයෙක් විරුද්ධතා, කුමන බෝම්බය කොහි සිට පැමිනෙන්නේදැයි නොදන්නා තත්ත්වයකි. බෝම්බවලට ලේබල් නැත. සංකේත නැත. මේ තත්ත්වය යටතේ දේශපාලනය කළ යුතු යයි කියන අභාග්‍ය සම්පන්න තත්ත්වය එසේ තිබිය දී පවා අපගේ මූලික ස්ථාවරයෙන් අප ඉවත් නොවන තාක් අපගේ ආත්මයන් අප නොවිකුණා සිටින තාක් මේ රටේ ද්‍රවිඩ ජන වර්ගය කිසි කෙනෙකුට වහල් කරගත නොහැකි බව අපි හොඳාකාරව දැන ගෙන සිටිමු.

දේශපාලන සාකච්ඡාවල දී ද්‍රවිඩ දේශපාලන පක්ෂ සමග කථා කර දැන් එපා වී ඇත. අයියාවරුන් දක්කෙමු. අම්මාවරුන්

ද දක්කෙමු. කවුරු කවුරුත් අපි දන් බලා ඇත්තෙමු. මීට පසුව වත් ජනවාර්ගික ප්‍රශ්නය සඳහා වූ දේශපාලන විසඳුමක් සඳහා වන සාකච්ඡාවල දී සාකච්ඡා වේදිකාවට පමණක් වත් ද්‍රවිඩ පාර්ශ්වය වෙනුවෙන් ද්‍රවිඩ කොටි සංවිධානය පමණක් ද්‍රවිඩ ඊළම් පාර්ශවයේ නියෝජිතයා ලෙස යැවීමට, හෝ පිලිගැනීමට හෝ අනුමැතිය දීමටවත් අප සූදානමින් සිටිය යුතු යි. විසඳුමක් පැමිණි පසු සාමය ඇති වූ පසු-ප්‍රජාතාන්ත්‍රික මැතිවරණයේ දී ද්‍රවිඩ ඊළම් කොටි සංවිධානය අපට කෙලින්ම මුණ ගැසිය හැකි ය. ද්‍රවිඩ ඊළම් කොටි සංවිධානය ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයකි. එකට එකතු වී සිටියහොත් ප්‍රජාතාන්ත්‍රික මැතිවරණයක දී උතුරු-නැගෙනහිර ද්‍රවිඩ ප්‍රාන්තය පරාජයට පත් කළ හැකිය යන්නෙහි මට විශ්වාසයක් තිබෙන්නේ ය. ජන වාර්ගික ප්‍රශ්නය සඳහා වන දේශපාලන සාකච්ඡාවල දී ද්‍රවිඩ ජනවර්ගය වෙනුවෙන් ද්‍රවිඩ ඊළම් කොටි සංවිධානය මීට පසු ද්‍රවිඩ ජන වර්ගයේ එක ම නියෝජිතයා ලෙස සහභාගී වන ස්ථාවරය පිලිගැනීමට ද්‍රවිඩ දේශපාලන පක්ෂ දන්වත් කල්පනා කර බැලිය යුතු යි. ද්‍රවිඩ ඊළම් කොටි සංවිධානයට අයත් දරුවන්, බිළිඳුන්, තරුණියන්, තරුණයන්, පරිත්‍යාග ගින්නෙහි තම රුධිරය, ඇට කටු, බිලි දෙමින් සිටින බව එක් අතකින් තරුණ පරම්පරාව කිය යි. ඒ ගින්නේ උණුසුම ලැබීමට දේශපාලන උණුසුම ලැබීමට අපගෙන් කීප දෙනෙකු දේශපාලන කඩ කීපයක් විවෘත කරගෙන සිටිති. මීට පසුවවත් දේශපාලන ගණිත වෘත්තීය අත් හළ යුතු ය. විදේශ රටවල කොටි සංවිධානය කැට සොලවන බව මම හොඳාකාරව දනිමි. එයට බොහෝ දෙනෙක් මුදල් දමති. ඔබට ආරංචි වී තිබෙනවා ද? විදේශවල ජීවත්වන අවතැන් ගතවූ ද්‍රවිඩයින්ගේ කව්රු හෝ කෙනෙකු තමාගේ පුතා හෝ දුව ආයුධ පුහුණුව සඳහා විමුක්ති කොටි සංවිධානයේ කඳවුර වෙතට යැවූ බවට ආරංචි වී තිබෙනවා ද? ලංකාවේ දී අවතැන්ගත වූ ද්‍රවිඩයින්ගේ කීදෙනෙකුගේ පවුල්වලින් දෙමව්පියන් තම දරුවන් කොටි සංවිධානයට එකතු වීමට යවා තිබෙන්නේ ද? අපගේ ජනවර්ගයේ කල්පනාව තිබෙන්නේ කොහි ද? තිබෙන්නේ කොහොමදැයි අප තේරුම්ගත යුතුයි.

සියලු සටන් බලවේග එක්සත් විය යුතු යැයි අපි බලාපොරොත්තු වෙමු. ද්‍රවිඩ ව්‍යාපාර අතරේ කලෙක දී ආයුධ ඔසවා ගෙන සටන් කළ දේශපාලන ව්‍යාපාර සෑම එකක් ම එක්සත් විය හැකිනම් ද්‍රවිඩ ජනවර්ගයේ විමුක්තිය අපට ළඟා කර ගත හැක. ස්ථිර සාමය තුළින් එය කළ නොහැකි නම් එම සාමය කවදාවත් නොඑන්නේ නම් ප්‍රසිද්ධියේ එකක් ප්‍රකාශ කරන්න කැමැත්තෙමි. එනම් අපගේ දෑතේ තිබෙන තුවක්කු ද්‍රවිඩ ඊළම් විමුක්තිය වෙනුවෙන් උඩට එසවී තමන්ගේ ම භාෂාවෙන් කථා කරන තත්ත්වයක් උදාවෙයි. වේදිකාවල මයික්‍රොෆෝනය ඉදිරිපිට නොව පුවත් පත් නිවේදන මගින් නොව ජාත්‍යන්තර සමුළු, වායුසමීකරණය කරන ලද කාමරවල නොව ද්‍රවිඩ ඊළම් භූමියේ සිට ය. 1992 පෙබරවාරි 18වන දින පාර්ලිමේන්තුවේ ජනවාර්ගික ප්‍රශ්නය සඳහා වූ තේරීම් කාරක සභාව ඉදිරියේ දී මේ වචනවලින් ම ප්‍රකාශ කළ පුද්ගලයා වශයෙන් එය නැවතත් ප්‍රකාශ කරන්නෙමි. එක්කෝ ස්ථිර සාමය සඳහා වූ, ස්ථිර විසඳුම සඳහා වූ, එකම සාමය කරා අපි සැවො ම මීට පසුව වත් විශ්වාසයෙන් යුතුව ක්‍රියාත්මක විය යුත්තේ ම ය. ක්‍රියාත්මක විය හැකි නම් එක්සත් ලංකාවක් තුළ ඒකීය ලංකාවක් තුළ සම්පූර්ණ අර්ථවත් සන්ධීය ආණ්ඩු ක්‍රමයකි. එය ප්‍රායෝගික නොවන්නේ නම් අපගේ නිදහස් ද්‍රවිඩ ඊළමේ නිදහස් ධජය ලෝක තලයේ රුස් දිදී බැබලීම සඳහා නැවතත් ලේ වැගිරීමට අප සූදානමින් සිටිය යුතු යි.

එම නිසා මේ පදනම මත සාමය කරා ගමන් අරඹන සෑම උත්සාහයකට අපගේ සහයෝගය ලැබෙනු ඇත. හදිසි නීතිය දීර්ඝ කිරීම වාර්ෂිකව පමණක් නොව පාර්ලිමේන්තුවේදීද විරුද්ධ වී ඡන්දය දෙමින් සිටින පක්ෂයකට අයත් කෙනෙකු වශයෙන් සාමය සඳහා කවිරු ඇප කැප වුණත් කුමන සංවිධානය ඇප කැප වුණත් ඒ සඳහා සම්පූර්ණ සහයෝගය ලබා දෙමු. අපි කුමක් විකුණුවත් අපගේ ආත්මය විකිණුවේ නැත. විකුණන්නේ ද නැත. අපගේ ආත්මය නොවිකුණු අය ලෙස එය මම මෙහි විශ්වාසනීය ලෙස සිතට එකඟව අවංකව (අවංක භාවයට එකම එක අර්ථයක් තිබිය හැකි ය ඊට අනුව) ප්‍රකාශ කරමි.

# මුස්ලිම් අයිතිවාසිකම් ආරක්ෂාවේද?

මනෝගනේෂන්.
(ප්‍රජාතාන්ත්‍රික කම්කරු කොංග්‍රසය)

සුළු ජාතික දේශපාලන පක්ෂ අතරින් සාම ක්‍රියාදාමය කියා පවසන විට එවැනි දෙයක් ඉතිරි වී තිබෙන්නේ ද යන ප්‍රශ්නය ස්වභාවයෙන් ම මට නැගේ. ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් දේශපාලන ක්‍රියාදාමයන් ගැන සාකච්ඡා කිරීමේ දී දේශපාලන විසඳුම් නැතහොත් බලය බෙදාහැරීම යන වචන භාවිතය හුදෙක් වචන ලෙස පමණක් පාවිච්චි කිරීම අපට පෙනෙන්නට ඇති දෙයකි. තව ද රජයේ යෝජනාවලිය නැතහොත් දේශපාලන ක්‍රියාදාමයන් යන නොයෙක් විධ කථාවලින් පසුව මෙවැනි ආවරණවලට පසු පසින් තීව්‍ර හමුදාමය සිතුවිල්ල තිබීම පැහැදිලිවම පෙනෙන්නේ ය. ඒ සමග ම ජාත්‍යන්තර මට්ටමේ පීඩනයන් ඇති කරන දේශපාලන ක්‍රියාදාමයට නිසි ලෙස දායකත්වය දීමට ද්‍රවිඩ සහ මුස්ලිම් පක්ෂ අපොහොසත් වූ බව මම හඟිමි. මේ අදහස කුමන හෝ පක්ෂයකට මඩ ගැසීමට හෝ කාගෙවත් අඩුවක් සෙවීමට වත් ප්‍රකාශ කෙරුණු දෙයක් නොවේ. මෙය පොදු අදහසක් ලෙස පවතින්නේ ය. මෙම අදහස මගේ අදහස පමණක් නොවේ. අද මේ රටේ ජීවත්වන ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාව අතර ප්‍රසිද්ධියේ කථා කරනු ලබන අදහස යි.

80 ගණන් වල ද්‍රවිඩ ජාතික චින්තනය උච්ච අවස්ථාවට පත්වූ විට ද්‍රවිඩ පර්ශ්වයන් අතර ඉදිරිපත් කරන ලද තිම්පු න්‍යායන් ද්‍රවිඩ පක්ෂ අවසාන වශයෙන් ඉදිරියට ගෙන යෑමට අපොහොසත් වුහ. මේ හේතු නිසා තිම්පු න්‍යායන් හුවා දක්වන ඒ පදනම ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නය සම්බන්ධව ජාත්‍යන්තර

සහ දේශීය වේදිකාවල නිසි ලෙස ගෙන හැර දක්වීමක් සිදු නොවුණි. ස්ථිර ස්ථාවර නොතිබීමේ හේතුවෙන් ද්‍රවිඩ පක්ෂවල දේශපාලන ක්‍රියාදාමය යන සහභාගිත්වය කොළඹදී පාලනය කරන රජයන්ට ද්‍රවිඩ පක්ෂ ලෙස මුක්කු ගසන්නේ ය.

තිම්පු න්‍යාය යනු කාලාවරෝධී වූ කරුණක් නොවේ. අනෙක් පැත්තෙන් එය වෙනස් කරන්ටම බැරි ආගමික ප්‍රස්තුතයක්ද නොවේ. අවුරුදු 15කට පමණ පෙර මේ තිම්පු න්‍යායන් ඉදිරිපත් කළ වේලේ තිබූ තත්ත්වයට වඩා තිම්පු න්‍යායන්ගේ අවශ්‍යතාව අද ඉතා ම දැඩිව පවතී. මේ රටේ සුළු ජාතික ජනවර්ගයට, විශේෂයෙන්ම ඊළම් ද්‍රවිඩයින්ට පහසු වූ ප්‍රතිපාදන මොනවා ද? ද්‍රවිඩයින් සැම දෙනාම මෙරටට පැමිණ පදිංචි වූවන්. ඔවුන්ටම කියා මේ රටේ රාජ්‍යයන් තිබුනේ නැත. මේ පදනම මත උතුරු නැගෙනහිර ප්‍රදේශයේ ද්‍රවිඩ ජනතාවට පාරම්පරික ප්‍රදේශයක් නොමැත. මේවා තමයි අද සිංහල බහුජාතිවාදයේ ස්ථාවරයන්. මේ අදහස බොහෝ විට සැම සිංහල දේශපාලන පක්ෂයක්ම ඉදිරියට ගෙනයන්නේ ය. මෙසේ බලන විට මේ ස්ථාවරයන්ට ප්‍රති පාර්ශ්වයේ පිළිතුරු ලෙස ද්‍රවිඩ පාර්ශ්වය මුලින් ඉදිරිපත් කරනු ලබන න්‍යායයන් හෝ ස්ථාවරයන් කුමක් විය හැකිද? ඒවා තමයි තිම්පු න්‍යායයන්.

උතුරු නැගෙනහිර ප්‍රදේශයේ ද්‍රවිඩ ජනතාවට පාරම්පරික ප්‍රදේශයක් නැත, ද්‍රවිඩ ජනයාට විශේෂිත අනන්‍යතා ලක්ෂණවලින් යුත් වැදගත් න්‍යායන් දෙකක් අමතක කොට ද්‍රවිඩ ජනයාට සාධාරණය ඉටුකළ හැකි හෝ ආත්ම ගෞරවයෙන් යුක්ත වූ විසඳුමක් ඉදිරිපත් කළ හැකි ද? එම නිසා මෙහි පැමිණ නොසිටින ද්‍රවිඩ පක්ෂ නැවතත් තිම්පු න්‍යායන් ස්ථිරව ඉදිරියට ගෙනයෑමට උත්සාහ කළ යුතු යි. මෙය කාලයේ අවශ්‍යතාවයි. මේ අනුව ජනවාර්ගික ප්‍රශ්නයක විසඳුම සඳහා වූ දේශපාලන ක්‍රියාදාමයන් තිබිය යුතුයි. ඊළම් ද්‍රවිඩයින්ගේ දේශපාලන පක්ෂ ඉදිරියේ අද කොටස් දෙකක් පමණ යි ඇත්තේ. එකක් ද්‍රවිඩ

පාර්ශ්වයේ ස්ථාවරය පැහැදිලිව රජයටත් රටටත් ජාත්‍යන්තර සමාජයටත් ප්‍රකාශ කිරීම නැත්නම් මහජාතිවාදී සිංහල ප්‍රමුඛත්වය පිලිගෙන ලංකාව සිංහල බෞද්ධ රටක් යැයි කථා නොකර සිටීම යි. මේ මාර්ග දෙකක් හැර වෙනත් මගක් තිබෙන බවත් මට පෙනෙන්නට නැත.

ජනවාර්ගික ප්‍රශ්නයට පීඩනයක් ඇති කළ හැකි උත්සාහයන් දෙකක් අද අප රටේ අප ඉදිරියේ තිබෙන්නේ ය. අපි එය දකින්නෙමු. එකක් දක්ෂිණ ලංකාවේ සිටින පෞද්ගලික ව්‍යාපාරික රැකියා කණ්ඩායම්වලින් ඉදිරියට ගෙන යනු ලබන එක් උත්සාහයකි. අනෙක ආගමික වශයෙන් සමාජමය වශයෙන් වූ ආයතන කීපයක් එකට එකතු වී ඉදිරියට ගෙන යනු ලබන උත්සාහය යි. මේ උත්සාහයන් දෙකම මූලිකව සිංහල ජාතික ජනවර්ගය අතරින්ම තමයි පැන නැගී ඇත්තේ. උතුරු-නැගෙනහිර යුද්ධය දක්ෂිණ ලංකාවේ මොනතරම් ආර්ථික බරක් හා සමාජ පීඩනයක් ඇතිකොට තිබෙන්නේ දැයි මෙයින් පෙනී යයි. මේ උත්සාහයන්ට සහ ද්‍රවිඩ පක්ෂවලට හෝ ද්‍රවිඩ පක්ෂවල දේශපාලන සාමය සඳහා වූ ක්‍රියාකාරකම් වලට කිසිම සම්බන්ධතාවයක් නොමැත. මහා ආධිපත්‍ය, මහ ජාතිවාදී චින්තනයේ සිට මුළුමනින්ම මතු නොවූ සිංහල ජනතාව අතරින් මෙවැනි සාමය සඳහා වූ ක්‍රියාකාරී උත්සාහයන් ඉදිරියට ගෙන යනු ලබද්දී ද්‍රවිඩ පක්ෂ ඇයි නිහඬව සිටින්නේ? හුදු පුවත්පත් නිවේදනවලින් ඔබ්බට ප්‍රජාතාන්ත්‍රික ලෙස අවිහිංසාවාදී ලෙස ද්‍රවිඩ පක්ෂවලින් ක්‍රියාකළ නොහැක යන්න ද්‍රවිඩ පක්ෂ විශේෂයෙන් ම ඊළම් ද්‍රවිඩයින්ව නියෝජනය කරන ද්‍රවිඩ පක්ෂ කල්පනා කළ යුතු යි.

අද ලංකාවේ ජාතික ජනවාර්ගික ගැටලුවල නව විපර්යාසයක් ඇති වී ඇත. එය ද්‍රවිඩ ජනතාව නියෝජනය කරන විශේෂයෙන් ඊළම් ද්‍රවිඩ සහ මුස්ලිම් ද්‍රවිඩ පක්ෂවලට මම කියා සිටීමට කැමැත්තෙමි. එනම් දකුණේ ලංකාවේ සිට ඉන්දීය පාරම්පරික ජනතාව අතරේ ඇති වී තිබෙන ප්‍රබෝධය. මෙතෙක්

කල් හුදෙක් වතු ජනතාව වතු කම්කරුවන් ලෙස සලකන ලද සීමාකරන ලද දක්ෂිණ ලංකාවේ ජීවත්වන ඉන්දීය පාරම්පරික ජනතාව අද ජාතික ජනවර්ගයක් ලෙස වර්ධනය වී ඇතැයි මහ හඬින් කීමට පටන්ගෙන ඇත්තෙමු. අපගේ ඉන්දීය පාරම්පරික ජනතාව ආශ්‍රිත ජාතික ප්‍රබෝධය ඇති වී තිබෙන්නේ මේ අනුව ය. එම නිසා මින් පසු කාලයේ ලංකාවේ ජාතික ජන වාර්ගික ප්‍රශ්නය විසඳීම සඳහා කරනු ලැබිය හැකි කුමන හෝ උත්සාහයකදීවත් ඊළම් ද්‍රවිඩයින්ගේ ප්‍රශ්නය සාකච්ඡා කිරීමේ දී, එමෙන්ම මුස්ලිම් ජනතාවගේ ප්‍රශ්නය සාකච්ඡා කිරීමේදී ඊට සමානව ඉන්දීය පාරම්පරික ජනතාවගේ ප්‍රශ්නද ඉදිරිපත් කරනු ලැබිය යුතු යි. ඒ සඳහා වූ ප්‍රබෝධය අද කඳුකරයේද දක්ෂිණ ලංකාවේ ද ඇති වී හමාර ය.

# අනන්‍යතා සංකේතයක් ලෙස

පී. පී. දේවරාජ්
(ලංකා කම්කරු කොංග්‍රසයේ පාර්ලිමේන්තු මන්ත්‍රී)

එක ම ජල ධාරාව ජල ගැල්මක් ලෙස ගැලුවේ ය. ඒ ජල ධාරාවේ නොයෙක් දිය උල්පත් තිබුණි. තනි පුද්ගල ත්‍රස්තවාදය, ප්‍රචණ්ඩත්වය මිශ්‍ර වූ ත්‍රස්තවාදය, අවිහිංසාවාදී ගාන්ධි පිළිවෙත යනාදී වශයෙන් විවිධ උල්පත් ඒ මහා ජලධාරාවට එක් වී මුළු ප්‍රවාහයේම ගලා ගියේ ය. අද පවා තනි පුද්ගල ත්‍රස්තවාදයේ යෙදී සිටි භගවත් සිං යනාදී අය ජාතික වීරයන් ලෙස ප්‍රසංශා කරනු ලබන තත්ත්වයකි. අයි. එන්. අයි. පිහිටුවා ජාතික විමුක්ති රැගෙන ආ සුභාෂ් චන්ද්‍රබෝස් ඉන්දියාවේ ඉහළ පෙළේ දේශ භක්තිකයෙකු ලෙස ගරු කරනු ලබන්නේ ය. එමෙන්ම මහත්මා ගාන්ධි ද තවත් මාර්ගයකින් සැලකිල්ලට ලක්වන්නේ ය. මේ අයුරින් බලනවිට හැඟීම් සහ චින්තනයන් මිශ්‍ර වූ මේ උතුරු නැගෙනහිර ආශ්‍රිත ද්‍රවිඩ ඊළම් විමුක්ති සටනේ නොයෙක් විධ උල්පත් තිබී ඇත්තේ ය. හැඟීම් බර වීම නිසා තම ජනතාව ඉමහත් බලපෑමකට ලක්වන්නෝ ය. අසාධාරණ ලෙස හිරිහැරයට ලක්වන්නාහ. ඔවුන්ගේ සාධාරණ ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලබන්නේයැයි මෙවැනි හැඟීම් නිසා පැන නැගෙන වේගය කෙනාට යා යුත්තේ දැයි නොදන කෙසේ කව්රුන් සමග ගැටෙන්නේදැයි නොදන ඇතැම් විට එකිනෙකා සමග ගැටෙන තත්ත්වයක් ඇතිවන්නේ ය.

කුමාර් පොන්නම්බලම් මහතා අදහසක් ඉදිරිපත් කළේ ය. කොළඹ, උතුරු-නැගෙනහිර පරිබාහිරව ජීවත්වන ජනතාවගේ ස්ථාවරයන් පදනම් කරගෙන කුමක් හෝ නොකර උතුරු

නැගෙනහිර පාරම්පරික ප්‍රදේශය ලෙස කොට ගත් ජනතාවගේ මූලික ද්‍රවිඩ ඊළම් ඉල්ලීම පදනම් කරගෙන කටයුතු කිරීම උචිතය යන්න ඔහුගේ තර්කය බව සිතමි. එනම් උතුරු-නැගෙනහිර සිටින ද්‍රවිඩ ජනතාවට ද්‍රවිඩ ඊළම් යැයි සාධරණ ඉල්ලීමක් තිබෙන්නේ ය. එයයි තිම්පු න්‍යාය ය. එය පිලිගත යුතු යි. එය නැත්නම් කිසිවක් පිලිගත නොහැකි ය. අද එය සිහිනයක් බඳු විය හැකිය. නමුත් එය සිහිනයක් නොවේ. ඒ සිහිනය සැබෑවනු ඇත. එය ස්ථිරය යන්න ඔවුන්ගේ ස්ථාවරය යි.

වෙනත් ස්ථාවරයක් ගැන මම කල්පනා කරමි. දැන් උතුරු-නැගෙනහිර ඇති වී තිබෙන යුද්ධය නිසා ආයුධ සන්නද්ධ අරගලය නිසා මරණ කිහිපයක් සිදුවෙමින් පවතී. සරණාගතයින් වශයෙන් තමන් ජීවත් වූ මව් බිමෙන් පිටවිය යුතු ලෙසට සමහරුන්ට බල කෙරුණි. ලක්‍ෂ 6 කටත් වැඩි උතුරු-නැගෙනහිර ජනතාව අද විදේශගතව ජීවත්වෙති. ශ්‍රී කාන්තා මහතා ප්‍රශ්නයක් ඇසී ය. එසේ ජීවත් වන්නන්ගේ කිසිවෙකු ආයුධ ඔසවා සටන්කිරීමට තම දරුවන්ව ස්වාමිද යන ප්‍රශ්නය මතු කර 'නැත' යන පිළිතුර ද දුන්නේ යැයි සිතමි. එසේ නම් උතුරු නැගෙනහිර ඇතිවී තිබෙන තත්ත්වය නිසා සැමදාම විදේශගත වෙමින් සිටිති. එසේ යන අය එහි සිට වෙනත් මාර්ගවලින් ද්‍රවිඩ ඊළම් චින්තනයේ සහ ද්‍රවිඩයින් යන හැඟීමෙන් ඔවුන් හැඟීම් බර වුවත් ඔවුන්ගේ ළමයින් ආයුධ රැගෙන සටන්කිරීමට මෙහි යැවීමට මැලිවන බවට ඔහු අදහස් දැක්වූවේ ය.

ලක්‍ෂ 6ක් විදේශගතවූ අය හැර සෑහෙන සංඛ්‍යාවක් සරණාගතයින් ලෙස මේ රටේ නොයෙක් ස්ථානවල සිටිති. නොසෑහෙන දුක් ගැහැටවලට මුහුණ දී සිටිති. ඔවුන්ගේ කථාව කඳුළු කතාවකි. මාත් දිනපතා ගොස් ඔවුන් බලමි. එසේ බලන විට සෑම පුද්ගලයෙකුටම, පවුලකටම මොනතරම් ප්‍රශ්න තියෙනවා ද? කාන්තාවක් විවාහවීම සඳහා සියල්ල සූදානම් කරගෙන තමා විවාහවීමට යන පුද්ගලයා විදේශගතව සිටීමේදී කොහේ දී ද

හමුවන්නේ, කොහොම ද විවාහය පවත්වන්නේ, කියා පීඩා විඳින තත්ත්වයකි. එසේ ඔවුන් එකතුවුනේ නැත්නම් විවාහයත් නතර වී එම කාන්තාව ඊළඟට කරන්නේ කුමක්දැයි නොදන දුක්විඳින තත්ත්වයකි. මෙසේ නොයෙක් ආකාරයේ පීඩා ඇත. වවුනියාවේ සිට කොළඹ පැමිණීමට රුපියල් දහස් ගණන් ගෙවිය යුතු තත්ත්වයක් උද්ගත ව තිබේ. මෙහි සිටියත් විටින් විට සැකපිට අත් අඩංගුවට ගැනීමට ලක් වේ. විදේශගත වූ ලක්ෂ 6 හැරෙන්න අනෙකුත් ද්‍රවිඩ සමාජය මොනතරම් පහත් තත්ත්වයකට වැටී තිබෙන්නේ ද? මෙවැනි වකවානුවක දී අප කල්පනා කර බැලියයුතු නොවේ ද? එය එක ප්‍රශ්නයකි. ද්‍රවිඩ ඊළම යනු සිහිනයක් නොවේ. එය සැබෑවන කාලයක් පැමිණෙනු ඇත. ඒ මූලික සාධාරණ ඉල්ලීම කාටවත් නවත්වන්න පුළුවන්කමක් නැතැයි ස්ථාවරයක් තිබෙන නිසා එහි සාධාරණත්වයක් ඇත, හැඟීම් බර තත්ත්වයක් ඇත, යන්න හොඳින් තේරුම්ගත හැකි ය.

නමුත් අනෙක් පැත්තෙන් මෙසේ ජනතාව විදේශ ගතවේ. ඔවුන්ගේ සම්බන්ධතාවයන් මඳක් අඩු වේ. ඔවුහු එහි ස්ථිරවීමට සූදානම් වෙති. වෙනත් ආකාරයක් ආසාවන් එහි දී බිහිවෙමින් තිබේ. සරණාගතයෝ මෙහි පිරී සිටිති. එම නිසා මෙම යුද්ධය මේ තත්ත්වයේ දී කුමන ආකාරයේ ප්‍රවේශයක් අනුගමනය කරන්නේ ද යන්න වැදගත් ප්‍රශ්නයක් ලෙස මතුවෙන්නේ ය.

ශ්‍රී කාන්තා මහතා හොඳ අදහසක් ඉදිරිපත් කෙළේ ය. දැන් සටනේ දී කෙළින්ම ආයුධ ඔසවාගෙන ලංකා හමුදාවත් සමග සටන් කරගෙන සිටින්නේ විමුක්ති කොටින් ය. එම නිසා මේ ලංකා රජයත් විමුක්ති සටන පවත්වන අයත් අතර සාකච්ඡාවක් පැවැත්විය යුතු නම් එය කොටින් පදනම් කරගෙන යි සිදුවිය යුත්තේ. සාකච්ඡාව පැවැත්විය හැකි අය ඔවුන් ය. එම නිසා අනෙකක් ද්‍රවිඩ දේශපාලන පක්ෂ තමන්ගේ ස්ථාවරය යම් දුරට සීමා කොට පරිත්‍යාග කිරීමෙන් තේරුමක් නැත. අපි එයට සහයෝගය දැක්වීමේ ස්ථාවරයෙහි පිහිටීම යහපත් බව ඔහු

කීවේ ය. මෙය ඊළඟට ගත හැකි පියවර බව මට පෙනේ. ඊළඟ පියවර වශයෙන් කල්පනා කළයුතු කරුණක් නම් සාකච්ඡා සඳහා ලංකා රජය කටයුතු කරන ආකාරය යි. සාකච්ඡා සඳහා ඇත්ත වශයෙන්ම රජය කැමැත්තක් දක්වන්නේ නැත. අභ්‍යන්තරයේ එකක් තබාගෙන බාහිරින් එකක් කථා කරන බව බොහෝ දෙනා අදහස් දක්වති. සාමය කථා කරමින් ම යුද්ධය ඉදිරියට ගෙනයති. මොවුහු එහි විනාශය සිදුවෙමින් තිබිය දී මෙහි සාම සාකච්ඡාවල මුවාවෙන් රඟ දක්වති. එමනිසා කාව ද විශ්වාස කරන්නේ? දෙපාර්ශ්වයම එකට එකතු කොට සියලු ද්‍රවිඩ පක්ෂ හෝ වෙවා කොටින් හා රාජ්‍ය අතර සාකච්ඡාවන් පැවැත්විය යුතු යි. සාකච්ඡා ඔස්සේ ආරම්භ කරන ලෙස පෙළඹීම ද අවශ්‍ය වේ.

සාම ක්‍රියාදාමය උනන්දු කිරීම සඳහා, ශක්තිමත් කිරීම සඳහා සියලු ද්‍රවිඩ පක්ෂ මෙසේ එකට එකතු වී එක ස්ථාවරයකට පැමිණ පෙළඹවීම ඇති කළ යුතු යි. පෙළඹවීම ඇතිකිරීම යනු ද්‍රවිඩ පක්ෂ පමණක් එකට එකතුවීම නොවේ. ලංකාවේ අනෙක් ජන වර්ගවලට අයත් අය මේ රටේ සාමයක් අවශ්‍ය යි, ප්‍රජාතාන්ත්‍රික සම්ප්‍රදායන් ආරක්ෂා කළ යුතු යි, ප්‍රජාතාන්ත්‍රවාදය ස්ථිර විය යුතු යි, ප්‍රචණ්ඩ ක්‍රියාවන් නැති විය යුතු යි, ජනතාව සුහද ව හා සහෝදරත්වයෙන් ජීවත් විය යුතු යි, කියා ඔවුන්ගේ ශක්තිය ද අප එකට එකතු කළ යුතු යි. එසේ එකතු කොට ඔවුන් ද කිවයුත්තේ සාමය - සාකච්ඡාව කල් නොදමන්න, සාම සාකච්ඡාව සඳහා වහාම පියවර ගන්න, යනා දී වශයෙනි.

තුන්වන බලයක් නැත්නම් තුන්වන පාර්ශ්වකරුවෙකු ලෙස කාගේවත් මැදිහත් වීමක් අවශ්‍ය නම් නොයෙක් හේතු ඉදිරිපත් කොට එය ප්‍රතික්ෂේප නොකළ යුතු ය. එක පැත්තකින් පොදු පෙරමුණ, ඒ හා සම්බන්ධ පක්ෂ වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන කොට ගෙන සිටින පක්ෂ, අනෙක් පැත්තෙන් එක්සත් ජාතික පක්ෂය, මේ පක්ෂ දෙකම ඔවුන් ආරම්භ කළ කාලයේ සිටම ජනවාර්ගික ප්‍රශ්නය පදනම් කරගෙන යි ඔවුන්ගේ

දේශපාලනය කර තිබෙන්නේ. 1948 පුරවැසි අයිතිවාසිකම් පනත ඉදිරිපත් කළ කාලයේ සිට 1956 වන වසරේ භාෂා පනත යනාදී වශයෙන් බැලූ විට මේ ප්‍රශ්නයේ පදනම තමයි ඔවුන්ගේ දේශපාලන පදනම වශයෙන් තිබුනේ. මෙයින් ඔවුන් වෙන්කර ගන්න පුළුවන් ද? එකම ස්ථාවරයකට පැමිණ මේ රටේ නොයෙක් ජනවර්ග ය සමග එකතු වී ජීවත්වන අත්‍යාවශ්‍ය තත්ත්වයට ඔවුන්ව තල්ලු කළ යුතු යි. මෙය දෙවනු ව කළ යුතු වැදගත් කටයුත්තකි. එහෙයින් එකපාරට ම හැඟීමේ උච්ච අවස්ථාවට ගොස් මෙය මෙසේ කළ යුතු යයි ස්ථාවරයක් ගත නොහැකි තත්ත්වයක අපි සිටින්නෙමු. අප යම් කටයුතු කල්පනාවෙන් නිර්මාණාත්මක ව, ඉතාමත් සාවධාන ව හොඳින් කල්පනා කොට හොඳ සැලසුම් ඇති කොට පැහැදිලි ප්‍රතිපත්තියක් ඇතිකොට එයට එකිනෙකා චෝදනා නොකර එකිනෙකට වෙනස් අදහස් තිබෙන බව පිලිගෙන ක්‍රියාත්මක කළ යුතු ය. මේ සියල්ලක්ම ඒ විමුක්ති ජල ධාරාවේ නොයෙක් උල්පත් බව සිහි තබාගත යුතු වේ.

ලංකාවේ නොයෙක් ජනවර්ග සිටිති. සමහර මිතුරන් ප්‍රශ්න කරන්නේ, ඇයි ද්‍රවිඩයින් කොටස් දෙකකට බෙදන්නේ? මෙය අවශ්‍ය ද? හැමෝ ම ද්‍රවිඩයින් නේද? යනාදී වශයෙනි. ඇයි මෙසේ කරන්නේ? යන හැඟීමෙන් ඔවුහු බලති. ද්‍රවිඩයින්ගේ අනන්‍යතාව නොයෙක් ලක්ෂණ වලින් යුක්ත ය. ඉන්දීය පාරම්පරික ජනතාව යැයි කීමෙන් ද්‍රවිඩයින් ලෙස අනන්‍යතාවක් නැතැ යි කිව නොහැකි ය. එක පැත්තකින් අප සියල්ලෝ ම ලංකා ද්‍රවිඩයෝය. අපගේ සංස්කෘතිය, භාෂාව, හැදියාව, සම්ප්‍රදායන්, අප අතර ඇති සම්බන්ධතාවයන් සියල්ල අමතක කළ නොහැකි ය. ඇත්ත වශයෙන් ම ද්‍රවිඩයින් යන පදනමෙන් ද්‍රවිඩ හැඟීම් ද්‍රවිඩ අදහස් තිබෙන්නේ ය. ඒ සමග ම ඉන්දීය පාරම්පරිකයින් යැයි කඳුකරයේ ජීවත්වන ජනතාව ඉතාමත් පසුබෑමට ලක්වූ තත්ත්වයක සිටිති. 1948 සිට ජාතික ජලධාරාවට එකතු නොකර අධ්‍යාපනයේ දී තවත් නොයෙකුත් අංශවල ද පසු බෑමට ලක් වූ

තත්ත්වයක සිටිති. ඔවුන්ට ඒ හේතුව නිසාම තනි අනන්‍යතාවක් ඇත. ඔවුහු එක තැනක ගොනු වී ජීවත් නොවෙති. නොයෙක් තැන්වල විසිරී ජීවත් වෙති. එවැනි ජනතාවකගේ ප්‍රශ්න, නොයෙක් ලක්ෂණවලින් යුක්ත ය. එමනිසා ඔවුන්ට ද තනි අනන්‍යතාවක් ඇත. ඔවුන්ගේ අනන්‍යතාවටත් ද්‍රවිඩයින්ගේ අනන්‍යතාවටත් කිසිම පටහැනි බවක් නොමැති බව සියලු දෙනා ම තේරුම් ගතයුතු යි. එම නිසා ඉන්දීය පාරම්පරික ද්‍රවිඩයින් යැයි කථා කළොත් එය අපගේ පසු බැමට ලක් වූ තත්ත්වයෙන් වෙනස් වී දියුණු විය යුතු යි. අපට හොඳ නිවාස පහසුකම් අවශ්‍ය යි. අන් අය සමග සමාන ව උසස් විය යුතු යි. යනාදී චින්තනවල පිළිබිඹුව මිසක් ලෝක ද්‍රවිඩයින් යන චින්තනයේ පිළිබිඹුව ද අපට නැත. ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාව ද්‍රවිඩ භාෂාව මව් බස කොට ගත් අය යි. ලොවේ පැරණි භාෂාවලින් එකක් වන දෙමළ අපගේ බස යි, දෙමළ අපගේ ප්‍රාණය යි, යන අදහස යි අප හැමෝම දරන්නේ. එම නිසා එම අනන්‍යතා සංකේතය සියලු දෙනා ම තේරුම් ගත යුතු යි.

# උතුරේ ජනවර්ග දෙකක අත්දැකීම්

මෞලවි පී. ඒ. එස්. සුපියාන්.
**(උතුරේ මුස්ලිම් අයිතිවාසිකම් සඳහා වූ සංවිධානය)**

මෙතෙක් සාකච්ඡා කෙරී තිබෙන කරුණු ගැන බැලීමේ දී මෙම දේශපාලන පක්ෂ මගින් මේ රටේ සාමය ස්ථාපිත කළ හැකි ද? ඒ සඳහාවූ උත්සාහයක් ක්‍රියා පිළිවෙතක් මොවුන් සතු ව තිබෙන්නේ ද? යන ප්‍රශ්නය මා තුළ පැන නගී.

යුද්ධය හා සටන දේශපාලන වෙළඳාමක් බවට පත් වී ඇත. නමුත් මේ යුද්ධය නිසා මේ රටේ නැත්නම් අපගේ ජනතාව අතරේ කුමක් ඉතිරිව තිබෙන්නේ ද යන්න ප්‍රශ්නයක් ව තිබේ. අද උතුරු ප්‍රදේශයෙන් පිටමං කර තිබෙන මුස්ලිම්වරුන් පවා මේ යුද්ධය හේතුවෙන් ඇතිවූ ඔවුන්ගේ දුක්බර ජීවිතයේ සංකේතයක් ලෙස පවතින්නේ ය. ඇත්ත වශයෙන් ම අපගේ ප්‍රජාවට ඇති වූ බවක් අපට පෙනෙන්නට නැත. ඒ මන්ද යත් එක්සත්ව හා සමගි ව ජීවත් වූ පාරම්පරික භූමියක ජීවත් වූ සමාජයක් කිසි හේතුවක් නොමැතිව නිශ්චිත කාලවේලාවක් තුළදී තමන්ගේ පාරම්පරික භූමියේ සිට පිටමං කළ හැකි වාතාවරණයක් ඇති විය. ජාතිවාදී කෝලාහල මගින් විවිධ අවස්ථාවල දී ද්‍රවිඩ ජනතාව හානියට පත් වී සිටී. නමුත් නිශ්චිත කාල පරිච්ඡේදයක් සමග ඔවුන්ගේ එම ජාතිවාදී කෝලාහල සන්සුන් වූ අවස්ථාවක ඔවුන් කලින් ජීවත් වූ ප්‍රදේශයට නැවත පැමිණ ජීවත්විය හැකි තත්ත්වයක් අපි දකින්නෙමු. උතුරුකරයේ ජීවත් වූ මෙම මුස්ලිම්වරුන් ගැන කල්පනා කිරීමේ දී නැවතත් තමාගේ ස්වභූමියට ගොස් ආරක්ෂිතව ජීවත්විය හැකි තත්ත්වයක් මේ දක්වා ඇති වුණේ නැත. මෙයට මූලික වූ හේතුව කුමක් ද? ඔවුන්ගේ පාරම්පරික භූමියෙන් ඔවුන් පිටමං

කරන ලද ක්‍රමය මේ ජනතාව නැවතත් තමන්ගේ ස්ථානව ගොස් ජීවත්වීමට බිය ගෙන දෙන වාතාවරණයක් ඇති තිබේ.

මේ තත්ත්වයේ දී තමන්ගේ පාරම්පරික භූමියට ගෙ ජීවත් විය යුතු ය යන ආසාවෙන් හා බලාපොරොත්තුවෙන් අතර ජීවත් වූ කීප දෙනෙක් මරණයට පත් වූහ. ජීවත්ව සි ජනතාවත් ඒ දිනය ගැන සිහිකරමින් ආසාවෙන් සිටිති. එම ඒ අයුරින් මේ රටේ සාමය ඇති විය යුතු යි යන අදහසින් සා සඳහා වූ උත්සාහයක උතුරේ මුස්ලිම්වරු ඔවුන්ව යාකර ෙ සිටිති. සාම ක්‍රියාදාමය සඳහා මේ රටේ කුමන හෝ ප්‍රදේශ කුමන හෝ වැඩපිලිවෙලක් සිදුවන්නේ නම් ඒ වැඩ පිළිවෙ තමන්ගේ සෑම සහයෝගයක් ම දීමේ තත්ත්වයක අද උ මුස්ලිම්වරු සිටිති. නමුත් ඒ අතර ම මේ සාම ප්‍රයත්නය හ මේ ජනතාවගේ දේශපාලනමය සමාජමය සංස්කෘතිකමය ආරු ද අවශ්‍ය අය ලෙස නිසි දේශපාලන විසඳුම් යෝජනාවක් ය මේ ජනතාව නැවතත් තමන්ගේම දිස්ත්‍රික්කයේ තමන්ගේම පද ජීවත්විය යුතු යි යන අදහසින් බලාපොරොත්තු තබා ෙ සිටිති.

පිටමං කිරීමට පෙර මේ ජනතාව ද්‍රවිඩ ජනතාව ා එක්සත් ව, සමගියෙන් ජීවත්වූහ. නමුත් කේවල් කරගෙන නොවූහ. එමෙන් ම නැවතත් මේ ජනතාව තමන්ගේම භූමියට විට ඔවුහු තමන්ගේ ඇතැම් කටයුතු පිළිබඳ නිසි ස්ථාව කොටින් ගෙනුත් අනෙකුත් පක්ෂ වලිනුත් රජයෙනුත් අපෙ කරති. ඒ අයුරින් මේ රටේ ජනවාර්ගික ප්‍රශ්නය විසඳීම ෘ තේරීම් කාරක සභාවක් ඇති කළ මොහොතේ උ මුස්ලිම්වරුන්ගේ අපේක්ෂා යටතේ උතුරේ මුස්ලිම්වරුන්ගේ ඡ දීමට සුදුසුකම් තිබෙන 18,000 ක් දෙනාගේ අත්සන් සමග වි යෝජනා උතුරේ මුස්ලිම්වරුන්ගේ අයිතිවාසිකම් සඳහාවූ සංවිධ සූදානම් කළේ ය. එය මේ රටේ ජනාධිපතිටත් තේරීම් ා

සභාවටත් සියලු දේශපාලන පක්ෂවලටත් අපි ඉදිරිපත් කෙළෙමු. ඉදිරිපත් කිරීමේදී ලිපියක් ද ඒ සමග යා කෙළෙමු. "කරුණු දෙකක් සම්බන්ධයෙන් ඔබ සමග සාකච්ඡා කිරීමට කැමැත්තෙමු, ඒ සඳහා වූ අවස්ථාවක් අපට දෙන්න" යැයි ඉල්ලා සිටියෙමු. මෙහි කණගාටුදායක සිද්ධිය ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. කිසිම දේශපාලන පක්ෂයක් වෙතින් අපට පිළිතුරක් ලැබුනේ නැත.

මීට පසු ව අපිට උත්සාහ කරමින් මොවුන් හමුවීමේ උත්සාහයන්හි නිතර වීමු. ඒ අනුව ද්‍රවිඩ විමුක්ති පෙරමුණ සමහත් ලංකා කම්කරු කොංග්‍රසය සමහත් අපි මේ සම්බන්ධයෙන් කථා කර ඇත්තෙමු. ඒ සමහ ඊළම් ජනතා ප්‍රජාතාන්ත්‍රික පක්ෂය සමගත් අද මේවා සාකච්ඡා කොට ඇත්තෙමු. ඔවුහු අපගේ මේ සාධාරණ ඉල්ලීම් පිලිගෙන ඒවා ලබා දීම සඳහා තම පක්ෂ උත්සාහ ගනු ඇතැයි කීහ. නමුත් මේ පිළිබඳ ව කථා කිරීමට ප්ලොට් සංවිධානයට අප ලිපි යවා තිබුණත් ඔවුන්ගෙන් කිසිම පිළිතුරක් ලැබුනේ නැත. මුස්ලිම්වරුන් උතුරෙන් පිටකරන ලද අවස්ථාවේ අනුකම්පා කළ ද්‍රවිඩ ජනතාව වැඩිපුර සිටිති. දේශපාලන පක්ෂ පවා මේ පිළිබඳව ඒ මොහොතේ නිසි ස්ථාවරයක් ගත් බවක් අපට පෙනුනේ නැත. පසු කාලයේ දී ඇතැම් දේශපාලන පක්ෂ පවා මේ පිළිබඳ ව ඇතැම් කරුණු සාකච්ඡා කොට ඇත. මෙසේ තිබියදී පවා උතුරේ මුස්ලිම් වරුන් ඔවුන්ගේ පසුගිය ඉතිහාසයේ ද්‍රවිඩ හිතිකාව සමග එක්සත් වූ දේශපාලන ප්‍රවනතාවකින් සිටි නිසා ඒ අනුව මේ දේශපාලන පක්ෂ මුස්ලිම්වරුන්ගේ සාධාරණ ඉල්ලීම් පිළිබඳ දැනගැනීම සඳහා ඔවුන් හමුවීමට අවස්ථාවක් දී තිබිය යුතු ය. අපි ගෞරව කළත් අප සමහ සාකච්ඡා කිරීමට ඉදිරිපත් නොවුනේ ඇයි දැයි අපට තවම තේරුම්ගත නොහැකි ය. එසේ වුවත් අපගේ උත්සාහය අපි ඉදිරියට ම ගෙනයන්නෙමු. ඒ අනුව මේ සාම ප්‍රයත්නය යනු දේශපාලන විසඳුමක ස්වරූපයෙන් පැමිණිය යුත්තකි. එහි දී උතුරේ මුස්ලිම්වරුන්ගේ අභිලාෂයන් ද සැළකිල්ලට ගත යුතුය යන්න මුස්ලිම්වරුන්ගේ අපේක්ෂාව වී තිබේ. ඒ අනුව මේ සාම

ප්‍රයත්නයේ දී සියලු දේශපාලන පක්ෂද කුමන හෝ අයුරකින් ඔවුන්ගේ ම පොදු වැඩ පිළිවෙළක් සකස් කර අපගේ අයිතිවාසිකම් වලට හානියක් නොවන ආකාරයෙන් සාමය ස්ථාපිත කළ හැකිය යන අදහසින් පොදු වැඩ පිළිවෙළක් යටතට පැමිණිය යුතු ය.

# සාකච්ඡාව

**ප්‍රශ්නය :** කේ. දේවදාසන් මහතා.

සාමය ලංකාවේ ප්‍රධාන මාතෘකාවකි. නමුත් සාමය යන්න උතුරු නැගෙනහිර පලාතට සම්බන්ධ ප්‍රශ්නයක් පමණක් නොවේ. සිංහල ජනතාව අතරත් යුද්ධ සිදුවෙන්නේ ය. රජයත් සිංහල ජනතාවත් අතර ගැටුම් පවතී. රජයත් කම්කරු පංතියක් අතර ද ගැටුම් පවතී. රජයත් ගොවියෝත් අතර ද සටන් පවතී. මේ හැම දේට ම සාමය අදාළ ය. මේ හැම දේට ම සුළු ජාතීන් තම අදහස් නොදක්විය යුතු ද?

කුමාර් පොන්නම්බලම් මහතාගෙන් අසන්න කැමති යි. උතුරු නැගෙනහිර ප්‍රශ්නයට විසඳුම සඳහා යෝජනා කරන්නේ කුමක් ද? පහරදී අවසානයට පැමිණීම ද? නැත්නම් සහයෝගයෙන් එනම් ප්‍රධාන ජාතීන් දෙකට අයත් පක්ෂ දෙක සමග සාකච්ඡාකර ප්‍රශ්නය විසඳීම ද? මේ දෙක හැර වෙනත් කිසි ම මාර්ගයක් නැතැයි ස්ථිර ව ඔබ විශ්වාස කරන්නේද?

**පිළිතුර :** කුමාර් පොන්නම්බලම් මහතා.

ද්‍රවිඩ ජාතික ජනවර්ගයේ අභිලාෂයන් යටතේ සාම විසඳුමකට එළඹිය හැකිය. පළමුව සිංහල ජාතික ජනවර්ගය නියෝජනය කරන සියලු සිංහල පක්ෂවල (විශේෂයෙන් S.L.F.P., U.N.P., M.E.P., J.V.P., L.S.S.P., C.P.N.L.F., D.U.N.L.F.) නියෝජිතයිනුත් තිම්පු න්‍යායන් පිළිබඳව ඔවුන්ගේ ස්ථාවරය ස්ථිර ව, අවසානව ප්‍රකාශ කළ යුතු යි. ඒ පදනම යටතේ තිම්පු

න්‍යායන් සම්බන්ධයෙන් නිර්මාණශීලී ස්ථාවරයකට පැමිණියහොත් එනම් න්‍යායන් 1 ක් හෝ 2 ක් හෝ 3 ක් හෝ න්‍යායන් 4 න් කිහිපයක් පිළිගැනීමට ඉදිරිපත් වුවහොත් එය සාධාරණ ස්ථාවරයක් දැයි අද ලේ වගුරුවමින් ජීවිත පූජාවෙන් සිටින ඒ සංවිධානයට තීරණය කිරීමට අයිතිය තිබෙන්නේ ය. ඔවුන් කියන අයුරින් සාකච්ඡාවලට යෑමෙදී තේරුමක් තිබෙන්නේ ද? නැද් ද? එසේ තේරුමක් නැතැ යි ඔවුන්ට පෙනුනොත් මේ ද්‍රවිඩ ජාතික ජනවර්ගයේ ප්‍රශ්නය සාකච්ඡා මගින් විසඳන්න පුළුවන් වෙතැ යි මා සිතන්නේ නැත. නමුත් තිම්පු න්‍යායන් ගෙන් කිහිපයක් සිංහල ජාතික ජනවර්ගය පිලිගැනීමට සූදානම් නම් සාකච්ඡාවට ගොස් සම්පූර්ණයෙන් පිලිගැනීම සඳහා උත්සාහ කළ හැකි ය. එය යම් නිශ්චිත දේශපාලන ලේඛණයක අන්තර්ගත කළ යුතු යි. එය ප්‍රායෝගික වුවහොත් දෙවන අදියරයේ දී තිම්පු න්‍යායන් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා වූ නීති රීති හා ද්‍රවිඩ ජාතික ජනවර්ගය නිදහසේ තම ජීවිතය කර ගෙන යෑමට අවශ්‍ය කරන සැලසුම් සූදානම් කළ යුතු ය. මෙයත් සාර්ථක නොවූ විට මේ යුද්ධය දිගටම පැවතිය යුතු යි. ආයුධ ඔසවන අයට කැලෑවට ගොස් ආයුධ එසවිය හැකි යි. වෙනත් ආකාරයට තමන්ගේ දායකත්වය දිය හැකි ද්‍රවිඩයන්ට එසේ කළ හැකි ය.

**ප්‍රශ්නය :** එස්. කවරාජා මහතා.

ද්‍රවිඩ ඊළම් එකම මාර්ගය යැයි කථා කළ කුමාර් පොන්නම්බලම් මහතාගෙන් තවත් ප්‍රශ්නයක් මම අසමි. ශ්‍රී ලංකා ආණ්ඩුව ව්‍යවස්ථාවේ 6 වන සංශෝධනයට අනුව ලංකාව ඒකීය රටකි. ඒකීය පාලනයක් ඇති රටකි. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මම පිළිගනිම්'යි ප්‍රතිඥා දී ඔබ ඔබගේ රැකියාවේ නියැලී සිටිනවා නේ ද? මෙය සාධාරණ ක්‍රියාවක් ද? (රුස්ව සිටින්නන්ගේ අත්පොළොසන් හඬ)

**පිළිතුර :** කුමාර් පොන්නම්බලම් මහතා.

මෙහි සිට ද්‍රවිඩ ජාතික ජනවර්ගයේ අභිලාෂයන් සුළඟේ පා කර තිබෙන ඇතැම් කණ්ඩායම් මෙහි අත්පොළොසන් දී සතුටු වෙති. ඔවුන්ගේ ඒ අත්පොළොසන් හඬෙහි මට කිසිම බියක් නැත. නමුත් මා ප්‍රතිඥා දුන්නේ ඇයි? එය මාගේ රැකියාව කිරීමට යි. අද පීඩා විඳිමින් සිටින ද්‍රවිඩ තරුණයින් ගේ නිදහස හා තමන්ගේ ජීවිත ආරක්ෂා කරගෙන සිටින්නන්ගෙන් මා ද කෙනෙකු බව ඔබ අමතක නොකළ යුතුයි. (නැවැත අත්පොළොසන් හඬ) ව්‍යාජ අත්පොළොසන් හඬ දී මාව නම්මා ගැනීමට උත්සාහ කිරීමට ඉඩ නොදෙන බව මෙම සතුරන්ගේ ගුහාවේ සිටිමින් ද්‍රවිඩ සතුරන්ට ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. එම නිසා කරුණාකර මාව නම්මාගන්න උත්සාහ නොකරන්න. ඔබලා ඔබලා විසින් ම ශුද්ධ කරගන්නැ යි මම ප්‍රසිද්ධියේ ප්‍රකාශකරමි.

සිවගුරුනාදන් මහතා.

තනි පුද්ගලයෙක් එල්ල කරගෙන ප්‍රශ්න ඇසීම නුසුදුසු බව මම හිතමි. කුමාර් පොන්නම්බලම් මහතා අපගේ අදහස් වලට පටහැනි අදහස් දරමින් සිටිය ද මේ සභාවට පැමිණ තම අදහස් ඉදිරිපත් කිරීමට ඔහු එකඟ වී සිටී. අප ඔහුට ගරු කළ යුතු යි.

**ප්‍රශ්නය :** නවීස් (උතුරු පළාතෙන් පිටමං කරන ලද මුස්ලිම්වරුන්ගෙන් කෙනෙක්).

පොන්නම්බලම් මහතා දැන් තිම්පු න්‍යායයන්ට සහයෝගය දෙන්නේ ය. මුස්ලිම්වරු 90 වසරේ පිටමංකළාට පසුව කිසිම අයිතිවාසිකමක් නැතිව ජීවත්වෙති. එහෙත් තිම්පු න්‍යායන්හි මුස්ලිම්වරුන් ගැන කිසිවක් සඳහන් වී නැත. එය ක්‍රියාත්මක කරනු ලබන්නේ නම් මේ මුස්ලිම්වරුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව

යමක් ඔබට කිව හැකි ද? එනම් තිම්පු න්‍යායයක් පිළිබඳ කරුණු ඉදිරිපත් කළාට පසුව මුස්ලිම්වරුන් පිටමං කරනු ලැබ ඇත. තිම්පු න්‍යායයන් ක්‍රියාවට නගන්නේ නම් ඒ මුස්ලිම්වරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ ඔබට සහතික විය හැකි ද?

**පිළිතුර :** කුමාර් පොන්නම්බලම්.

මා තිම්පු න්‍යායයන් බිහි කළ අයෙක් නොවේ. මා හැර එය බිහි කළ අය සියල්ලම මේ වේදිකාවේ අසුන්ගෙන සිටිති. නමුත් අද එයට සම්පූර්ණයෙන් සහයෝගය දක්වමි. ඊට හේතුව එය ද්‍රවිඩ ජනතාවගේ ද්‍රවිඩ ජාතිකත්වයේ අභිලාෂයන් පිළිඹිබු කරන බැවිනි. නමුත් තිම්පු න්‍යායයන්හි මුස්ලිම් ජනතාව සැලකිල්ලට ගෙන නැත. මුස්ලිම් ජනතාව උතුරු පළාතෙන් පිටමං කිරීම ඕනෑම ද්‍රවිඩයෙකුට කණගාටුවක් හා අතෘප්තියක් ගෙන දෙන්නේ ය. අද යම් කෙනෙක් මුස්ලිම් ජනතාව ඔවුන්ගේ උතුරු පළාත් මව් බිමෙන් පිටමං කළේ ද ඔවුහු ප්‍රසිද්ධියේ සහ ලිඛිතව මුස්ලිම් ජනතාවගෙන් සමාව ඉල්ලා ඉතා සීඝ්‍රයෙන් ඒ ද්‍රවිඩ මව් බිමට මුස්ලිම් ජනතාව කැඳවනු ඇත යන පොරොන්දුව ඔවුන් දී ඇත. ඔවුන් ඒ පෙරොන්දුව දී තිබෙන්නේ නම් මගෙන් ඒ ගැන අසා පලක් නොමැත.

**ප්‍රශ්නය :** මහාචාර්ය සී. සිවසේකරම් මහතා.
කාට ද දුන්නෙ?

**පිළිතුර :** කුමාර් පොන්නම්බලම්.

මුස්ලිම් ජනතාවට, කොටින් ප්‍රසිද්ධියේ මුස්ලිම් ජනතාවට ඒ පෙරොන්දුව දුන්නා විතරක් නොවේ ප්‍රසිද්ධියේ සමාව ද ඉල්ලා ඇත.

**ප්‍රශ්නය :** මව්ලවි සුපියාන් (උතුරේ මුස්ලිම්වරුන්ගේ අයිතිවාසිකම් සඳහා වූ සංවිධානය).

ඔවුන් කොටි නියෝජිතයින් හමු වී ප්‍රශ්න ඇසීමේ දී එය වැරදි යැයි ඔවුන්ගේ කණගාටුව ප්‍රකාශ කළා මිසක් මෙතෙක් පිටමං වූ මුස්ලිම්වරුන්ට නැත්නම් මුස්ලිම්වරුන් නියෝජනය කරන සංවිධානවලට කිසිම අදහසක් කොටි සංවිධාන විසින් ඉදිරිපත් කර නැත. කොටි සංවිධානයට නිල වශයෙන් මේ පිළිබඳ ලිපිද යවනු ලැබ ඇත. ඉල්ලීම් ද යවනු ලැබ ඇත. මේ පිළිබඳ කිසි ම පිළිතුරක් සංවිධානවලට හෝ ආයතනවලට ලැබුණේ නැත. මෙය පුවත්පත්වලට දුන් ප්‍රවෘත්තියකි. බැරෑරුම් ලෙස පිටමං කරන ලද සමාජය එය විශ්වාසනීය ප්‍රවෘත්තියක් ලෙස විශ්වාස කරගෙන සිටිය නොහැක. මුස්ලිම්වරුන්ව පිටමං කළ කොටි මුස්ලිම්වරුන් නියෝජනය කරන ජනතාව ගෙන් කෙලින් ම සමාව ඉල්ලා ඔවුන්ට ඔවුන්ගේ ම ස්ථානවල සිටිය හැකි සම්පූර්ණ සහතික ය ද ආරක්ෂාව ද අයිතිවාසිකම් ද පිළිබඳ නිසි සහතිකයක් නොදෙන තාක් එය පිළිගැනීමට මුස්ලිම් ප්‍රජාව සූදානම් නැත. පුවත්පත් වලට දෙන සම්මුඛ සාකච්ඡා බොහොමයක් බොරු වී ඇත.

**පිළිතුර :** කුමාර් පොන්නම්බලම්.

ඔබ කියන්නේ හානියට පත් මුස්ලිම් සංවිධානවලට ඒ ගැන පුද්ගලික ව කිව යුතුයි කියා නේද?

**ප්‍රශ්නය :** මව්ලවි සුපියාන්.

මෙතෙක් කිව්වේ නැත. හානියට පත් සමාජය වෙනුවෙන් නිල වශයෙන් ද ලිඛිතවද යවනු ලැබ තිබේ. නිසි ලෙස ලිඛිත ව හෝ වෙනත් මාර්ගයකින් අපට පිළිතුරු ලැබුනේ නැත. ජනමාධ්‍යකරුවන්ට දුන් පිළිතුරක් පමණයි. කොටි සංවිධානය සමහර විට ප්‍රශ්නයෙන් බේරීමටද එසේ කිරීමට ඉඩ ඇත.

**පිළිතුර :** කුමාර පොන්නම්බලම්.

මොහුගේ අදහස පිළිගනිමි. ඒ පිළිබඳ ව කාරුණික ව මැදිහත් වීමට උත්සාහ කරමි.

**ප්‍රශ්නය :** පරාකුරන් මහතා.

අද වැනි වකවානුවක අපි ද්‍රවිඩ ජනතාව වශයෙන් යම් තාක් දුරට අපගේ හෘදසාක්ෂියේ හඬ ලෙස නොයෙක් වේදිකාවල අපට නොලැබුණු අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් අපගේ හඬ වශයෙන් අසන්නට ලැබෙන්නේ කුමාර් පොන්නම්බලම් මහතාගේ හඬ පමණයි.

නමුත් ඔහු අවසානයේ දී ද්‍රවිඩ ඊළම ගැන කථා කිරීමේ දී ඔහුගේ අදහස කොටින්ට පක්ෂ වෙමින් සලකා ඇතැම් විට මුළුමනින් ම ජාතිවාදී වන අවස්ථාද තිබෙන්නේ ය. මෑතක පෙන්වූ රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවේ දී ද්‍රවිඩ ඊළම නැමැති ප්‍රතිපත්තිය ප්‍රසිද්ධියේ අවධාරණය කිරීමේ දී අප වෙනුවෙන් නැගෙන ඔහුගේ හඬ දුර්වල වී යන්නේ ය. එම නිසා අපගේ හෘද සාක්ෂිය වශයෙන් හඬ දෙන විට ද්‍රවිඩ ඊළමට ඇති කැමැත්තෙහි තීව්‍ර බව අඩු කළොත් වඩාත් හොඳ ය. ඊට හේතුව දැන් ඔහුගේ හඬ තුළ අපගේ හෘද සාක්ෂිය ද හඬ දීම යි. ද්‍රවිඩ ඊළමෙන් අවසන් කිරීම මඳක් අතහැරියොත් අපට තව ටිකක් බලය වැඩියෙන් ලැබේවි. ජාත්‍යන්තර ප්‍රජාවේ පවා ද්‍රවිඩ ඊළම් යයි ඔබ පවසන විට කොටින් ගේ ආධාරකරුවෙක් යැයි සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප වන අවස්ථා ද ඇත්තේ ය. මා T.N.L. රූපවාහිනියේ වැඩ කළ කාලයේ ලැබූ අත්දැකීම් අනුව මෙවැනි අදහස් නිසා ඔහු සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනු ලැබ තිබේ.

ද්‍රවිඩ ඊළම දැඩි ලෙස අල්ලාගෙන ලේ තිලක ලබාගත් අය පවා දැන් අත්හැර දමමින් සිටිති. ද්‍රවිඩ ඊළමට මුදු ගත් අය සහ

මුදල් ගත් අය දැන් ඒවා අත්හැර දමා සිටිති. කලින් ද්‍රවිඩ ඊළම වෙනුවෙන් බදු ගත් අය දැන් ද්‍රවිඩ ඊළමට එරෙහිව බදු ලබාගනිති. මින් පසුව සාමය ගැන හිතුවොත් අපට සාමයෙහි විශ්වාසයක් නැත. චන්ද්‍රිකා මැතිණිය බලයට පත් වන ඒ ගැන විශ්වාසය තිබුණි. මාස දෙක තුනක් ගිය පසු ඒ විශ්වාසයද බිඳී ගියේ ය. ඊට හේතුව පරිසරය, පදිංචිකරවීම, අධ්‍යාපනය යනාදිය සම්බන්ධයෙන් අපට අති ප්‍රශ්න යි. විසඳුම පැමිණියත් මේ කරුණුවල වෙනසක් ඇති නොවේ. පදිංචිකරවීම පිළිබඳ මේ වනවිට මඳක් වෙනස්ව ප්‍රකාශ කර තිබේ. උසස් අධ්‍යාපනය ගෙන ඒම සඳහා ස්ථාවරයක් නැත. ඊට හේතුව උසස් උධ්‍යාපනය මධ්‍යම මට්ටමිනුයි ඇත්තේ. පරිසරයද වෙනස් වන එකක් නැත. එය ද ඔවුන්ගේ යටතෙහි තිබෙනු ඇත.

සිවසිදම්බරම් මහතා බලයට පැමිණි විට රූපවාහිනී සාකච්ඡාවකදී මේ ප්‍රශ්නය අප ඔහුගෙන් අසන විට ඔහු කෝපයට පත්විය. අද අප දෙයාකිරයකින් හානියට පත්වන්නෙමු. රජය, ආයතනවල ක්‍රියාකාරීත්වය සහ හමුදා ක්‍රියාකාරීත්වය නිසා ය. හමුදා ක්‍රියාකාරීත්වය අවසන් කිරීම ඔවුන්ට ප්‍රායෝගික නොවේ. ඊට හේතුව කොටින් පහර දෙන නිසා ඔවුහු පහර දෙති. කොටින් පහර දෙන්න ආරම්භ කළේ මොවුන්ගේ පහරදීමට විරුද්ධ ව යි. ඔවුන්ට පිළිතුරු දීමට සූදානම් වූ අය ඉතිරි වී ඇත. ආයුධ තබාගෙන අපට ප්‍රතිප්‍රහාර එල්ල කරති. අප කිසිම ආයුධයක් නැති අය යි. වවුනියාවට ඉඩමක් මිළදී ගැනීමට යන්න සූදානම් වූ විට එහි සිට කිව්වේ 'මෙහාට එන්න එපා' මොවුන්ගේ ප්‍රචන්ඩත්වය ඉතාම දරුණු යි. මේ තත්වය යටතේ අපගේ සාමය යනු අපේ රජයක් සහ අපේ හමුදාවකි. ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය අවසන් කළත් අපගේ අය තම ක්‍රියාකාරීත්වය අවසන් කරන එකක් නැත. මොවුන් ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය නවත්වා සාමයට පැමිණියත් අප නිදහස් ව සැරිසරන විට නිදහස්ව වෙළඳ කටයුතු වල නියැලෙන විට සුදු වෑන් රථවලින් පැමිණ අපේ අය පැහැර ගෙන යති.

මේ තත්වයේදී තිම්පු න්‍යායයන් පිලිගනු ඇතැයි කීම සිනහවට කරුණකි. නැත්නම් මොවුන්ගේ යෝජනාවලිය ගෙන ඒමද ප්‍රායෝගික නොවන්නේය. අර්ධ සාමයක් අප ළඟා කර ගැනීම සඳහා අපේ අය නිසි ලෙස සංශෝධනය වුණොත් හොඳ ය.

**ප්‍රශ්නය :** කේ. දේවදාසන් මහතා.

කුමාර් පොන්නම්බලම් මහතාගේ කථාව සම්බන්ධයෙනුයි මගේ ප්‍රශ්නය. පාරේ අලවා තිබූ පෝස්ටර් බැලුවෙමි. එහි සාම ක්‍රියාදාමය හා සුළු ජාතික පක්ෂ යැයි තිබුණි. මේ දෙකටම කුමන සම්බන්ධතාවක් ද? කිසිම සම්බන්ධතාවක් නැත. මේ දක්වා තිබුණේ ද නැත. මීට පසුවත් තිබෙන එකක් නැත. ලංකා දූපතේ රටක් යනුවෙන් ඉරි ඇඳීම අපකළ දෙයක් නොවේ. යමෙක් තමන්ගේ වාසියට යොදා ගත් දෙයක්. මෙය ජනතාවට එරෙහි වූ ඉරක්. ලංකාවේ සිංහලයින්ට එරෙහි වූ ඉරක්. දමිළයින්ට එරෙහි වූ ඉරක්. මුස්ලිම්වරුන්ට එරෙහි වූ ඉරක්. ඒ ඉර තබා ගෙන දේශපාලනය කරමින් සිටින්නෙමු. මෙය ප්‍රථම ප්‍රශ්නය කව්රුහෝ සුළු පිරිසක් වන අය මේ රට සූරා කෑම සඳහා යොදන ලද ඉරක්.

දමිළයින්ගෙන් දමිළයින්ගේ ප්‍රශ්නය විසඳීමට යන එකකුත් නෑ. සිංහලයින්ගෙන් සිංහලයිනගේ ප්‍රශ්නය විසදෙන්නෙත් නෑ. මුස්ලිම්වරුන්ගෙන් මුස්ලිම්වරුන්ගේ ප්‍රශ්නය විසදෙන්නෙත් නෑ. එසේ නම් මෙයින් පැහැදිලිවන්නේ කුමක් ද? තනි ජනවර්ගයක් විසින් තම වර්ගයාගේ ප්‍රශ්නය විසඳන්නට බැරි ය. ඊළඟ පියවර කුමක් ද? මෙය නොකියාම පැහැදිලිය. ජනවර්ග තුනම එකතු වී මෙනි. ඒ කොහොම ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකත්වය ලැබීම මගින්ද නැත්නම් වෙනත් කුමන මාර්ගවලින් ද? ශ්‍රී. ල. නි. පය හා එ. ජා.ප.ය එකම වේදිකාවක එකතු කර අප ද්‍රවිඩයන් වන පිරිසක් ඔවුන් සමග සාකච්ඡා කිරීමෙන් කළ හැකි ද? බැරිය. අවුරුදු 50ක් තිස්සේ සිදු වුණේ කුමක් ද? කුමක් හෝ

කරන්න තිබුණා නේ ද? අවුරුදු 50ක් යනු සාමාන්‍ය කාලයක් ද? 50,000 කටත් වඩා අධික පිරිසක් ඝාතනයට ලක්වූ කාලයකි. මෙරටට දෙවන නිදහසක් අවශ්‍ය යුගයක් එළඹ තිබේ. එය කුමක් ද? එදා සුද්දාගෙන් ලබාගත් නිදහස අද පෞද්ගලීකරණය යන නමින් සුද්දටම ආපසු දෙමින් සිටිමු.

නිදහස කොහේ ද? උතුරු නැගෙනහිරට නිදහස ලබා දීම ගැන කථා කරමින් සිටිමු. ඒ අතරතුර විදේශිකයා පැමිණ රටේ සාරය උදුරාගෙන යන්නේය. වේදිකාවේ කථා කරන අය පෞද්ගලීකරණයට එරෙහිව කථා කරයි ද? පෞද්ගලීකරණයට එරෙහි පාර්ලිමේන්තු යෝජනාවට අත් ඔසවයි ද?

මා මේ රටේ පුරවැසියෙක් නොවේ යැයි පොලිස් ලියාපදිංචිය මගින් රජය මට සහතික කර දී තිබෙන්නේ ය. එසේ නම් මම කවි ද? මෙය රැගෙන මම සැරිසැරුවේ නැත්නම් මම වැරදිකාරයෙකි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ කීප විටක් වුව ද අත්අඩංගුවට ගත හැකිය. එසේ නම් කොහේ ද නිදහස? ඔබ කථා කරන සාමය මෙය තුළින් ලබා ගත හැකි ද? මෙය ඉරා විසිකර දැමිය යුතු යි. මම ඉරන්නටයි යන්නේ. ඒ සඳහා තමයි හිස බූ ගාල තියෙන්නේ. ඉක්මනින් මම සංවිධානයක් ආරම්භ කිරීමට සූදානම් වෙමි. මෙම පොලිස් වාර්තාව ඉරා විසි කළ යුතු යි. මේ රටේ ලියාපදිංචි කොළය නොතිබිය යුතු යි. මෙයට සූදානම් වූවොත් සාමය ලැබෙයි. නිදහස ලැබෙයි. සියල්ල ම ලැබෙ යි.

මුලසුන සිවගුරුනාදන් මහතා.

අද පවතින උණුසුම් තත්ත්වය අනුව සභාවේ රැස්ව සිටින්නන් අදහස් දැක්වීමේ දී හැඟීම් බර ව තිබිය හැක. නමුත් මෙම සාකච්ඡාවේ දී තම අදහස් කරන අය යම් සන්සුන් ස්වරයක් ඇති කරගත යුතු වේ. එමනිසා ඉවසීමෙන් හා කෙටියෙන් කරුණු ඉදිරිපත් කරන්න.

**අදහස් :** සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් (නායක ඊ.පී.ආර්.එල්.එෆ්.).

ඔබ මෙහි බැලුවේ නම් අව ම මට්ටමේ හෝ ප්‍රජාතාන්ත්‍රික පරිසරයක් තිබේ. කුමාර් පොන්නම්බලම් මහතා කථා කරන්නේ ය. එය රස විඳිමින් අත්පොළොසන් ද දෙති. තවත් කීප දෙනෙක් අදහස් දක්වන්නෝය. මිත්‍ර දේවදාසන් දැඩි අදහස් ඉදිරිපත් කරයි. මෙවැනි ප්‍රජාතින්ත්‍රික පරිසරයක් ඇත. අද අපට වැදගත් ම අවශ්‍යතාව උතුරු නැගෙනහිරට ප්‍රජාතාන්ත්‍රික පරිසරයක් ඇති කිරීම යි. එහි සිටින ජනතාවට තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දිය යුතුයි. එම අවස්ථාව ලබා දුන්නොත් පමණයි ඔවුන්ට තිම්පු න්‍යායන් අවශ්‍යද නැත්නම් ජනාධිපති ඉදිරිපත් කළ විසඳුම් අවශ්‍ය ද නැත්නම් එය තවත් සංශෝධනය කළ යුතු ද නැත්නම් ඔවුන් අලුත් අදහස් ඇතිව සිටින්නේද යන කරුණු දැනගැනීමට හැකි වන්නේ. නමුත් මෙහි කථා කළ අයගේ අදහස් අනුව නම් එහි එම පරිසරය ඇති කිරීමට තරම් සුදුසු තත්ත්වයක් නැත. ඊට හේතුව මෙවැනි ප්‍රජාතාන්ත්‍රික රැස්වීම්වල කථා කිරීමේ දී පවා ඇතැම්විට අප නොදැනුවත් ව ම බියකින් කථා කරන්නට සිදු වී තිබීම යි. අප කථා කළොත් අපගේ ජීවිතයට විපතක් පැමිණේද යන හැඟීමක් දිගටම පවතින්නේ ය. එම නිසා එය වෙනස් කළ යුතු යැයි මම විශ්වාස කරමි.

සාමකාමී පරිසරයක් ඇතිකිරීම වෙනුවෙන් එක් එක් අය වෙන වෙනම අදහසක් ඉදිරිපත් කළ හ. "ද්‍රවිඩ ඊළම අවසාන විසඳුම, නැත්නම් මම නැවතත් ද්‍රවිඩ ඊළම සඳහා සටන් කළ යුතු තත්වයක් ඇතිවෙයි", මෙවැනි නොයෙකුත් අදහස් ඉදිරිපත් වූ දහස් දෙනෙකුට අදහස් දහසක් තිබිය හැකිය. වරදක් නැත. නමුත් අද ඇති තත්ත්වය වටහා ගෙන කටයුතු කළ යුතු වේ.

පසුගිය මහාවීර දිනයේදී ප්‍රභාකරන් මහතා කිව්වේ "ලක්ෂ 8 1/2 ක් වන ජනතාව සරණාගතයින් වශයෙන් මේ රටින් පිටවී ඇති බව යි. ආසන්න වශයෙන් 75,000 - 100,000 ක් අතර ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාව ජීවිතක්ෂයට පත් වී ඇත. අද මෙහි

ලක්ෂ 35 ක් වන ජනතාව සඳහා ද්‍රවිඩ ඊළම ඉල්ලා සිටියෙමු. මුස්ලිම් ජනතාව සහ ද්‍රවිඩ ඊළම අතර කිසිම සම්බන්ධතාවයක් නැත. ඊට හේතුව තනි පළාතක් ඔවුන් ඉල්ලා සිටීම යි. කඳුකර ජනතාවට ද නොයෙක් ප්‍රශ්න තිබේ. උතුරු-නැගෙනහිර ජනගහනය 51 වසරේ සංගණනය අනුව ලක්ෂ 18 ක්ව තිබුණි. අද ලක්ෂ 8 1/2ක් විදේශ රටවල ය. ලක්ෂයක් ජීවිතක්ෂයට පත්වී තිබේ. යාපන අර්ධද්වීපයේ ලක්ෂ 9 සිට 10 දක්වා සිටි ජනතාව දැන් ලක්ෂ 4.25 ක් වී ඇත. එම නිසා තවත් අවුරුදු 5 ක් 10 ක් මේ යුද්ධය පවතින්නේ නම් මේ ලක්ෂය 4 1/4 තව කොපමණ අඩුවේ ද?

සාමය කාට ද අවශ්‍යවන්නේ? අපට අවශ්‍ය යි. ඒ සාමය ඇති කිරීමේ වගකීම හා බැඳීම කාට ද තියෙන්නේ? ද්‍රවිඩ ජනතාව වෙනුවෙන් යැයි කියා යුද්ධ කරන අයට තිබෙන්නේ ය. අප රජයේ කුමන්ත්‍රණ දැලට අසු නොවිය යුතු යි. එනම් මේ යුද්ධය කොපමණ දීර්ඝ ව සිදුවන්නේ ද එතරම් කාලයකට මේ ද්‍රවිඩ ජනතාව ගණන් නොගත යුතු තරම් සුළු ජාතික ජනවර්ගයක් ලෙස වෙනස් වනු ඇතැයි කීම සත්‍ය හා යථාර්ථවාදී දෙයකි. තවත් අවුරුදු 5ක් හෝ 10ක් මේ යුද්ධය දිගටම පවතින්නේ නම් අප උතුරු නැගෙනහිර ඒකාබද්ධ කිරීම ඉල්ලා සිටීමෙහි තේරුමක් නැත. යාපනයට ස්වයං පාලනය ඉල්ලා සිටිය නොහැකි තත්ත්වයක් උදා වේ. ද්‍රවිඩ ජනතාව වෙනුවෙන් යැයි යුද්ධ කරන අය මෙය මුලින් සිතේ තබාගත යුතු යි. දෙවනුව රජයට තමාගේ ප්‍රතිපත්තියේ සිට ඉවත් නොවී සිටින කොටින්ට බලපෑම් කිරීමට සාකච්ඡා මාර්ගයකට පෙළඹවීම සඳහා ඇත්ත වශයෙන්ම උතුරු-නැගෙනහිර ප්‍රජාතන්ත්‍රවාදය වැදගත් වේ. සටන තවත් විදිහකට වෙනස් කළ යුතු යි. එනම් ජනතා සටනක් වශයෙන් කොටින්ටත් රජයටත් බලපෑම් කරන අයුරින් මෙම සටන වෙනස් කළ යුතු යි. ඒ සටන වෙනස් කළ යුතු නම් මූලික අවශ්‍යතාව වන්නේ උතුරු නැගෙනහිර ප්‍රජාතන්ත්‍රවාදය යි. මෙම ප්‍රජාතන්ත්‍රවාදය කොළඹටත්, දකුණටත්, විදේශවලටත් තිබූ පමණින් ප්‍රමාණවත් නොවේ. අපටත් අපගේ ජනතාවටත් එය තිබුණොත් පමණි මෙහි වෙනසක් කළ හැක්කේ.

**අදහස් :** මහාචාර්ය සී සිවසේකරම්.

ද්‍රවිඩ ජාතික ජනවාර්ගික ප්‍රශ්නය බැරෑරුම් තත්ත්වයකට පත්වීමට හේතුව හා මෙයින් මිදීමට බැරි හේතුව වී ඇත්තේ මේ ප්‍රශ්නය අපි ද්‍රවිඩ සිංහල ප්‍රශ්නයක් ලෙස පමණක් අර්ථ නිරූපණය කර තිබීම ය. ප්‍රජාව තුළ තිබෙන විෂමතා අප කවදාවත් සැලකිල්ලට ගෙන නැත. එම පොදු ප්‍රශ්න සටන් වශයෙන් පිපිරී ගිය අවස්ථාවේ දී ද්‍රවිඩ ජාතික නායකත්වය ඊට විරුද්ධව කථා කළාක් මිස ඒ ජනතාවගේ සාධාරණත්වය සඳහා හඬ නැගුවේ නැත. මෙය අහඹු සිද්ධියක් ලෙස සැළකුවේ නැත. එමෙන් ම ද්‍රවිඩ භාෂාව කථා කරන ජනවර්ගය කියා කී වෙල්වනායගම් මුස්ලිම් ජනතාවගේ අවශ්‍යතාව හෝ අපේක්ෂාවන් සැලකිල්ලට නො ගත්තේ ය. පසුව 1956 ත්‍රිකුණාමලයෙහි පැවති සමුළුවේ දී ද ඉස්ලාමිකයන් පිළිබඳ ප්‍රශ්නය මතු කෙරිණ. එහි දී එය පිළි ගැනීමට ලක් විය.

ඇත්ත වශයෙන් ම ද්‍රවිඩ ජනතාව යැයි සඳහන් කර සීමා කර ඇත්තේ යම් අවශ්‍යතාවයකට යි. ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාව වශයෙන් ද්‍රවිඩ ජනතාව එක්සත් කිරීම යාපනය කේන්ද්‍ර කොටගත් කරුණක් ලෙස පැවතිණ. මෙය කණගාටුවට කරුණකි. ද්‍රවිඩ කොංග්‍රසයේ යහපත් උත්සාහය නිසා යාපනය හා මඩකලපුව අතර දුරස්ත කිරීම් නැති කිරීමට මදක් උපකාරී විය. කුමන මට්ටමක ජාතිකවාදයක් වුව ද අප අපගේ පරිසරයට හා පහසුකම්වලට අදාල වන පරිදි සීමා කරගත හැකි ලෙස තිබීම මිසක් ස්වාධීන වූ ජාතිකවාදය කියා දෙයක් නැත. එය ඓතිහාසික පරිසරය මගින් බිහිවන්නකි. විශේෂයෙන් ම කඳුකර ද්‍රවිඩයින් පිළිබඳ කිසි විටෙක අපගේ දේශපාලන ඇගයීම් තිබුනේ නැත. එමෙන් ම අවතැන් ගතවූ මුස්ලිම්වරුන් වෙනුවෙන් හඬක් නැගෙන තුරු ඒ මුස්ලිම්වරුන් ගැන වචනයක් වත් මෙහිදී කථා වුනේ නැත. මෙය සත්‍යයකි. මේ කෝණයෙන් තමයි අප බලන්නේ. නමුත් මෙබඳු රුස්වීම් සංවිධානය කිරීමේදී කැඳවන සියලුම පක්ෂ ද්‍රවිඩ ජාතිකවාදී පක්ෂ යි. වැදගත් වන්නේ හුදෙක් ද්‍රවිඩ ඊළම ඉල්ලනවා ද, බෙදුම්වාදය ඉල්ලනවා ද නැද්ද යන ප්‍රශ්නය නොවේ.

ද්‍රවිඩයින් සැම දෙනාම ද්‍රවිඩ ඊළම වෙනුවෙනුත් ද්‍රවිඩ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙනුත් සටන් කරන අය ලෙසත් සිංහල ජනතාව ද්‍රවිඩයින් මර්දනය කරන්නන් ලෙසත් අර්ථකථනය කිරීම බරපතල වරදකි. අද නොයෙක් පරස්පර විරෝධී අදහස් තිබුණ ද නව සමසමාජ පක්ෂය ද්‍රවිඩ ජනතාව වෙනුවෙන් හඬ නගන පක්ෂයකි. එය සෑහෙන ප්‍රමාණයක සිංහල ජනතාවගේ ද සහයෝගයෙන් රැඳී සිටී. මුළුමනින් ම ද්‍රවිඩ ජනතාවගෙන් සමන්විත මෙ වැනි නව පක්ෂ වලට කඳුකරයේ පිළිගැනීමක් තිබුණි. යාපනයේ ද ඔවුන්ට සෑහෙන තැනක් තිබුණි. දැන් ක්‍රියාකාරීත්වය කෙසේ දැයි මම නොදනිමි. නමුත් ඔවුන් තනිව ද්‍රවිඩ ජනතාවගේ ප්‍රශ්න පමණක් බැලුවේ නැත. ඔවුහු මුළු ලංකාවම දෙස බලති. දේවදාසන් කී පරිදි ම අපි ද්‍රවිඩ සිංහල ප්‍රශ්න ගැන පමණක් කතා කරමින් සිටිමු. ඒ අතර මේ රට මුළුමනින්ම සුද්දන්ට පත්වෙමින් තිබේ. මේ ගැන අප කුමක් කරනවා ද? යන්නේ සුද්දාට උගස් තිබූ ඉඩමේ කුමන කොටසට ද යන්න මිසක් මේ ඉඩම මුළුමනින් ම සුද්දාට උගසට තිබූ ඉඩමය යන්න අපට වැදගත් වී නැත. එහෙත් ඉඩමෙහි වටිනාකමට වඩා දෙගුණයක් තුන් ගුණයක් ගෙවා බේරාගැනීමට යන්නෙමු.

ඊළහට අපි සමාව ඉල්ලා සිටීමෙන් මුස්ලිම්වරුන්ගේ ප්‍රශ්ණයෙන් බේරීමට පුළුවන්කමක් නැත. මෙය සමාව ඉල්ලීමත් සමග අවසන් වන ප්‍රශ්නයක් නොවේ. කවදටත් ද්‍රවිඩ ජනතාවාදය මුස්ලිම්වරුන්ගේ ප්‍රශ්නය දෙස බලා ඇත්තේ මේ ආකාරයෙන් ම ය. එනම් ලංකාවේ විසිරී ජීවත්වන මුස්ලිම්වරුන් ද්‍රවිඩ භාෂාව කථා කරන එකම එක පාපය වෙනුවෙන් ද්‍රවිඩ ජාතිකවාදීන් කියන සැමදේට ම හිස සෙලවිය යුතු යයි බලාපොරොත්තු වීම ඉතාමත් වැරදි ය. මෙ බඳු සංවාදයක දී අප මේ බොකු හට්ටිය තුළ ඉඳීගෙන අශ්වයන් පදින අය තබා ගැනීමෙන් ප්‍රතිඵලයක් නො ලැබේ. ලංකාවේ ජාතික ජනවාර්ගික ප්‍රශ්නය සම්බන්ධයෙන් සත්‍ය අනුකම්පාවක් දක්වන කුමන බලවේගයක් වුවත් ඔවුන් කැඳවා සාකච්ඡා කිරීමෙන් පමණයි අපට සියල්ල කළ හැකි වන්නේ.

එක සිද්ධියක් මතක් කිරීමට කැමැත්තෙමි. වජ්පායි විසින් කියා ඇති මේ දෙය මට කීවේ සිංහල මිතුරකු විසිනි. ද්‍රවිඩ මන්ත්‍රීවරුන් එකතු වී ගොස් සිටි අවස්ථාවක ඔබගේ පාර්ලිමේන්තුවේ ආසන කීයක් තිබෙන්නේ දැයි ඔහු ඇසූවිට මොවුන් පවසා ඇත්තේ මන්ත්‍රීවරුන් කීදෙනෙක් සිටින්නේ දැයි අසන්න' යනුවෙනි. වහා ම ඔහු පවසා ඇත්තේ ඔබට වඩා ආසන දෙගුණයක් තිබේ. එක් කාන්තාවක් මන්ත්‍රීවරුන් 17 දෙනෙක් තියාගෙන මාව අල්ලේ නටවා යක්ෂාවේශ කරන්නීය. මොකද ඔබලාට කරන්න බැරි යනුවෙනි. මෙය ඇත්තක් ද බොරුවක් ද මම නොදනිමි. නමුත් සැලකිය යුතු කාරණයකි.

ප්‍රශ්නය වන්නේ මුස්ලිම්වරුන් ගැන ය. එක් කලෙක ඔවුන් 'තොප්පිය හරවන්නන්' යැයි විහිළු කළහ. දැන් එසේ කී අය හරවන තොප්පි කුමන හිස් මත තිබෙන්නේ දැයි අපි දනිමු. අනෙක දැන් මුස්ලිම්වරුන් වෙනුවෙන් කථා කරන දේශපාලන පක්ෂ දෙකම මෙහි පැමිණියේ නැත. මේ ගැන ටිකක් කල්පනා කර බැලිය යුතු ය. යම්කිසි වර්ගයක යහපත සඳහා පමණක් ක්‍රියාත්මක වන මහාජාතිවාදය, එය ක්‍රිස්තියානීන්ව කොන් කරන්නේ ය. සිංහල කිතුනුවන්ව කොන් කරන්නේය. කතෝලිකයන්ව කොන් කරන්නේ ය. කොන් කරනු ලබන්නේ අප විතරක් නොවේ. මුස්ලිම්වරුන්වද කොන්කරති. අද මුස්ලිම්වරුන්ට එරෙහිව කොතරම් විපත්ති කර හැකිම් මේ රටේ පැතිරී තිබෙන්නේ දැයි අප දන්නේ නැත.

මුස්ලිම් මූලධර්මවාදය යයි කියා ජාත්‍යන්තර වශයෙන් ඇමෙරිකානු අධිරාජ්‍ය වාදය මුස්ලිම්වරුන්ට එරෙහිව දැඩි ප්‍රචාරයක යෙදෙමින් සිටී. එය අප විශ්වාස කරමින් සිටිමු. අපගේ පුවත් පත් දෙස බලන්න. මුස්ලිම් මූලධර්ම වාදය යැයි කීවොත් අප ප්‍රශ්න කරන්නෙ නැත. මේ තත්වයේ දී අපි ද්‍රවිඩයන්, ගැන පමණක් කථා කරමින් සිටියොත් කිසි දේකට විසඳුම් සොයාගත නොහැකි ය. අද ලංකාවේ ජාතික ජනවාර්ගික මර්දනයට අයත්වන

සියලු ප්‍රජාවක් ම ප්‍රදේශයක් නැති ප්‍රජාවක් විය හැක. මූලිකවම ජාතික ජනවර්ග තුන හැරුණු කොට සිංහල ජනතාව අතරේ තිබෙන ආගමික පදනමෙන් කොන්කරනු ලබන නැත්නම් වෙනත් පදනමකින් කොන්කරනු ලබන ප්‍රජාවන්ද ඇතුළත් කර කථා කිරීමට අප සූදානම් නැත්නම් නිදහස දිනාගත නොහැකි ය. මේ දේශපාලනය ද්‍රවිඩ ජනතාව වෙනුවෙන් වූ දේශපාලනයක් නොවේ. වාර්ගික දේශපාලනයකි. මෙම වාර්ගික සංකේත අප වෙනත් ස්ථානවලදී හඳුනාගත හැකි ය.

**ප්‍රශ්නය :** එස්. ප්‍රභාකරන්.

මූලාසනයෙන් විකල්ප අදහස් ඉදිරිපත් කරන ලෙස කියන ලදි. විකල්ප අදහස් ඉදිරිපත් කරන තරමට වාතාවරණය ඇති නොකරන ලදි. මේ ශාලාව තුළ ම විකල්පය ඉදිරිපත් කොට අපට පිටතට යා නොහැකිය. වේදිකාවේ අසුන්ගෙන සිටින අය විකල්ප අදහස් නොව ඔවුන්ගේ පුද්ගලික අදහස් ද ඉදිරිපත් කරති. ඊට හේතුව ඔවුන් රජයේ ආරක්ෂාව සමග සිටින අය වීම ය. නැත්නම් පුද්ගලික ආරක්ෂාව සලසාගෙන සිටින්නන් වීම ය. එම නිසා ඔවුන්ට ඕනෑ ම අදහසක් ඉදිරිපත් කොට පිටතට ගිය හැකි ය. නමුත් අපට එම තත්ත්වය නැත. මේ ශාලාවෙන් පිටතට යන විට අපගෙන් පොලිස් වාර්තාව පිළිබඳ විමසිය හැක. එම නිසා අපගේ විකල්ප අදහස් ඉදිරිපත් කරන තරමට අපට නිදහස ලබා දිය යුතු ය. මේ වාතාවරණය ඇතිකිරීමේදී වැදගත් ප්‍රශ්නය වී තිබෙන්නේ හදිසි නීතිය යි. අද පාර්ලිමේන්තුව නියෝජනය කරන සෑම පක්ෂයකින්ම කීපදෙනෙක් බැගින් වේදිකාවේ අසුන්ගෙන සිටිති. ඔවුන්ට පොරොන්දුවක් දෙන්න පුළුවන් ද? අපගේ විකල්ප අදහස් ඉදිරිපත් කරන තරමට එම වාතාවරණය ඇති කරන තරමට ඊළඟ පාර්ලිමේන්තු රැස්වීම් වාරයේ දී හදිසි නීතියට විරුද්ධව ඡන්දය දිය හැකි ද? එයට සහතික වෙන්න පුළුවන් ද? එකිනෙක දේශපාලන පක්ෂය වෙනුවෙනුත් වෙන් වෙන්ව පිළිතුරු බලාපොරොත්තු වෙමි.

**ප්‍රශ්නය :** (නම සඳහන් නොකෙරුණි.)

මේ ප්‍රශ්නයට අදාල පිළිතුර දේශපාලන නායකයින් ගෙන් මෙතෙක් ලබාගත් පිළිතුරු වශයෙන් නොව චානක්‍ය දේශපාලනය හෝ රාජ්‍ය තන්ත්‍රිකභාවය යනාදියෙන්වූ පිළිතුරක් නොවී අවංකව අපගේ ජනවර්ගයේ විශ්වාසයට ලක්වන පිළිතුරු වශයෙන් නායකයින්ගෙන් බලාපොරොත්තු වෙමු.

**ප්‍රශ්නය :** න. රවිරාජ් මහතා.

අපි හැමෝ ම අද සාමය පිළිබඳව ගැඹුරින් සාකච්ඡා කරමින් සිටිමු. දෙබිඩි ප්‍රතිපත්ති අනුගමනය කරන දේශපාලඥයින් හෙළා දකිමු. නමුත් වෙස් තුනක් දාගන්නා දේශපාලන පක්ෂ මා දැක නැහැ. විශේෂයෙන් මා ප්‍රකාශ කරන්න කැමැතියි. ලංකා කම්කරු කොංග්‍රසය ඒ ඒ මොහොතේ අවශ්‍ය වන විටක ප්‍රභාකරන්ට තට්ටු කර තොණ්ඩමාන් කියයි. රජයට පක්ෂ ව හදිසි නීතියට සහයෝගය දෙයි. ඒ නීතිය යටතේ කඳුකර ජනතාව බොහෝ දෙනෙක් අත් අඩංගුවට ගෙන තිබේ. එයට පක්ෂ ව ද ඡන්දය දෙයි. ඒ සමගම එක්සත් ජාතික පක්ෂය සමග එකතුවී විපක්ෂයේද සිටිති. මෙය ප්‍රායෝගිකව සාමයට මග පාදන්නේ කෙසේ ද?

ඊළඟට මෙහි කථා කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් පැවසුවේ, පෙර සිටි නායකයින්ගෙන් සමහරුන් දේශපාලන වාසි තකා රජය සමග කටයුතු කළ බව ය. එය නොවේ අද තිබෙන ප්‍රශ්නය. අපට ඇති ප්‍රශ්නය නම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 9 දෙනෙක් සිටිති. ඔවුන් යාපන සරණාගතයින්ගේ ඡන්දයෙන් පැමිණි අය යි. අද හදිසි නීතිය මගින් විශේෂයෙන්ම පීඩා විඳින්නේ යාපනයේ ජනතාව යි. ඔවුන් වෙනුවෙන් හදිසි නීතියට එරෙහි ව ඡන්දය දෙන්න පුළුවන් ද?

ද්‍රවිඩ ජනතාව වෙනුවෙන් පාර්ලිමේන්තුවේ කථා කරමුයි, කටයුතු කරමුයි කීහ. විමධ්‍යගත අයවැයෙන් වෙන් කරන ලද

රුපියල් කෝටි කීපයක මුදලක් මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර සමගියක් නොමැති වීමේ හේතුවෙන් අපසු හරවා යවා ඇති බව මම දනිමි. එම පක්ෂය වෙනුවෙන් පුවත්පතක් ද පවත්ගෙන යනු ලැබේ. එය අපි හැමෝම කියවමු. රස විඳිමු. එම පුවතපතේ ස්වභාවය කුමක් ද? ඔවුන් කොටින්ට පක්ෂ ව ප්‍රචාරය කරයි. කාරෙයි තීවු, තෙඩුන් යන සෑම තීවූ දූපත් ප්‍රදේශයක ම එම පක්ෂයේ ආධාරකරුවෝ රජයෙන් මුදල් ලබාගෙන ආයුධ දරාගෙන කොටින්ට එරෙහිව සටන් කරති. මෙහි තත්වය කුමක් ද?

**ප්‍රශ්නය** : රජිනි ඉක්බාල් මිය.

මිනිස් අයිතිවාසිකම් උල්ලංඝණය වීමට ද පීඩාකාරී සිදු වීම්වලටද මූලිකවන්නේ හදිසි නීතිය බව අපි සලකමු. ඒ සමගම මේ ද්‍රවිඩ ජනතාව නියෝජනය කරන මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇයි එයට පක්ෂව ඡන්දය දෙන්නේ? මෙයට ඇතැම් විට යම් යම් හේතු තිබිය හැක. ඒ හේතුව අපට පිලිගත හැකි එකක් ද විය හැක. එමනිසා එම හේතු ඔවුන් ඉදිරිපත් කරන්නේ නම් යහපත් ය.

ඇතැම් විට ඔවුන් හදිසි නීතියට එරෙහිව ඡන්දය දෙනවා යයි සිතීම වැරදි විය හැකි ය. එම නිසා ඔවුන් කුමන හේතුවකට හදිසිනීතියට පක්ෂව ඡන්දය දෙන්නේ ද?

උදාහරණ වශයෙන් කොළඹ සිට වවුනියාවට යන වවුනියාවෙන් කොළඹට එන අය ඔවුන් විඳින පීඩා පොලිස් වාර්තාවල දී ඔවුන්ට ඇති වන බරපතල දුෂ්කරතා යන මේ හැම එකක්ම හදිසි නීතිය යටතේ ඇතිවන්නකි. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දී තිබූ තීන්දුවකට අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ නිවස පරීක්ෂා කළ නිසා ලක්ෂ 3කට වැඩි ප්‍රමාණයක් වන්දියක් වශයෙන් ගෙවන ලදි. සෑම දිනක ම ද්‍රවිඩ ජනතාවගේ ගෙවල් කිසිම දැනුම් දීමකින් තොර ව පරීක්ෂා කරනු ලැබේ. මේ සෑම එකක් ම හදිසි නීතිය කරනු ලබන්නේ හදිසි නීතිය යටතේ ය. එය දැන ගෙන ද්‍රවිඩයන් නියෝජනය කරන මොවුහු හදිසි නීතියට පක්ෂව ඡන්දය දෙන්නේ ඇයි?

**පිළිතුර :** පී. පී. දේවරාජ් මහතා.

පිළිතුරු දීමේ දී චානක්‍ය දේශපාලනයෙන් පිළිතුරු නොදී අවංක ව පිළිතුරු දෙන්නැයි කියන ලදි. අප දේශපාලනයෙන් දීර්ඝ කාලයකට කොන් කරනු ලැබීමෙන් ඉතා හොඳ අත්දැකීම් ලත් අය. ඒ අත්දැකීම් තුළින් අප දන්නා දේ නම්: චානක්‍යය යැයි කියනු ලැබුවා නේද? එම චානක්‍යය දේශපාලනය අපගේ අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා වන රහසිගත ආයුධයක් බව අපි දැනගෙන සිටිමු. උදාහරණයක් ලෙස කියන්නේ නම් 1948 වසරේ ඉන්දීය පාකිස්තානු පුරවැසි අයිතිවාසිකම් පනත සම්මත කරනු ලැබූ අවස්ථාවේ එදා සිටි දේශපාලන නායකයෝ ඊට විරුද්ධව සත්‍යග්‍රහ කළහ. ඉල්ලුම් පත් යවන්නේ නැහැයි ප්‍රතික්ෂේප කළහ. නමුත් ඩී. එස්. සේනානායකගේ මූලික අරමුණ වූයේ මේ රටේ බහුතරයක් වන ජනතාවට පුරවැසිකම් ලබා නොදිය යුතු ය. යම් පිරිසකට පමණක් දිය යුතු ය යන්නයි. එම නිසා මේ ප්‍රතික්ෂේප ව්‍යාපාරය නැවතුණේ කොහෙන් ද යයි කියන්නේ නම් බහුතරයක් වූ ජනතාව කොන්කර තැබීමේ වාතාවරණය ඇති කළේය. එම නිසා නැවැත වතාවක් එය පරීක්ෂාකොට බලා ලහි ලහියේ ලක්ෂ 2.37.000 ක් කැමැත්ත පළ කළහ. ඊට පසුව සිදුවූ දීර්ඝ උත්සාහයන් ගැන මා මෙහි සඳහන් කළ යුතු නැත.

1953 වසරේ ඩඩ්ලි සේනානායක සහ ජවහර්ලාල් නේරු අතර ලන්ඩනයේදී සාකච්ඡාවක් සිදුවුණි. ඒ අවස්ථාවේ දී දෙයාකාරයක එකඟතාවකට පැමිණියහ. නමුත් එම එකඟතාව සමග ඩඩ්ලි සේනානායක ලංකාවට පැමිණි පසු ඔහුගේ සමීප ඥාතියෙකු වන ආර්. ඩී. සේනානායක මෙයට විරුද්ධව රැල්ලක් ආරම්භ කළේ ය. එය ඩඩ්ලි එතැනින්ම අත හැරියේ ය. එය ක්‍රියාත්මක කෙරුණේ නැත. 1954 වසරේ කොතලාවල නේරු ගිවිසුම අත්සන් කරන ලදි. එම ගිවිසුමේ තීන්ත වියළීමටත් පෙර එය අතහරින ලදි. 1967 දී සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම අත්සන් කරනු ලැබූ වෙලාවේ එදින නායකයා වශයෙන් සිටි තොණ්ඩමාන් මහතා

ඇසුවේ එකම එක ප්‍රශ්නයක් පමණයි. "මා ඔබ මුණගැසිය යුතු යි අපේ හිතවතාගේ අදහස් ඔබට කිව යුතුයි." ඊට අගමැති සිරිමා ඔබ ගොස් ඔබගේ අගමැති මුණ ගැසෙන්නැ යි කීවා ය. 1984 දී සර්ව පාක්ෂික සමුළුව පවත්වන ලදි. එහිදී මේ පිළිබඳව පොඩි ඉඟියක් කරන ලදි. ඊට පෙර 1977 දී එක්සත් ජාතික පක්ෂයට සහයෝගය දීමේ දී මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න පුළුවන් ද? මොවුන් සමග ගිවිසුම් ඇතිකර ගෙන අලුත් පිළිවෙතක් ගෙන එන්න පුළුවන් ද? මෙසේ කළ හැකිය කියා සිටිය දී එය සාර්ථක වූයේ නැත. නමුත් එහි පොඩි වෙනසක් පමණයි කළ හැකි වූයේ, 1982 දී ජේ. ආර්. ජයවර්ධන ඉන්දියාවට ගිය විට ඔහුගෙන් එකම එක පොරොන්දුවක් පමණක් ලබා ගත්තෙමු. රටක් නොමැති අය අප රටේ ප්‍රශ්නය' යන අදහස පමණක් කීවේ ය. ඊට සිරිමාවෝ බණ්ඩාරනායක විශාල රැස්වීමක් පවත්වා අරගලයක් දියත් කළා ය. ඊට පසු 1986, 1988 වසරවල පනවන ලද පනත මගින් මේ ප්‍රශ්නයේ වැඩි කොටසකට විසඳුම් ලැබුණි. එමෙන්ම තවත් ඉතිරි වී ඇති ප්‍රශ්නවලට විසඳුම් සෙවීම සඳහා මේ ඔබ පැවසූ චානක්‍යය අනුගමනය කිරීමෙනුයි සමහර දේවල් ඉටුකරගත හැකි වුණේ.

එනිසා තමයි අද ඇතැම් සංවර්ධන සැලසුම් සමහර වතුවලට ලැබෙන්නේ. අද උගත් අයගේ සංඛ්‍යාව වැඩිවෙමින් පවතී. පාසැල් 734 න් පාසැල් 400ක් ප්‍රතිසංස්කරණය කරන ලදි. ගුරුවරුන් 1000ක් පත් කරනු ලැබ සිටිති. මෙවැනි ප්‍රවේශයක් අප අනුගමනය නොකළේ නම් පහසුකම් ලබාගැනීමට හැකි වන්නේ නැත. මේවා වහාම සම්පූර්ණ කළ හැකි අවශ්‍යතා නොවේ. එක කලෙක දී ඉන්දීය පාරම්පරික ජනතාව මුළුමනින්ම පිටත්කර හැරිය යුතු යැයි අරගල ඇති වූ වකවානු ද තිබුණි. ඒ හැම එකක් ම අභිබවා අපි අලුත් තත්ත්වයකට පැමිණ ඇත්තෙමු. ලොකු සාධනයක් නොවුණ ද යම් තාක් දුරට දියුණු වී ඇත්තෙමු යි කීමේ හැකියාවක් අප සතුව ඇත.

එම නිසා උතුරු නැගෙනහිර කිසිවෙකුට අප දොස් නගන්නේ නැත. උතුරු නැගෙනහිර යුද පිටියෙහි අවි අමෝරා ගත් වීරයෝ ජීවිතක්ෂයට පත්වෙමින් සිටිති. එහි ලේ ගංගා ගලමින් තිබේ. සරණාගතයින් වශයෙන් සමහරු විදේශවල රැකවරණ ඉල්ලති. වෙනත් ස්ථානවලට ගොස් පීඩා විඳිති. මේ හැම එකක් ම අපි සිතේ තබා ගත යුතු යි. අප කළ යුත්තේ කුමක් දැයි සාකච්ඡාවක් ආරම්භ කිරීමට අවස්ථාව එළඹ ඇත. ඊට මූලිකවන්නෝ කවරහු ද? එක පැත්තකින් විමුක්ති කොටින් ය. අනෙක් පැත්තෙන් ලංකා රජය ය. විපක්ෂයක් මෙයට කළ යුත්තේ කුමක් දැයි මම මුලින් කීවෙමි. රජයට කරුණු අවධාරණය කිරීම මිස වෙනත් කරුණු කථා කරමින් සිටීමෙන් ඵලක් නොමැත.

ඔබ හැමෝ ම එකතු වී එනම් මන්ත්‍රීවරුන් 28 දෙනා ම ද්‍රවිඩ ජනතාවට එරෙහිවූ ආරක්ෂක මුදල් වෙන්කිරීම් සිදු කරන්නේ ය. එම නිසා හදිසි නීතියට එරෙහිව ඡන්දය දී මේ රජය පෙරළා දැමිය හැකියැයි ඔබ සිතනවා ද? ඊට පසුව උතුරු නැගෙනහිරත් දකුණත් අතර ඇති සටන අවසන්වේ ද? නැත්නම් තවත් උග්‍ර වේ ද? නැත්නම් රටේ වෙනත් ව්‍යාකූල තත්වයක් ඇති වේ ද? හදිසි නීතිය ඉවත් කළොත් වෙනත් කුමන විදියේ පෙළඹවීම් ඇතිවේ ද? එහෙම තත්වයක් උදාවෙයි කියා සිතා බැලීම අවශ්‍ය නොවන්නේ ද? හදිසි නීතියට එරෙහිව ඡන්දය දීම ඇතැම් ප්‍රායෝගික ගැටලුවල ක්ෂණික විසඳුම් ලැබෙන මඟක් හැටියට සමහරු සිතති. නමුත් ප්‍රායෝගික දේශපාලනයට හා ප්‍රායෝගික සාධනයන්ට මෙය අදාල නොවේ. අප චන්ද්‍රිකාගේ රජයට සහයෝගය දෙන්නේ ඒ නිසාය. අද එය බලයෙන් පහකිරීම උචිත නොවන බව අපි සිතමු. මේ රජය පෙරළා දැමූවිට ඊළඟට කව් ද? යන ප්‍රශ්න යයි ඇත්තේ. මේ රජයට අපි දැනට සහයෝග දෙමින් සිටිමු. කවදාටද එය නතර කරන්නේ? ඇයි දැන් එය නවත්වන්නේ නැත්තේ? යනාදී වශයෙන් ඔබ ප්‍රශ්න කළ හැකි ය. ඒ පිළිබඳ කල්පනා කර තීරණයකට පැමිණිය යුත්තේ අප ය. අපි මේ රජයට සහයෝගයදී ආරක්ෂා කර ගෙන සිටින්නේ එම නිසා ය. ඔවුන් මගින් සමහර දේ කළ හැකි ය.

එක්සත් ජාතික පක්ෂය සමග සම්බන්ධකම් පවත්වන්නේ ඇයි දැයි ද අසන ලදි. මොවුන් සමග උරණ වී කිසිවක් කළ නොහැකිය. ඔවුන් සමග සුහද සම්බන්ධතාව තබා ගෙන ඔබ එකට එකතුවන්න. අපගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා එබඳු නිදහස් මතවාදයක් අවශ්‍ය වේ.

**ප්‍රශ්නය :** එස්. ප්‍රභාකරන්.

විශ්ව විද්‍යාලයෙහි සිංහල ජාතිවාදියෙකු වන නලින් ඩී. සිල්වාගෙන් ප්‍රශ්නයක් ඇසූ විට ඔහුගේ පිළිතුරෙන් ප්‍රශ්නය ඇසූ පුද්ගලයා නැතිකර දම යි. මේ අය අනුගමනය කරන්නේ ද එ වැනි චානක්‍ය දේශපාලනයකි. ඒ අනුව හදිසිනීතියට එරෙහිව ඡන්දය නොදෙමු, මේ රජය අරක්ෂා කරමු. එමගින් අපගේ තනතුරු ඉතුරු කරගනිමු, කඳුකර ජනතාව කුමන දුක් ගැහැටක් වින්දත් කමක් නෑ යන අදහස ඉස්මතු වේ.

උදාහරණ වශයෙන් රත්නපුර සිද්ධිය දෙස බැලූ විට මොවුන්ට කළ නොහැකි දේ සිංහල පුවත්පතක් වන හිරු පුවත්පත ඉටු කළේ ය. ඔවුහු කෙලින්ම ගිහින් විමර්ශනය කර සිංහල බසින් පළ කොට පසුව ඉංග්‍රීසි බසට පරිවර්තනය කොට එය ඉන්ටර්නෙට් එකට දැමුහ. නමුත් මොවුන් කළේ කුමක් ද? රජයේ ප්‍රචාරක මාධ්‍යය වන රූපවාහිනියෙන් මොවුන්ගේ ප්‍රධාන නායකයෙකු සමඟ කළ සාකච්ඡාවේ දී අසන ලද ප්‍රශ්නයක් වූයේ ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මෙයට වගකිව යුතු බව රත්නපුර ජනතාව කියනවා නේද? යන්න යි. එවිට එම නායකයා කීවේ ඔහු සමග මම ආහාර ගෙන ඇත්තෙමි, මම කොහොම ද ඔහු පෙන්වා දෙන්නේ යනුවෙනි. මෙ බඳු අය කිසි දිනක හදිසි නීතියට එරෙහිව ඡන්දය නො දෙනු ඇත.

මම නැවැතත් ඉල්ලා සිටින්නේ මීළඟට හදිසි නීතිය දීර්ඝ කිරීමේ දී එයට එරෙහිව ඡන්දය දිය හැකි ද? නොහැකි ද? ඔවුන්ට එහි ප්‍රතිඵල නො දැනේ. එහි නරක ප්‍රතිඵල භුක්ති

විඳින්නේ අප ය. ඔවුහු රජයේ ආරක්ෂාව සමගත් පුද්ගලික ආරක්ෂාව සමගත් සිටිමින් සෙල්ලම් කරති. මොවුන්ගෙන් ප්‍රශ්න ඇසීම ද අප තුළ බියක් ඇති කරයි. ඊට හේතුව තම පුද්ගලික මැරවරයින් යොදා අපට පහර දීමට ඉඩ ඇති බැවිනි. කඳුකරයේ මෙය සිදුවෙමින් පවතී.

පොලිස් වාර්තා නිසා ඇතිවන පීඩා ගැන මොවුහු රජය සමගත් හිරිහැර වැළැක්වීමේ කමිටුවට සමහත් කාතා කරන බව පවසන්නේ රජය සනසන පසුබිම් වාදනයක් පරිද්දෙනි.

**ප්‍රශ්නය :** (නම සඳහන් නොවේ.)

සාකච්ඡාව පාර්ශ්ව දෙකක් අතර සිදුවිය යුතුයයි සභාවේදී සඳහන් කෙරුණි. එකක් කොටි සංවිධානය යි. අනෙක රජයේ පාර්ශ්වය යි. විමුක්ති කොටින්ගෙන් සාකච්ඡාව සඳහා ආරාධනාවක් ලැබී ඇති මේ මොහොතේ රජය එය ගණන් නොගෙන සිටිද්දී රජයට අවධාරණයක් කළ හැකි මන්ත්‍රීවරුන් 27 දෙනා කුමක්ද කරන්න යන්නේ? රජය සාකච්ඡාවට පැමිණිය යුතු වාතාවරණය හෝ අවධාරණය ඔබ විසින් ඇති කර දිය හැකිද? නැත්නම් ඔබලාගේ තනතුරු වලින් ඉවත් වී එය ජනතාවට නැවතත් භාරකළ හැකි ද?

**ප්‍රශ්නය :** එන්. තිලක්ෂාන් මහතා.

මාවෙ සේනාධිරාජා මහතා කථා කරන විට සඳහන් කෙළේ, තොණ්ඩමන් අමාත්‍යවරයා ඔහුගේ කාර්යාලයේදි මුණ ගැසුණු වෙලේ අමාත්‍යවරයාම "කවදා ද මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු එකතු වී හදිසි නීතියට විරෝධය පාන්න යන්නේ" යැයි ඇසූ බව යි. එසේ නම් ගරු පී.පී. දේවරාජ් අමාත්‍ය තොණ්ඩමාන්ගේ අදහසට එරෙහිවන්නේ ද? ඊට හේතුව ලෙස ඔහු කියන්නේ හදිසිනීතියට විරෝධය පෑම අපගේ අරමුණ නොවේ යන්න ය.

අමාත්‍ය තොණ්ඩමාන් පවසා ඇත්තේ: " සියලු ද්‍රවිඩ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු එකතු වී පැමිණ, විරුද්ධ වෙමු,යි යනුවෙනි. එසේ නම් මේ වේදිකාවේ සියලුම පක්‍ෂවල නියෝජිතයෝ සිටිති. මොවුන්ගෙන් අසන්නෙමි. කවදාට ද සියලු දෙනා ම එකට එකතුවෙන්නේ?

**ප්‍රශ්නය :** එස්. ප්‍රභාකරන් මහතා.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ජනතාවගේ අවශ්‍යතා පිළිබඳ පාර්ලිමේන්තුවේදී කථා කළ යුතු ය. ඒ අනුව හදිසි නීතියට එරෙහිව ඡන්දය දිය යුතුයි ජනතාව කල්පනා කරති. ඔබලා එය කිරීමට සූදානමින් සිටින්නේ ද? නැත්නම් ඔබගේ පුද්ගලික අවශ්‍යතා ඉටුකර ගන්නේ ද?

**පිළිතුර :** පී. පී. දේවරාජ් මහතා.

ඔබ, ඔබ ගැනත් ඔබ වැනි අදහස් දරන අය ගැනත් සඳහන් කරනු පෙනේ. අපි එසේ නොවේ. අපි බොහෝ ජනයා නියෝජනය කරන්නෙමු. අප ජනතා නියෝජිතයින් වශයෙන් යැවූ පසු අද දිනයේ දේශපාලන වාතාවරණයට අනුව අපට යම් යම් තීරණ ගැනීමට සිදුවන්නේ ය. අද පවතින තත්ත්වයේ දී මේ රජය පෙරළීමට අපි අකමැති වෙමු. එම නිසා වැදගත් යෝජනාව වන හදිසි නීතියට අපි ඡන්දය දෙමින් සිටින්නෙමු. මේ තීරණ වෙනස්කර ගත හැකියි. නමුත් අද සහයෝගය දීමේ තීරණයක් ගෙන ඇත්තෙමු.

ඊළඟට ජනතාව ගේ අදහස් අපි අනුමත කරන්නෙමු. අපි ද ඔවුන් සමග එකතු වී කථා කිරීමට කැමති ය. ජනතාව අපි කියන දේ වැරදියැයි සිතුවොත් ඊළඟ මැතිවරණයේ දී අප ප්‍රතික්ෂේප කරනු ඇත.

අමාත්‍ය තොණ්ඩමාන් සමග මාවෙ සේනාධිරාජා කළ කථාව ගැන පවසන ලදි. සෑම පක්‍ෂයක් තුළම මත භේදයක් තිබිය හැකි ය. ඒකමතික ව අපි ගත් තීරණ අපි පිළිගන්නෙමු.

වක්‍රාකාරයෙන් කථා කරන්නේ කිම දැ යි අසන ලදී. සමහර දේවල් පැහැදිලි කළ යුතු යි. එසේ පැහැදිලි කළයුතු වගකීමක් මට තිබෙනු විනා කාරණය වසන් කිරීමට මා උත්සාහ කළේ නැත. ඇත්ත වශයෙන්ම මා ඔබට කවදත් කොයිවෙලේත් හමුවිය හැකි ය. උණුසුම් තර්ක ඉදිරිපත් කළ හැකිය.

**පිළිතුර** : එස්. සිවදාසන් මහතා.

ඉදිරිපත් ව ඇති ප්‍රශ්න දෙස බලන විට මූලික කාරණය අමතක කර හැඟීම්වලට යටත්වන වාතාවරණයක් පෙනෙන්නට ඇත.

හදිසි නීතිය ගැන බලන විට අප රටේ අයවැය දෙස බැලිය යුතුයි. 1994 අප පාර්ලිමේන්තුවට ගිය කාලයේ සිට මේ වසරේ අද දක්වා අයවැය යෝජනා 5ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ඇත. සෑම වසරක ම අය වැය යෝජනාවේ ආරක්ෂක වියදම් වශයෙන් අපගේ මුළු අය වැයෙන් 25% ක් වෙන් කෙරේ. හදිසි නීතියට එරෙහි ව ඡන්දය දෙන්නැයි කියන පක්ෂ ද මෙපමණ වසර ගණනක් තිස්සේ යුද්ධයට මුදල් වෙන්කරන මේ අය වැය යෝජනාව අනුමත කර ඡන්දය දෙමින් සිටිති. අද වාතාවරණය බැලූ විට ද්‍රවිඩ ජනතාවට ප්‍රශ්න තිබේ, නොයෙක් අර්බුද මතු වී තිබේ, ප්‍රවාහන ප්‍රශ්න, එදිනෙදා ප්‍රශ්න, යනාදී වශයෙන් ප්‍රශ්න තිබෙන්නේ ය. මේ පිළිබඳව අපි රජයට බලකර යම් යම් කටයුතු කරමින් සිටිමු. හිරිහැර වළක්වන කමිටුවක් අද පිහිටුවා තිබේ. වහා ම සමහර පියවර ආරම්භ කර තිබෙන්නේ ය. මේ මගින් ද්‍රවිඩ ජනතාවගේ ප්‍රශ්න සියල්ල විසඳනු ඇතැයි අපි නොකියමු. තේරුමක් නැති විදිහට විරෝධය පාමින් වහාම ප්‍රතිඵල ලබා ගැනීමේ තත්ත්වයක් නැත. දීර්ඝකාලීන අරමුණක් වෙනුවෙන් කටයුතු කළ යුතු වේ. ඊළඟට තව කෙනෙක් කිව්වේ විමධ්‍යගත අරමුදල වියදම් නොකර ආපසු භාණ්ඩාගාරයට යැවූ බව ය. එය සම්පූර්ණයෙන් අසත්‍ය දෙයකි.

**ප්‍රශ්නය :** රැස්ව සිටින්නන් (ප්‍රීතියෙන් හා සිනහවෙන් යුතුව) ඡන්ද කීයක් ලබාගෙන ඊ.පී.ඩී.පී. පත්වුණා ද?

**පිළිතුර :** එස්. සිවදාසන් මහතා.

යාපන ප්‍රාදේශීය සභා ඡන්දයේ දී අනෙක් පක්ෂවලට වඩා ඉතා වැඩි ඡන්ද ප්‍රමාණයක් ද ප්‍රාදේශීය සභා 10 ක් ද ඊළම් ජනතා ප්‍රජාතාන්ත්‍රික පක්ෂය ජයගෙන තිබේ. දමන ලද ඡන්දවලින් 52% ක් ඊළම් ජනතා ප්‍රජාතාන්ත්‍රික පක්ෂය ලබා ගෙන ඇත.

**ප්‍රශ්නය :** රැස්ව සිටින්නන් (ඝෝෂා හඬින්).

බොරු කියන්න එපා. නියම ඡන්ද 3යි. අනෙක් ඒවා හොර ඡන්ද.

**පිළිතුර :** එස් සිවදාසන් මහතා.

මේ, කාරණය නොදන්නා ඝෝෂාවලට බියවන අය නොවේ අප. ඒ බව සිතට ගන්න. 92 වසරේ තිසි කාලය තුළ ප්‍රවාහන අසීරුතා නිසා ඒ කාලය ගිහින් වැඩ කිරීමට නොහැකි වූ බැවින් ආපසු ගිය බව ඇත්ත. නමුත් 96, 97, 78 වසරවල දී මුළු මුදල යාපනයේ අපගේ මන්ත්‍රීවරුන්ගේ අරමුදලෙන් ත්‍රිකුණාමලේ, අම්පාර, මඩකලපුව වැනි දිස්ත්‍රික්කවල ද අපගේ මුදල ප්‍රයෝජනයට ගෙන සංවර්ධන කටයුතු සිදුවී ඇත.

**පිළිතුර :** මාවෙ සේනාධිරාජා මහතා.

රවිරාජ් මල්ලී ද්‍රවිඩ විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරකම් ගැන අසා තිබේ. එනම් අද කාලයේ අවශ්‍යතාව දෙපසට වී සිටින ද්‍රවිඩ දේශපාලන පක්ෂ ආයුධ සන්නද්ධ සංවිධාන තමන් තුළ සිතේ වෙනසක් ඇති කරගෙන පොදු තැනකට පැමිණිය යුතුයි. ඒ සඳහා අප වැඩ කළ යුතු යයි මම සිතමි.

දෙවනුව ද්‍රවිඩ විමුක්ති පෙරමුණ සෑම වකවානුවකදීම සාමය සඳහා තමාගේ ශක්ති ප්‍රමාණයෙන් දනුත් මේ රජය 1995 අගෝස්තු 3වන දින ඉදිරිපත් කළ යෝජනාවලියෙහි යහපත් අංග අඩංගු වී තිබූ නිසා තවදුරටත් එම යෝජනාවලිය දියුණු කිරීම සඳහා කටයුතු කළ බව සත්‍යයකි. නමුත් එම යෝජනාවලියේ සංශෝධන, ජනමත විමසීම් පැවැත්විය යුතුය යන යෝජනාව කෙරෙහි අපි අපගේ විරෝධතාව දක්වන්නෙමු. ඒ යෝජනාව අප දනටමත් සඳහන් කළ ආකාරයට ද්‍රවිඩ ඊළම් විමුක්ති කොටි සංවිධානය සාකච්ඡාවට කැඳවන මොහොතේ එම සාකච්ඡාවට පදනම වශයෙන් තිබිය හැකියි අප විශ්වාස කළ බව සත්‍යයකි. ඒ යෝජනාවලිය නීත්‍යානුකූල තත්වයට පැමිණෙන විට කෙතරම් දුරට අදාල ව තිබේ දයි මා නොදනී. ඒ යෝජනාවලිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ විට එය ගැලපෙන්නේ ද නැද්ද යන තීරණය ගන්නා තෙක් අපගේ පක්ෂය ක්‍රියාකාරී විරෝධය ඉදිරිපත් කර ඇත්තෙමු, ඉදිරිපත් කරමු. ද්‍රවිඩ ඊළම් විමුක්ති කොටින් සාකච්ඡාවකට කැඳවනු ලැබුවහොත් ඔවුන් සාකච්ඡාවට සහභාගී වී ලැබිය හැකි විසඳුම ලංකාවේ සාමය ඇති කිරීමට ඉවහල් වනු ඇතැයි අපි විශ්වාස කරමු. එවැනි විසඳුමකට සහයෝගය දීමට අපි සූදානමින් සිටින බව නොයෙක් විට ප්‍රකාශ කොට ඇත්තෙමු. ජනාධිපති මුණගැසෙන විට දී හෝ වෙනත් රාජ්‍ය තාන්ත්‍රික මුණගැසීමකදී හෝ අද පවතින වාතාවරණයේ දී රජය ඇත්ත වශයෙන්ම ද්‍රවිඩ ඊළම් විමුක්ති කොටි සංවිධානය සමග සාකච්ඡා කොට මේ රටේ දේශපාලන විසඳුමක් සිය යුතු යන අදහස අපි ස්ථිරවම අවධාරණය කර ඇත්තෙමු.

1985 ජූලි මස 13 වන දින ඉන්දියාවේදී මේ තිම්පු තීරණයක් ගන්නා ලදි. එහි කියා ඇත්තේ මේ රටේ ජනවාර්ගික ප්‍රශ්නය විසඳීමට පහත සඳහන් මූලික බලයත් සහිතව අර්ථවත් විසඳුමක් ඉදිරිපත් කළ යුතුය යන්න ප්‍රථම අදහසයි.

I ලංකා ද්‍රවිඩයින් අනන්‍යතාවක් ඇති ජාතික ජනවර්ගයක් ලෙස පිලිගත යුතු යි.

II ද්‍රවිඩ ජනතාවගේ මව් බිම ඔවුන් ජීවත් වන ස්ථානය හඳුනා ගෙන මව් බිමේ ඒකීයත්වය පිලිගත යුතු යි.

III මේ පදනම යටතේ ද්‍රවිඩ ජාතික ජනවර්ගයේ වෙනස් කළ නොහැකි ස්වයංතීරණ අයිතිය පිලිගත යුතු යි.

IV මේ රටේ දීර්ඝ කාලයක් තිස්සේ ජීවත්වන ද්‍රවිඩ ජනතාවගේ මූලික ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් පිලිගන්නා අතරම ඔවුන්ගේ ප්‍රජා අයිතිය ද පිලිගත යුතු යි.

මේවා අපට කිසි ප්‍රශ්නයක් නොවේ. නමුත් අනෙක් කරුණු ගැන ඔබ විශේෂයෙන් අවධානය යොමු කළ යුතු යි.

මේ මූලික න්‍යායන් 4 සෑම රටක් ම තම තමන්ගේ අනන්‍යතාවට අනුව ඒ ඒ රටවල රජයන් වෙනත් ආකාරවලින් ක්‍රියාත්මක කොට ඇත්තේ ය.

මේ මූලික න්‍යායන් පසු ගිය රජයට ඉදිරිපත් කළ විට දී ඒවා ප්‍රතික්ෂේප වූ හේතුව නිසා මේ සටන අප අරම්භ කළ බව සත්‍යයකි.

මේවා 85 වන වසරේ තිම්පු යෝජනාව ගැන සඳහන් කරනු ලබන්නේ ය. මේවා ඇතුළත් නොකරන ලද හේතුව නිසා අපි ඒවා ප්‍රතික්ෂේප කරමු.

කෙසේ වෙතත් අපි අපගේ සත්‍ය කැමැත්ත සාමය කෙරෙහි ප්‍රකාශ කරමු. මේ පදනම යටතේ කුමන හෝ රජයක් විසඳුමක් ඉදිරිපත් කළොත් ඒවා පරීක්ෂා කිරීමට අපි සූදානමින් සිටිමු. මෙයින් කරුණු දෙකක් ගැන අවධානය යොමු කළ යුතු යි.

I සෑම රටක ම සෑම රජයක් ම තම රටේ ප්‍රතිපත්තිය අනුව සාකච්ඡා අනුව තම තමන්ට ගැලපෙන පරිදි මේ මූලික පදනම් හතර අන්තර්ගත කොට විසඳුම් සොයා ගෙන ඇති බව සැලකිය යුතු යි.

II මේ රජය හෝ කුමන රජයක් වුවත් මේ පදනම යටතේ තීරණයක් ගන්නේ නම් හෝ යෝජනාවක් ඉදිරිපත් කරන්නේ නම් අපි ඒ ගැන පරීක්ෂා කර බැලීමට සූදානමින් සිටිමු. තිම්පු න්‍යායන්වල මූලික පැහැදිලි කිරීම් එ පරිදි ය.

එම නිසා රජයක් යෝජනාවක් ඉදිරිපත් කරන විට දී එහි කෙතරම් දුරට මේ මූලික න්‍යායන් අන්තර්ගත වන්නේ ද යන්න සලකා හෝ මේ මූලික ප්‍රතිපත්ති වර්ධනය කිරීමට සාකච්ඡාවක සහභාගීවීම හෝ ඒ මැතිවරණය පරීක්ෂා කිරීම කිසිම අයුරකින් වරදක් නොවන බව අපගේ අදහස වන බැවින් අපි කවදත් සාකච්ඡාවකට සූදානමින් සිටිමු.

එහි අර්ථය මේ මූලික ප්‍රතිපත්ති 4 ඒ විදියට ම ඇතුළත් කරගත යුතු ය යන්න නොවේ. එහි අර්ථය නම් අන්තර්ගතය හෝ සමාන අදහසක් හෝ වෙන වෙන ආකාරයට කුමන රටවල් ඒ ඒ රටවල පදනම යටතේ ඉදිරිපත් කොට එය විසඳිය හැකි ද ඒවාහි අන්තර්ගත කොට තිබුණත් ඒ යෝජනාවන් පරීක්ෂාවට ලක් කළ යුතු බව ය.

ඊළඟට අපගේ ස්ථිර අදහස මේ යුද්ධය දිගටම පැවතුනොත් අපගේ ජන වර්ගය විනාශවෙයි. මෙය කාටවත් දිනන්න බැරි යුද්ධයක් ලෙස පවතින්නේ ය. ද්‍රවිඩ ජනතාව පවා අකමැති මේ යුද්ධයට ඊළඟ සියවසටත් බදු ගෙවාගෙන සිටිය යුතු යි. මේ යුද්ධය අවසන් කොට රජය හා කොටින් සාකච්ඡා කළ යුතු යි. ඔවුන් සමගම සාකච්ඡා කළ යුතු යි කියා කියන්නේ, මන්ද යත් කී වතාවක් අනෙකුත් සංවිධාන සමග සාකච්ඡා කර තිබෙනවා ද?

තව දුරටත් සාකච්ඡා කරන්න එපා කියා නොකියමු. කථා නොකර සිටින විමුක්ති කොටින් කථා කළ යුතු යි. ඔවුන් තුළ ද අනෙක් සංවිධාන තුළ ද හමුදාව සමග කටයුතු කරන සංවිධාන තුළ ද චින්තනයේ වෙනසක් ඇති විය යුතු යි. අප එක්සත් ව ගන්නා තීරණයක් අනුව යහපත් තීරණයක් ලැබෙනු ඇත යන හේතුව නිසා මම එසේ පැවසුවෙමි.

තිම්පු තීරණය ගත් පසු 1987 සැප්තැම්බර් 11 දින මුස්ලිම් නායකයින් ද්‍රවිඩ විමුක්ති පෙරමුණ සමග සාකච්ඡා කොට උතුරු නැගෙනහිර පළාතේ ස්වයං පාලනය පිහිට වන විට අමාත්‍ය මණ්ඩලයේ සහ ව්‍යවස්ථාදායකයේ 25% ක් වන නියෝජනයක් වැඩිපුර ලබා දිය යුතු ය යන ඉල්ලීමට අනුව අපි ගිවිසුමක් ඇතිකර ගත්තෙමු. ඊට පසුව නිශ්චිතව සලකනු ලබන්නේ 1988 වසරේ කොටි සංවිධානයටත් මොහිදීන් මහතාගේ එක්සත් පෙරමුණටත් අතර එකඟත්වයක් ඇති වී මුස්ලිම්වරුන්ගේ අයිතිවාසිකම් එහිදී ද පිළිගෙන ඔවුන් ද්‍රවිඩ විමුක්ති පෙරමුණ සමග කළ එකඟත්වයට වඩා 5% වන නියෝජනයක් අපි ලබා දෙමු' යි යන්න ස්ථිර කළ බව මතක් කරන්නට කැමතියි.

අපගේ පක්ෂය මුස්ලිම් ජනතාවගේ අයිතිවාසිකම් අද ඊයේ නොව අවුරුදු 50 ක් තිස්සේ පිළිගෙන ඇත. ද්‍රවිඩ මුස්ලිම් ජනවර්ගවල එකඟත්වයේ තීරණය පදනම් කරගෙන ස්වයං තීරණ අයිතිවාසිකම් පිළිගත් තීරණයකට පැමිණීම වඩාත් සුදුසු ය. මේ යටතේ කටයුතු කිරීමට අපි සූදානමින් සිටිමු.

හදිසි නීති රෙගුලාසි අවසාන වශයෙන් පසුගිය මාස 6 කට පෙර ද අය වැය යෝජනාවට මුළුමනින්ම එරෙහි ව ද ඡන්දය දෙන්නෙමු. ආරම්භ කාලයේදී හදිසි නීතිය පිළිබඳ ඡන්දයේ දී අපි සහභාගී නොවුනෙමු. යාපනයේ ගුවන් බෝම්බ දැමීමට පසු ව අද දක්වා හදිසි නීතියට එරෙහිව යුද්ධයට විරෝධය පාමු යන ප්‍රතිපත්තිය යටතේ විරෝධය පාමින් සිටිමු.

කඳුකරය ද්‍රවිඩ ජනතාව වෙනුවෙන් වූ නියෝජිතයින් සමග සටන් කිරීමට පෙර අප අතරේ සිට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වුව ද කුමන දේශපාලනඥයෙක් වුව ද අප එක්සත්ව සාකච්ඡා කොට කෙනෙකු වන කෙනෙක් යමක් පටවන්නේ නැති ව අප තීරණයකට එන්නේ නම් ඇත්ත වශයෙන්ම අප සමග එකතුවී කම්කරු කොංග්‍රසයද රජයට එරෙහිව ඡන්දය දෙන තත්වයක් තිබූ බව ප්‍රකාශ කරමි. උතුරු නැගෙනහිර ප්‍රශ්නය ගැනවූ තීරණයකට අප එක්සත්ව පැමිණියේ නැත්නම් උතුරු නැගෙනහිර ප්‍රශ්නය සම්බන්ධයෙන් කඳුකර ද්‍රවිඩයින් නියෝජනය කරන අය සමග ගැටුම් ඇති කර ගැනීමට අප කැමති නැත. සමගියෙන් අප තීරණයකට ආවොත් ඊට පසුව ඔවුන් පෙළඹවීම සාධාරණ බවද මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරමි.

# විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 1996 ජූනි මස පිහිටුවන ලද්දේ ශ්‍රී ලංකාවේ යහ පැවැත්ම හා ගැටළු නිරාකරණය පිණිස ශක්තිමත් ආයතනයක් හා ශාක්‍යතා වර්ධනයක් සඳහා ප්‍රබල අවශ්‍යතාවයක් ඇතැයි ද මේ ක්‍රියාවලියේ දී පක්ෂ භාජනයෙන් තොර සිවිල් සමාජයට අයත් විවිධ කණ්ඩායම් වලට ඉතා වැදගත් හා සුසාධනීය අයුරින් දායක විය හැකි යයි ද යන බලවත් විශ්වාසය ඇතිවය.


මහජනයා වෙනුවෙන් ප්‍රතිපත්ති සැකසීමේ දී අප මධ්‍යස්ථානයෙන් අපේක්ෂිත වනුයේ ප්‍රචණ්ඩකාරී නොවන ආකාරයට ගැටුම් නිරාකරණය කිරීම හා ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ද වෙනුවෙන් කටයුතු කරන, පුළුල් ව පැතිරුණු ප්‍රතිපත්තිමය විකල්පයන් කෙරෙහි ඉලක්ක වූ ද ක්‍රියාකාරී හා මැදිහත් වන සුළු වූ ද මූලික කාර්යභාරයකි. ඒ අනුව, ඉතා පුළුල් වූ පර්යේෂණ කටයුතු රැසක් පවරා ගැනීමට මධ්‍යස්ථානයට සිදුවන අතර ක්‍රියාත්මක කළ හැකි විකල්ප ප්‍රතිපත්ති හඳුනා ගැනීම හා සංවර්ධනය කිරීම් ඒ ඔස්සේ සිදු කළ යුතුව ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

- සුනිල් බැස්ටියන්.
- රොහාන් එදිරිසිංහ.
- ආචාර්ය අර්ජුන පරාක්‍රම.
- සයිරිනි සිරිවර්ධන.
- ආචාර්ය ජයදේව උයන්ගොඩ.
- ආචාර්ය ෂෙල්ටන් වනසිංහ.
- බ්‍රැඩ්මන් වීරකෝන්.
- ගෞරී පොන්නයියා.

## විධායක අධ්‍යක්ෂ

- ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු.



ඡායාරූප අනුග්‍රහය : අජිත් සෙනෙවිරත්න

ග්ලෝබ් ප්‍රින්ටර්ස් - 329739